# (ඇ) මූල්‍ය හා බැංකු කටයුතු හැඩගැස්ම

## 1. (අ) මුදල් සැපැයුම — ප්‍රධාන උපනතීන්

1967 දෙසැම්බර් මස අවසානය සහ 1968 දෙසැම්බර් මස අවසානය දක්වා අතරතුර කාලයේ දී මුදල් සැපැයුම රුපියල් දශ ලක්ෂ 105.6 කින් නැතහොත් සියයට 5.8 කින් වැඩි විය. 1968 වර්ෂයේ මුදල් සැපැයුමෙහි සාමාන්‍ය මාසික මට්ටම ඉකුත් වර්ෂයේ මට්ටමට වඩා සියයට 6.9 කින් ඉහළ ගොස් ඇත. වර්ෂයේ මුදල් සැපැයුමෙහි සාමාන්‍ය මාසික මට්ටමෙහි පෙණුනු ඉහල යාම 1959 සිට 1965 දක්වා වූ වර්ෂ තුළ පෙනුණු සාමාන්‍ය අනුපාතිකයේ ඉහළ යාමට වඩා මද වශයෙන් වැඩිය. 1968 වර්ෂයේ මුදල් සැපැයුමේ ඇති වූ වැඩි වීමෙහි සැලකිය යුතු ලක්ෂණය වූයේ, මූර්ත ජාතික නිෂ්පාදිතයෙහි සිදු වූ වර්ධනයට සරිලන පරිද්දෙන් මුදල් සැපයුමත් වැඩි වීමය. එහෙත් 1959 සිට 1965 දක්වා කාලය තුළ දී මුදල් සැපැයුමෙහි සිදු වූ වැඩි වීම, මූර්ත නිෂ්පාදිතයෙහි වර්ධන අනුපාතිකයට වඩා සාමාන්‍ය වශයෙන් අධික විය.

1963 සිට 1968 දක්වා වර්ෂයන්හි මුදල් සැපැයුමෙහි මාසාවසාන සංඛ්‍යා II (ඇ) 1 සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි. 1968 ජනවාරි මාසයේ දී සිදු වූ රුපියල් දශ ලක්ෂ 15.7 ක වැඩි වීමෙන් අනතුරුව, පෙබරවාරි මාසයේ සිට දිගටම මුදල් සැපැයුම නොවෙනස්ව ම වාගේ පැවතුනි. එහෙත්, ප්‍රධාන වශයෙන් ම පෞද්ගලික අංශය සඳහා ණය මැවීමෙහි බලපෑම නිසාත්, තරමක් දුරට රජයට දෙන ලද ණය ප්‍රමාණය වැඩි වීම නිසාත්, මුදල් සැපැයීම ඊළඟ තුන් මාසය තුල දී රුපියල් දශලක්ෂ 76.8 කින් වැඩිවිය. එසේ වුවද ප්‍රධාන වශයෙන්ම පෞද්ගලික අංශය වෙත දෙන ලද බැංකු ණය ප්‍රමාණයෙහි ආපසු ගෙවිය යුතු වූ ප්‍රමාණය පහළ වැටීම, හේතු කොට ගෙන, ජූනි සහ ජූලි යන මාස තුළ දී මුදල් සැපැයුම රුපියල් දශ ලක්ෂ 38.1 කින් පහළ වැටුනි. අගෝස්තු මාසයේ දී ප්‍රසාරණාත්මක ප්‍රවනතාවය නැවතත් ක්‍රියාකාරී විය. වර්ෂයේ අවසාන මාස පහ තුළ දී මුදල් සැපැයුම රුපියල් දශ ලක්ෂ 81.8 කින් වැඩි වුව ද, මෙම මාස පහ තුළ දී පෙනුණු වැඩි වීමෙහි සාමාන්‍ය මාසික අනුපාතය, මාර්තු සිට මැයි දක්වා වූ තෙමස තුළ දී පෙනුණු වැඩි වීමේ අනුපාතයට වඩා අඩු ය. වර්ෂයේ දෙවන භාගයේ දී සිදු වූ ප්‍රබල මූල්‍ය ප්‍රසාරණයට බලපෑවේ පෞද්ගලික අංශය වෙතට සැපයුණු ණය ප්‍රමාණය පුළුල්වීමයි.

සමාලෝචනයට භාජන වන වර්ෂය තුළ දී මුදල් මැවීම් වැඩි වූවා පමණක් නොව, ගෙවීම් මාධ්‍ය ප්‍රයෝජනයට ගන්නා වේගයෙහි ද වැඩිවීමක් පෙනුණි. මෙය තවදුරටත් මුදල් සැපයුමත්, පවත්නා සාධක මිල අනුව වූ දළ ජාතික නිෂ්පාදිතයත්, සසඳමින් ඒවා අතර අනුපාතයන් සලකා බලන කල, මුදල්හි ආදයම් ප්‍රවේගයේ වැඩිවීමෙන් පිළිබිඹු වෙයි. මෙම අනුපාතය 1967 දී පැවති 4.7 යේ සිට 1968 දී 5.3 දක්වා ඉහළ නැඟ ඇත. මෙම වර්ධනයට තවත් සාධකයක් නම් ඉල්ලුම් තැන්පතුවල පිරිවැටුම් අනුපාතිකයෙහි වැඩිවීමයි. ඉකුත් තුන් වර්ෂය තුළ දී පහළ වැටීමකින් අනතුරුව 1967 වර්ෂයේ දී 1.60 ක්ව පැවැති ඉල්ලුම් තැන්පතුවල සාමාන්‍ය මාසික පිරිවැටුම් අනුපාතිකය 1968 වර්ෂයේ දී 2.06 දක්වා කැපී පෙනෙන පරිදි ඉහළ නැගිණ.

1968 දී මුදල් සැපැයුම කෙරෙහි වූ ප්‍රසාරණාත්මක බලපෑම් ඉකුත් වර්ෂයේ දීට වඩා සැලකිය යුතු අන්දමින් විශාල වූ මුත්, ආවාසිදයක ගෙවුම් ශේෂයන්හි සංකෝචනාත්මක බලපෑම් මගින් ද, මහජනයා වෙතැති ද්විතීයික ද්‍රව්‍යශීලතාවයේ මූල්‍ය වත්කම් වැඩිවීමක් මගින් ද, රජයේ මුදල් ශේෂයන් එක්රුස්වීම මගින් ද, යටකී ප්‍රසාරණාත්මක බලපෑම සැලකිය යුතු ප්‍රමාණයකට මැඩ පැවැත්විණි. අස වුදයක ගෙවුම් ශේෂයේ සංකෝචනාත්මක බලපෑම පෙබරවාරි, ජූලි සහ සැප්තැම්බර් යන මාසවල දී හැර වසරේ අනෙක් මුළු කාලය තුළ දී දැනෙන්නට විය. වෙළෙඳ බැංකු වෙත තුබූ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු දෙසැම්බර් මාසයේ දී හැර, වසරේ අනෙකුත් මුළු කාල සීමාව තුළ දී ම නොකඩවා ඉහළ නැගුණි.

## 1. (ආ) මුදල් සැපැයුම කෙරෙහි බලපාන සාධක

මුදල් සැපැයුම කෙරෙහි බලපාන අනියම් සාධකයන් පිළිබඳ විශ්ලේෂණයක් II (ඇ) 2 සංඛ්‍යා සටහනෙන් ඉදිරිපත් කර ඇත.

සමස්ත වශයෙන් වර්ෂය මුළුල්ලේ ම මුදල් සැපැයුම කෙරෙහි විදේශීය අංශය විසින් සැලකිය යුතු සංකෝචනාත්මක බලපෑමක් ඇති කරන ලදී. මෙය වූකලී 1957 දී ආරම්භ වුනු රටෙහි ගෙවුම් ශේෂයේ අවාසිදයක ප්‍රවණතාවය අඛණ්ඩව තවදුරටත් එලෙස ම පැවතීමේ ප්‍රතිඵලයකි. 1968 වර්තන ගිණුමෙහි ගෙවුම් ශේෂ හිඟය ඉකුත් වර්ෂයේ ශේෂයට වඩා සැල කිය යුතු අන්දමින් විශාල විය. 1968 දී ලද භාණ්ඩ හා යෝජනා ක්‍රම ආධාර ප්‍රමාණය, පෙරට

## II (ඇ) 1 වැනි සංඛ්‍යා සටහන

### මුදල් සැපැයුම

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 | 1963 සහ 1964 අතර වූ වෙනස % | 1964 සහ 1965 අතර වූ වෙනස % | 1965 සහ 1966 අතර වූ වෙනස % | 1966 සහ 1967 අතර වූ වෙනස % | 1967 සහ 1968 අතර වූ වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි ... ... ... ... | 1,347 | 1,468 | 1,615 | 1,693 | 1,598 | 1,792 | +9.0 | +10.0 | +4.8 | —5.6 | +12.1 |
| පෙබරවාරි ... ... ... ... | 1,369 | 1,501 | 1,582 | 1,674 | 1,687 | 1,793 | +9.6 | +5.4 | +5.4 | +0.8 | +6.3 |
| මාර්තු ... ... ... ... | 1,385 | 1,505 | 1,585 | 1,666 | 1,817 | 1,831 | +8.7 | +5.3 | +5.1 | +9.1 | +0.8 |
| අප්‍රේල් ... ... ... ... | 1,400 | 1,534 | 1,601 | 1,675 | 1,781 | 1,857 | +9.6 | +4.4 | +4.6 | +6.3 | +4.3 |
| මැයි ... ... ... ... | 1,431 | 1,547 | 1,645 | 1,698 | 1,723 | 1,869 | +8.1 | +6.3 | +3.2 | +1.5 | +8.5 |
| ජූනි ... ... ... ... | 1,448 | 1,550 | 1,650 | 1,692 | 1,731 | 1,857 | +7.0 | +6.4 | +2.5 | +2.3 | +7.3 |
| ජූලි ... ... ... ... | 1,447 | 1,543 | 1,693 | 1,757 | 1,718 | 1,831 | +6.6 | +9.7 | +3.8 | —2.2 | +6.6 |
| අගෝස්තු ... ... ... ... | 1,474 | 1,529 | 1,674 | 1,702 | 1,678 | 1,839 | +3.7 | +9.5 | +1.7 | —1.4 | +9.6 |
| සැප්තැම්බර් ... ... ... ... | 1,499 | 1,549 | 1,675 | 1,681 | 1,700 | 1,850 | +3.3 | +8.1 | +0.4 | +1.1 | +8.8 |
| ඔක්තෝබර් ... ... ... ... | 1,505 | 1,592 | 1,687 | 1,682 | 1,761 | 1,889 | +5.8 | +6.0 | —0.3 | +4.7 | +7.3 |
| නොවැම්බර් ... ... ... ... | 1,533 | 1,603 | 1,677 | 1,655 | 1,787 | 1,896 | +4.6 | +4.6 | —1.3 | +3.0 | +6.1 |
| දෙසැම්බර් ... ... ... ... | 1,506 | 1,622 | 1,716 | 1,659 | 1,808 | 1,913 | +7.7 | +5.8 | —3.3 | +9.0 | +5.8 |
| මාසික සාමාන්‍යය ... ... ... | 1,545 | 1,454 | 1,650 | 1,686 | 1,732 | 1,851 | +6.9 | +6.8 | +2.2 | +2.7 | +6.9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## II (ඇ) 2 වැනි සංඛ්‍යා සටහන

### මුදල් සැපයුමේ වෙනස්වීම් සහ බලපෑ සාධක (වර්ෂාවසාන සංඛ්‍යා අනුවය)

රුපියල් දශ ලක්ෂ

| මුදල් සැපැයුම කෙරෙහි බල පෑ සාධක | 1962–63 | | 1963–64** | | 1964–65** | | 1965–66** | | 1966–67** | | 1967–68 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක |
| 1. බැංකු සතු විදේශීය වත්කම් ( ශුද්ධ ) ... ... ... ... | — | 53.2 | 16.9* | — | 79.8† | — | — | 196.3 | — | 91.5 | — | 115.7 |
| 2. පෞද්ගලික අංශය †† ... ... ... ... ... | 133.1 | 63.4 | 82.6 | 57.1 | 19.2 | 75.4 | 137.2 | 79.6 | 105.6 | 133.1 | 264.1 | 165.5 |
| (අ) පෞද්ගලික අංශයේ අනෙකුත් තැන්පතුකරුවනට දෙන ලද වෙළෙඳ බැංකු ණය § ... ... ... ... | 125.0 | — | 82.6 | — | 10.0 | — | 33.5 | — | 86.9 | — | 155.0 | — |
| (ආ) සමුපකාර ආයතනවලට දෙන ලද වෙළෙඳ බැංකු ණය ... ... | — | — | — | — | — | 6.9 | 25.8 | — | 7.3 | — | 18.5 | — |
| (ඇ) සමුපකාර ආයතනවල කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ... | — | — | — | — | — | 2.1 | — | 2.3 | — | 1.4 | — | 1.5 |
| (ඈ) පෞද්ගලික අංශයේ අනෙකුත් තැන්පතුකරුවනට දෙන ලද කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ... ... ... ... | — | 63.4 | — | 52.2 | — | 46.2 | — | 65.3 | — | 49.5 | — | 99.9 |
| (ඉ) වෙළෙඳ බැංකුවල අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) ... | 8.1 | — | — | 4.9 | — | 20.2 | — | 12.0 | — | 31.0 | — | 40.9 |
| රජයේ සමායතන | | | | | | | | | | | | |
| (ඊ) රජයේ සමායතනවලට දෙන ලද වෙළෙඳ බැංකු ණය ... ... | — | — | — | — | 7.8 | — | 27.7 | — | 11.4 | — | 90.6 | — |
| (උ) වෙළෙඳ බැංකු වෙතැති, රජයේ සමායතනවල කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු ... ... ... ... | — | — | — | — | 1.4 | — | 50.2 | — | — | 51.2 | — | 23.2 |
| 3. රාජ්‍යාංශය... ... ... ... ... ... | 166.2 | 19.0 | 133.6 | 58.0 | 120.3 | 53.2 | 207.5 | 125.5 | 267.8 | — | 306.9 | 184.5 |
| (අ) වෙළෙඳ බැංකු වෙතැති භාණ්ඩාගාර බිල්පත්, රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් සහ රජයේ ආනයන බිල්පත් ... ... | 19.7 | — | 3.6 | — | 92.3 | — | — | 62.6 | 75.3 | — | — | 114.9 |
| (ආ) මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් ... ... ... | 139.5 | — | 123.2 | — | — | 38.7 | 155.9 | — | 109.9 | — | 269.4 | — |
| (ඇ) මහ බැංකුව රජයට දුන් අත්තිකාරම් ... ... ... | 7.0 | — | 6.8 | — | 28.0 | — | 26.4 | — | 12.7 | — | 37.5 | — |
| (ඈ) මහ බැංකුවේ අනෙකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ) ... ... | — | 10.7 | — | 54.8§ | — | 4.5 | 25.2 | — | 13.9 | — | — | 0.2 |
| (ඉ) බැංකු වෙතැති, රජයේ තැන්පතු හා භාණ්ඩාගාරය හා කච්චේරි වෙතැති මුදල් ශේෂ ... ... ... ... | — | 8.3 | — | 3.2 | — | 10.0 | — | 62.9 | 56.0 | — | — | 69.4 |
| 4. භුවමාරුවෙහි පවත්නා ශීර්ෂය සඳහා ගැලපිළි ... ... ... | — | 0.2 | — | 2.3 | 3.2 | — | — | 0.1 | — | 0.1 | 0.2 | — |
| මුළු ප්‍රසාරණාත්මක/සංකෝචනාත්මක සාධක ... ... ... | 299.3 | 135.8 | 233.1 | 117.4 | 222.5 | 128.6 | 344.7 | 401.5 | 373.4 | 224.7 | 571.2 | 465.7 |
| මුදල් සැපයුමෙහි වෙනස ... ... ... ... ... | +163.3 | | +115.8 | | + 93.8 | | — 56.8 | | +148.7 | | +105.6 | |

* 1964 පෙබරවාරි මාසයේ දී, මහ බැංකුව රුපි. දශ ලක්ෂ 53.3 ක ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් මිලටගත් විදේශීය වත්කම් ද ඇතුළත් ය, මෙයට ඉඩ හළ විට, ශුද්ධ බැංකු විදේශීය වත්කම් වසර තුළ දී ඇත්ත වශයෙන් ම රුපි. දශ ලක්ෂ 36.4 කින් පහළ වැටී ඇත.

† 1965 මැයි මාසයේ දී මහ බැංකුව, රජයේ ආයතනවලින් රුපි. දශ ලක්ෂ 30.1 ක ප්‍රකාශිත වටිනාකමට මිලට ගත් විදේශීය වත්කම් ද ඇතුළත් ය, මෙයට ඉඩ හළ විට, ශුද්ධ බැංකු විදේශීය වත්කම්හි රුපි. දශ ලක්ෂ 49.6 ක වැඩිවීමක් පිළිබිඹු වෙයි. රජයේ ආයතනවලට රුපියල් වලින් මිල ගෙවීම හේතු කොට ගෙන මුදල් සැපැයුම කෙරෙහි එක එල්ලේ ම ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති විය.

†† වට්ටම් කළ අපනයන බිල්පත්වල වටිනාකම බැංකු විදේශීය වත්කම් යටතේ ඇතුළත් කෙරුනි.

§ සමුපකාර ආයතනවලට හා රජයේ සමායතනවලට සංඛ්‍යා තොරතුරු වෙන වෙන ම ලබා ගත හැක්කේ 1964–65 කාලඡෙදය සම්බන්ධයෙන් පමණකි. ඊට කලින් කාලඡෙදයක් සඳහා වූ මෙම සංඛ්‍යා තොරතුරු ' පෞද්ගලික අංශයේ අනෙකුත් තැන්පතුකරුවන් ' යටතේ ඇතුළත් කෙරුනි.

§ රජයේ ආයතනවලට වැඩි වූ මහ බැංකු වගකීම්වලින් රුපි. දශ ලක්ෂ 53.3 ක් ම රජයේ සමායතනවලට එම වටිනාකමට නිකුත් කරන මහ බැංකු සුරැකුම්පත් වෙයි. කෙසේ වුවද, මෙයින් ශුද්ධ මුදල් වැඩිවීමක් සිදු වී නොමැත.

** ඉකුත් වාර්ෂික වාර්තාවල සංඛ්‍යා හා මෙම සංඛ්‍යා අතර ඇති වෙනස්කම්වල හේතුව සංඛ්‍යා සංශෝධනයයි.

වඩා විශාල වූයෙන්, විදේශීය බැංකු වත්කම් ආපසු ලබා ගැනීමෙන් හෝ විදේශීය බැංකු වගකීම් එක් රැස් කිරීමෙන් මෙසේ වර්ධිත මුළු හිඟය සඳහා ම මුදල් යෙදවීමට අවශ්‍ය නොවීය. වර්තන ගිණුමේ ගෙවුම් ශේෂ හිඟය රුපියල් දශ ලක්ෂ 346 ක්ව පැවතියත්, විදේශීය බැංකු වත්කම්වල සුළු වැඩිවීම අත්හල පසු විදේශීය බැංකු වගකීම් ඉහළයාම හේතු කොටගෙන මුදල් සැපැයුම කෙරෙහි සංකෝචනාත්මක බලපෑම, රු: ද: ල. 115.7 කට සීමාවිය.

වර්ෂය ආරම්භයේ දී පහත් මට්ටමක පැවති මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය 1968 තුළ දී තවත් රුපියල් දශ ලක්ෂ 24.8 කින් අඩු විය. මහ බැංකුවේ විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 120.9 කින් වැඩි වුණි. හිලවු මූල්‍ය ක්‍රමය සහ තුන් වැනි සම්පස්ථ ගිවිසුම් යටතේ වූ ආපසු ලබා ගැනීම් ( නැවත මිලට ගැනීම් හැර ) නිසා උද්ගත වූ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කෙරෙහි වූ විදේශීය විනිමය වගකීම් රුපියල් දශ ලක්ෂ 174.2 ක, ඉහත කී වැඩිවීමේ ප්‍රධාන අංශය විය. ප්‍රධාන වශයෙන්, ගෙවීමට ඇති ශේෂයන් බේරුම් කිරීම නිසා ද්විපාර්ශ්වීය ගිවිසුම් යටතේ විදේශීය රටවල් වෙත වූ වගකීම් වසර තුළ දී රුපියල් දශ ලක්ෂ 23.5 කින් පහළ වැටිණි. මහ බැංකුව විසින් විදේශීය බැංකුවලින් ලබාගත් ණය 1967 අවසානයේදී රුපි. දශ ලක්ෂ 57.1 ක් ව පැවති අතර, ඒවා 1968 ආරම්භයේදී සම්පූර්ණයෙන් ම ගෙවා නිම කරන ලදී. එහෙත් දෙසැම්බරයේ දී රුපියල් දශ ලක්ෂ 28.6 ක අභිනව ණය මුදලක් ලබා ගන්නා ලදී. 1968 තුළ දී වෙළෙඳ බැංකුවල ද විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 7.3 කින් ඉහළ නැංගේය. එහෙත්, වෙළෙඳ බැංකුවල විදේශීය වගකීම්හි ඇති වූ රුපියල් දශ ලක්ෂ 37.4 ක රාශිකරණය නිසා මෙම වැඩිවීම පමණටත් වැඩියෙන් මැකී ගියේය.

විදේශීය අංශය මුදල් සැපැයුම කෙරෙහි සංකෝචනාත්මකව බලපෑවත් මූල්‍ය කටයුතු සහ පෞද්ගලික අංශය වෙත සැපැයුන ණය ප්‍රමාණය පුළුල් වීමෙන් ප්‍රබල ප්‍රසාරණාත්මක බලපෑම් පැවතිණ. ඉකුත් වර්ෂයේ දී මෙන් ම ප්‍රධාන ප්‍රසාරණාත්මක බලපෑම වූයේ රජයේ මුදල් කටයුතු ය. කෙසේ වෙතත්, 1968 වර්ෂයේදී රාජ්‍ය අංශය වෙත පැවරිය හැකි රුපියල් දශ ලක්ෂ 122.4 ක ප්‍රසාරණාත්මක බලපෑම 1967 දීට වඩා අඩකටත් අඩු විය. ප්‍රධාන වශයෙන්, ප්‍රතිපාර්ශ්වීය අරමුදල්වල වැඩිවීම හේතු කොට ගෙන රජයට වැඩිපුර සම්පත් ලබාගත හැකි වීම හා මැයි මාසයේ සිට ක්‍රියාත්මක වූ විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමයෙන් ලද අතිරේක ආදායම හේතු කොට ගෙන, 1968 වර්ෂයේදී බැංකුවලින් කරන ලද ණය ගැනීම අඩු කිරීමට හැකි විය.

සමාලෝචනයට භාජන වන වර්ෂය තුළදී මහ බැංකුව කෙරෙහි වූ රජයේ ණයගැතිකම රුපියල් දශලක්ෂ 306.9 කින් ඉහළ ගිය අතර එම මුදල් මහ බැංකුව වෙත වූ රජයේ සහ රජය සහතිකකළ සුරැකුම් පත් ප්‍රමාණයේ රුපියල් දශලක්ෂ 269.4 ක් ද, තාවකාලික අත්තිකාරම්වල රුපියල් දශලක්ෂ 35.0 ක් ද, සමන්විත විය. මහ බැංකුව වෙත වූ ණයගැතිකම මෙසේ සැලකිය යුතු ලෙස වැඩිවීමට හේතු වී ඇත්තේ ඉකුත් වර්ෂය තුළදී එකතු වූ රජයේ ආනයන බිල්පත් වෙනුවෙන් වාණිජ බැංකු වෙත තිබි ආණ්ඩුවේ ණය ගැතිකම අඩු කිරීම සඳහා විය. 1968 දී වාණිජ බැංකු විසින් අත් කොට ගෙන තිබි මෙම බිල්පත් රුපියල් දශලක්ෂ 125.0 කින් අඩු කරන ලදී. වාණිජ බැංකු විසින් අත් කොට ගෙන තිබූ රජයේ සහ රජය සහතික සුරැකුම් පත් රුපියල් දශලක්ෂ 10.1 කින් වැඩි විය. මේ ආකාරයෙන් බැංකු ක්‍රමය වෙත වූ රජයේ ශුද්ධ ණයගැති භාවය 1968 දී රුපියල් දශ ලක්ෂ 192.0 ක් විය. මෙය මහ බැංකුව සහ වානිජ බැංකු කෙරෙහි රජයේ ණයගැති භාවය ඉහළ නැගි, ඉකුත් වර්ෂයේ අනුරූප සංඛ්‍යාවලට වඩා අඩු ය. 1968 දී රජයේ මුදල් කටයුතුවල පෙනුනු හීන වූ ප්‍රසාරණාත්මක බලපෑම, ප්‍රධාන වශයෙන් ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ගණයේ රජයේ මුදල් ශේෂයන්හි දශලක්ෂ 69.4 ක ශුද්ධ වැඩිවීම පිළිබිඹු කරයි. මෙය ඉකුත් වර්ෂයේදී මුදල් ශේෂයන්හි රුපියල් දශලක්ෂ 56.0 ක ශුද්ධ අඩුවීම හා සැසඳේ.

පෞද්ගලික අංශය ( රජයේ සංයුක්ත මණ්ඩල ඇතුළුව ) වෙත සැපයුණු බැංකු ණය වැඩිවීම 1968 දී රුපියල් දශලක්ෂ 264.1 කි. මෙය ඉකුත් වර්ෂයේ අනුරූපී සංඛ්‍යාවට දෙගුණයකටත් වඩා විශාල වූවා පමණක් නොව, ඇත්ත වශයෙන් ම, නිරපේක්ෂ හා ප්‍රතිශත වශයෙන් මෙතෙක් වාර්තාගතවී ඇති විශාලතම වැඩිවීම ය. 1968 තුළ දී වැඩියෙන් මවන ලද ණය, ප්‍රමාණයන් සමූපකාර සමිති, රජයේ සංයුක්ත මණ්ඩල සහ විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ අනෙක් ණය ගන්නන් විසින් ප්‍රයෝජනයට ගෙන ඇත. මෙසේ සියළුම ගණයේ ණය ලබා ගත්තවුන්ගේ ණය අවශ්‍යතාවයන් වැඩිවීමට හේතුවී ඇත්තේ කෘෂිකාර්මික නිෂ්පාදනය පුළුල් වීම හා කාර්මික කටයුතු වැඩිවීම නිසා පෞද්ගලික අංශයේ ආර්ථික කටයුතු දියුණුවීමය.

කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ වාණිජ බැංකු විසින් සමූපකාර සමිති වෙත සපයන ලද ණය මුදල්වල ආපසු ගෙවීමට තිබි ප්‍රමාණය 1967 අවසානයේ සිට 1968 අවසානය දක්වා කාලය තුළ රුපියල් දශලක්ෂ 14.7 කින් වැඩි විය. මෙම කාල සීමාව තුළ සමූපකාර සමිති වෙත

භාණ්ඩ ලබා ගැනීම සඳහා සපයන ලද අත්තිකාරම් ද රුපියල් දශලක්ෂ 7.2 කින් වැඩිවුන අතර, වර්ෂය අවසානයේදී සහතික මිල ක්‍රමය යටතේ, රජය විසින් ලබා ගන්නා ලද වී ප්‍රමාණය වඩාත් විශාලවීම මෙයින් පිළිබිඹු කෙරේ. රජයේ සංයුක්ත මණ්ඩල වෙත සපයනු ලැබූ බැංකු ණය රුපියල් දශලක්ෂ 90.6 කින් ඉහළ ගොස් ඇත. වර්ෂයේ පසු භාගයේදී රජයේ සංයුක්ත මණ්ඩලවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් මුදල් කිරීමේ කාර්යය, ආණ්ඩුව වෙතින් වාණිජ බැංකුව වෙත පවරා ගැනීමෙන් අනතුරුව මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන් සිදු විය. සංයුක්ත මණ්ඩල වෙත සපයනු ලැබූ වාණිජ බැංකු ණයවල වැඩිවීමට තරමක් හේතුවී ඇත්තේ, සංයුක්ත මණ්ඩල විසින් වර්ෂය අවසාන භාගයේ දී වැඩි ආනයන ප්‍රමාණයක් ලබා ගැනීමය.

පෞද්ගලික අංශයෙහි අනෙකුත් ණය ලබා ගන්නවුන් වෙත වාණිජ බැංකු විසින් සපයනු ලදුව 1967 අවසානයේ සිට 1968 අවසානය තෙක් නොබේරා පැවති ණය මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 155.0 කින් වැඩි විය. ණය මුදල් රුපියල් දශලක්ෂ 77.9 කින් ද, අයිරාවන් රුපියල් දශලක්ෂ 70.3 කින් ද, ආනයන බිල්පත් රුපියල් දශලක්ෂ 18.4 කින් ද වැඩි වුනු අතර, වාණිජ බැංකුවල එකතු වේමින් පවතින දුරීම් රුපියල් දශලක්ෂ 11.7 කින් අඩු විය. ණය ප්‍රමාණය වැඩි වීමෙන් ඇති වූ අතිරේක මූල්‍ය සම්පත් ප්‍රධාන වශයෙන් කාර්මික හා වාණිජ අංශ වෙනුවෙන් වුවද, අනෙක් අංශවලට දෙන ලද ණය ප්‍රමාණයෙහි ද වැඩිවීම් ඇති විය.

සමාලෝචනයට භාජන වන වර්ෂය තුළදී පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 264.1 කින් ප්‍රසාරණය වුවද, මෙම අංශය වෙත පැවරිය හැකි, මුදල් සැපයුම කෙරෙහි ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම වූයේ රුපියල් දශ ලක්ෂ 98.6 ක් පමණි. මෙය එසේ වූයේ, මුදල් සැපයුමෙහි වැඩිවීමෙන් උද්ගත වන ප්‍රසාරණාත්මක බලපෑම, වාණිජ බැංකු වෙත පෞද්ගලික අංශය කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතුවල වැඩිවීමෙන් රුපියල් දශලක්ෂ 124.6 ක ප්‍රමාණයකට මැකී යෑම හේතු කොට ගෙනය. රජයේ සංයුක්ත මණ්ඩලවල කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශලක්ෂ 23.2 කින් වැඩි වූ අතර පෞද්ගලික අංශයේ, අනෙකුත් ගනුදෙනු කරුවන්ගේ එම තැන්පතු රුපියල් දශලක්ෂ 101.4 කින් වැඩි විය. පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි මෙම වැඩිවීමෙන් උද්ගත වන ප්‍රසාරාණාත්මක බලපෑම මැකී යෑමට උපකාරී වූ, වාණිජ බැංකුවල ''අනෙකුත් වගකීම්'' (ශුද්ධ) හිද රුපියල් දශලක්ෂ 40.9 ක වැඩිවීමක් විය.

සංක්ෂිප්ත වශයෙන් කියතොත්, 1968 දී ශුද්ධ මුදල් සැපැයුමෙහි ප්‍රසාරණයක් ඇති කළ විවිධ බලපෑම් මෙවා විය. විදේශීය අංශය විසින් රුපියල් දශ ලක්ෂ 115.7 ක සංකෝචනාත්මක බලපෑමක් ඇති කළ ද, රජයේ සහ පෞද්ගලික අංශයේ මුදල් කටයුතුවලින් උද්ගත වූ ප්‍රසාරණාත්මක බලපෑම් එම සංකෝචනාත්මක බලපෑම මකාලීමට තරම් බලවත් විය. බැංකු ක්‍රමය වෙත වූ රජයේ ණයගැති භාවයේ වැඩිවීම වූ රුපියල් දශ ලක්ෂ 192.0 ඉකුත් වර්ෂයේ වැඩිවීමට වඩා කුඩා වූ අතර, රජයේ මුදල් ශේෂයන්හි රුපියල් දශ ලක්ෂ 69.4 ක් එකතු වීමෙන්, මුදල් සැපැයුම කෙරෙහි වූ එහි ප්‍රසාරණාත්මක පීඩනය තවදුරටත් හීන විය. පුද්ගලික අංශය වෙත සපයා ඇති ණය ප්‍රමාණයෙහි ඉහළ යාම 1968 දී රුපියල් දශ ලක්ෂ 264.1 ක් වීමෙන් උච්චස්ථානයකට පත් විය. එහෙත් මෙයින් උද්ගත වන ප්‍රසාරණාත්මක බලපෑම, බැංකුවල කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු වැඩිවීම නිසා සීමිත විය. මේ අනුව, මූල්‍ය ප්‍රසාරණයේ අභ්‍යන්තර මූලයන් දෙකෙහි ම — එනම් ආණ්ඩුවේ සහ පෞද්ගලික අංශයේ මුදල් කටයුතු — බැංකු ක්‍රමය විසින් විශාල ලෙස මුදල් මැවීමේ හැකියාව ලබා දුන්නත්, අංශ දෙකෙහි ම වූ සංකෝචනාත්මක බලපෑම් මගින් එය තරමක් දුරට මැකී ගියේ ය. විදේශීය අංශයෙහි සංකෝචනාත්මක බලපෑම ද සැලකිල්ලට ගෙන බලන විට, වර්ෂය තුළ දී මුදල් සැපයුමෙහි සිදු වූ වැඩිවීම, රුපියල් දශ ලක්ෂ 105.6 ක් විය.

### (ඇ) බැංකු නොවන පෞද්ගලික අංශයේ ද්‍රවශීලතාවය

1968 දී, පෞද්ගලික අංශයේ මූල්‍ය වගකීම්වල වැඩිවීමක් ඇති වීය. 1966 සිට 1968 දක්වා කාලය තුළ දී, ප්‍රාථමික හා ද්විතීය ද්‍රවශීල වත්කම් බැංකු නොවන පෞද්ගලික අංශය තුළ බෙදී ගිය අයුරු II (ඇ) 3 සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත. ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතු වලින් සංයුක්ත වන ප්‍රාථමික හා ද්‍රවශීල වත්කම් වැඩිවීම වූ රුපියල් දශ ලක්ෂ 105.6 ට අතිරේක ද්විතීය ද්‍රවශීල වත්කම්වල, 1967 අවසානයේ මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 252.3 ක වැඩිවීමක් ද විය. 1968 දී ද්විතීය ද්‍රවශීල වත්කම්වල වැඩිවීම ඉකුත් වර්ෂයේ සිදු වූ වැඩිවීමට වඩා විශාල විය. එහෙයින්, මීට වර්ෂයකට ඉහත දී සියයට 54.1 ක් වූ මුළු ද්‍රවශීලවත්කම් වලින් ද්විතීය ද්‍රවශීල වත්කම්වල සමානුපාතය, වර්ෂය අවසානයේ දී සියයට 55.5 දක්වා වැඩි වීය.

ප්‍රාථමික ද්‍රවශීල වත්කම් වර්ග දෙකෙන්, ව්‍යවහාර මුදල්වල සමානුපාතයෙහි වැඩිවීම දක්විණි. මහජනයා විසින් ඉල්ලුම් තැන්පතුවලට වඩා ව්‍යවහාර මුදල් වෙත සාපේක්ෂිතව දක්වන වැඩි සැලකිල්ල ගැන පසුගිය වර්ෂ කිහිපයේ වාර්ෂික වාර්තාවල අවධානය යොමු කරවන ලදී. මුළු මුදල් සැපයුමෙහි, ව්‍යවහාර මුදල්වල සමානුපාතය, තවදුරටත් වැඩිවීමෙන්, 1968 දී සියයට 55.7ක්ව, මෙතෙක් සඳහන් වී ඇති ඉහළ ම වර්ෂාවසාන සංඛ්‍යාව වීම, මෙම ඉහළ යෑමේ ප්‍රවණතාවය පිළිබිඹු කරන පහත දක්වෙන II (ඇ) 4 වැනි සංඛ්‍යා සටහනෙන් පිළිබිඹු වෙයි. ව්‍යවහාර මුදල් සමානුපාතයේ, මෙම ඉහළ යෑමේ ප්‍රවණතාවය සමග වැඩි වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නිකුතුවේ සාපේක්ෂිත වැඩිවීමක් ද ඇති විය. රුපියල් 100/– නෝට්ටු නිකුතුව, 1965 සිට රුපියල් 5/–, රුපියල් 10/–, සහ රුපියල් 50/– නෝට්ටු නිකුතුවට වඩා සීඝ්‍රයෙන් වැඩිවූවා පමණක් නොව, එක් එක් වර්ෂය තුළ දී සිදු වූ මුළු මුදල් නිකුතුවේ වැඩිවීමට වඩා සීඝ්‍රයෙන් ද වැඩි වූ ආකාරය II (ඇ) 5 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වේ.

## සංඛ්‍යා සටහන II (ඇ) 3

### බැංකු නොවන පෞද්ගලික අංශයේ ද්‍රව්‍යශීල වත්කම්

| විස්තර | ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ) | | | දළ ජාතික නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් (අ) | | |
|---|---|---|---|---|---|---|
| | 1966 (ආ) | 1967 | 1968 | 1966 (ආ) | 1967 | 1968 |
| 1. මූලික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) නෝට්ටු හා කාසි ... ... | 882.5 | 979.9 | 1,066.2 | 11.5 | 11.9 | 10.9 |
| (ආ) ඉල්ලුම් තැන්පතු ... ... | 776.4 | 827.7 | 847.0 | 10.1 | 10.1 | 8.6 |
| එකතුව ... ... ... | 1,658.9 | 1,807.6 | 1,913.2 | 21.5 | 22.0 | 19.5 |
| සියයට ගණන ... ... | | +9.0 | +5.8 | | | |
| 2. ද්විතීයික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) වෙළෙඳ බැංකු වෙතැති ඉතිරි කිරිම් තැන්පතු ... ... | 243.3 | 271.7 | 319.6 | 3.2 | 3.3 | 3.3 |
| (ආ) තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව වෙතැති ඉතිරි කිරිම් තැන්පතු ... ... | 438.4 | 450.6 | 463.0* | 5.7 | 5.5 | 4.7 |
| (ඇ) ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙතැති ඉතිරි කිරීමේ තැන්පතු | 91.2 | 93.2 | 96.9* | 1.2 | 1.1 | 1.0 |
| (ඈ) වෙළෙඳ බැංකු වෙතැති කාලීන තැන්පතු ... ... | 341.2 | 414.9 | 491.7 | 4.4 | 5.0 | 5.0 |
| (ඉ) මෙරට පදිංචිකරුවන් සතු විදේශීය ශේෂ ... ... | 7.3 | 13.2 | 15.7* | 0.1 | 0.2 | 0.2 |
| (ඊ) ඉතිරි කිරීමේ සහතික ... ... | 56.5 | 78.7 | 91.3 | 0.7 | 1.0 | 0.9 |
| (උ) භාණ්ඩාගාර බිල්පත් ... ... | 13.5 | 6.2 | 11.5 | 0.2 | 0.1 | 0.1 |
| (ඌ) බදු සංචිත සහතික ... ... | 30.0 | 24.1 | 23.9 | 0.4 | 0.3 | 0.2 |
| (එ) රජයේ පිළින පත් ... ... | 705.7 | 783.0 | 874.3 | 9·2 | 9.5 | 8.9 |
| එකතුව ... ... ... | 1,927.1 | 2,135.6 | 2,387.9* | 25.0 | 26.0 | 24.3 |
| වෙනසෙහි සියයට ගණන ... | | +10.8 | +11.8 | | | |
| 3. පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම් | 3,586.0 | 3,943.2 | 4,301.1* | 46.6 | 47.9 | 43.8 |
| වෙනසෙහි සියයට ගණන ... ... | | +10.0 | +9.1 | | | |
| ඉහත සංඛ්‍යාවලට තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව, ලංකා ඉතිරි කිරීමේ බැංකුව, සේවක අර්ථසාධක අරමුදල ආදී රජයේ මූල්‍ය ආයතන වෙතැති භාණ්ඩාගාර බිල් හා රජයේ පිළිනපත් ඇතුළත් කොට නොමැත. | 1,447.9 | 1,639.6 | 1,859.1 | 18.8 | 19.9 | 18.9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) පවත්නා සාධක මිල අනුව

(ආ) ඉකුත් වාර්ෂික වාර්තාවල සංඛ්‍යා සහ මෙම සංඛ්‍යා අතර ඇති වෙනස්කම්වල හේතුව සංඛ්‍යා සංශෝධනයයි.

* තාවකාලිකයි.

## සංඛ්‍යා සටහන II (ඇ) 4

### මුදල් සැපයුමෙහි සැකසුම

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | | මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | | මුළු මුදල් සැපයුම |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | |
| 1955 ... ... ... | 384.5 | 35.8 | 688.4 | 64.2 | 1,072.9 |
| 1956 ... ... ... | 401.1 | 35.6 | 725.7 | 64.4 | 1,126.8 |
| 1957 ... ... ... | 434.9 | 41.8 | 605.2 | 58.2 | 1,040.1 |
| 1958 ... ... ... | 529.8 | 49.2 | 546.9 | 50.8 | 1,076.8 |
| 1959 ... ... ... | 565.0 | 48.0 | 612.7 | 52.0 | 1,177.7 |
| 1960 ... ... ... | 595.3 | 49.2 | 613.6 | 50.8 | 1,208.9 |
| 1961 ... ... ... | 692.2 | 53.8 | 596.4 | 46.2 | 1,288.6 |
| 1962 ... ... ... | 712.6 | 53.1 | 630.0 | 46.9 | 1,342.7 |
| 1963 ... ... ... | 828.4 | 55.0 | 677.7 | 45.0 | 1,506.0 |
| 1964 ... ... ... | 853.0 | 52.6 | 768.8 | 47.4 | 1,621.8 |
| 1965 ... ... ... | 901.4 | 52.5 | 814.3 | 47.5 | 1,715.7 |
| 1966 ... ... ... | 882.5 | 53.2 | 776.4 | 46.8 | 1,658.9 |
| 1967 ... ... ... | 979.9 | 54.2 | 827.7 | 45.8 | 1,807.6 |
| 1968 ... ... ... | 1,066.2 | 55.7 | 847.0 | 44·3 | 1,913.2 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන II (ඇ) 5

### ව්‍යවහාර මුදල් සංයුක්තිය — රු. 100, 50, 10 සහ 5 හේ වටිනාකම අනුව

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | රු. 100 | රු. 50 | රු. 10 | රු. 5 | ව්‍යවහාර මුදල් නිකුතුව–1 |
|---|---|---|---|---|---|
| 1955 ... ... ... | 113.7 | 88.0 | 145.7 | 28.2 | 425.0 |
| 1956 ... ... ... | 114.9 | 97.7 | 148.0 | 30.0 | 443.4 |
| 1957 ... ... ... | 116.5 | 116.7 | 155.8 | 29.9 | 475.1 |
| 1958 ... ... ... | 157.5 | 143.6 | 184.0 | 33.7 | 578.3 |
| 1959 ... ... ... | 174.5 | 152.1 | 193.5 | 36.2 | 621.3 |
| 1960 ... ... ... | 148.4 | 148.4 | 237.6 | 40.1 | 644.6 |
| 1961 ... ... ... | 211.9 | 180.3 | 254.6 | 42.1 | 763.8 |
| 1962 ... ... ... | 238.2 | 186.8 | 241.9 | 42.8 | 789.4 |
| 1963 ... ... ... | 275.3 | 236.7 | 257.6 | 46.5 | 900.9 |
| 1964 ... ... ... | 168.4 | 258.3 | 359.5 | 55.5 | 932.1 |
| 1965 ... ... ... | 239.9 | 297.8 | 319.7 | 50.5 | 1,002.8 |
| 1966 ... ... ... | 272.0 | 292.9 | 288.2 | 48.6 | 993.7 |
| 1967 ... ... ... | 316.2 | 313.1 | 296.3 | 51.3 | 1,072.8 |
| 1968 ... ... ... | 393.7 | 330.6 | 299.5 | 55.3 | 1,181.9 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1. රුපියල් 2 සහ රු. 1 නෝට්ටු හා කාසි සියල්ලම ද අඩංගු වේ.

1964 සහ 1965 වර්ෂවල දී ව්‍යවහාර මුදල් සමානුපාතිකය සුළු වශයෙන් පහත වැටීමත් සමගම, අඩු වටිනාකමින් යුත් නෝට්ටු නිකුතුවට සාපේක්ෂිතව රුපියල් 100/– නෝට්ටු නිකුතුවේ අනුරූපී පහත වැටීමේ හේතුවෙන්, '' බදු පැහැර හැරීම් සහ වැඩි වටිනාකමින් යුත් ව්‍යවහාර නෝට්ටුවල ස්වරූපයෙන් වූ හෙළි නොකළ වත්කම් තබා ගැනීම්වලට එරෙහිව ක්‍රියා මාර්ග ගනු ඇතැයි '' මහජනයා තුළ වූ බලාපොරොත්තුවෙහි බිලපෑම, යටත් පිරිසෙයින් තරමක් දුරටවත්, මෙම පුනරාවර්තනයට හේතු වී යැයි, එම වර්ෂයන්හි වාර්ෂික වාර්තාවල සඳහන් කරන්නට යෙදුනි. මෙම ක්‍රියා මාර්ගයන් කෙරෙහි තිබි බිය අඩුවීම, මුදල් රාශිකරණය පැවතීම සහ සමහර විට බදු මග හැරීම යන කරුණු හේතු කොට ගෙන සමානුපාතය 1966 දී සහ 1967 දී නැවතත් ඉහළ යාමට පටන් ගන්නට ඇත.

වෙළෙඳ ආයතන විසින් දරූ ඉල්ලුම් තැන්පතුවල ප්‍රමාණයේ සහ සමානුපාතයේ සැලකිය යුතු අඩුවීමක් දක්වන, ඉල්ලුම් තැන්පතුවල හිමිකම් ව්‍යුහයේ ඇති වූ වෙනස්කම්වලින් ඉහතින් කී නිරීක්ෂණ තවදුරටත් ස්ථිර වන බව පෙනී යයි. මිල පාලන, ආනයන බාධක හා සැපැයුමෙහි හිඟකම් ඇතිවීමෙන් පසු කළුකඩ ජාවාරම් වැඩි වූ මෙම අංශයෙහි වෙළෙඳ ගනුදෙනු හා ලාභ සැඟවීම සහ බදු මග හැරීම සඳහා ව්‍යවහාර මුදල්වලට ඉල්ලුමක් ඇති වන්නට ඇත. රජයේ සංයුක්ත මණ්ඩලවල කාලීන තැන්පතු සැලකිය යුතු අන්දමින් වැඩි වූ අතර, පෞද්ගලික වෙළෙඳ ආයතනවල තැන්පතු වැඩි නොවීම ද වැදගත් කරුණකි.

නිෂ්පාදනය වැඩිවීමෙන් සහ වඩා හොඳ මිල ගණන් ලැබීමෙන් ග්‍රාමීය පෙදෙස්වල ආදායම් වැඩිවීම 1966 න් පසු බැංකු තැන්පතුවලට සාපේක්ෂිතව ව්‍යවහාර මුදල් පරිහරණය වැඩිවීමට තවත් හේතුවක් වශයෙන් දැක්විය හැකිය. ගම්බද රැකියාවන්හි වැටුප් ගෙවීම සහ වී සහ වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන ලබා ගැනීමේ දී ගෙවීම් කරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ව්‍යවහාර මුදලිනි. ආදායම් වැඩිවීම හේතු කොට ගෙන ග්‍රාමීය අංශයේ බැංකු තැන්පතු ප්‍රමාණය වැඩි වුවද, මෙම වැඩිවීම බැංකු අංශයේ තැන්පතුවල මුළු වැඩිවීමෙන් සුළු සමානුපාතයක් වීමෙන් දැක්වෙනුයේ, රාශිකරණය සඳහා ව්‍යවහාර මුදල් නෝට්ටු වැඩියෙන් පාවිච්චිවීමය.

මුදල් සැපයුමෙහි ඉල්ලුම් තැන්පතු අවිශේෂයෙන් වැඩි නොවන බව එහි කාසි ප්‍රමාණය ඉහළ යාමෙන් අදහස් වේ. මුදල් සැපයුමෙහි වූ රුපියල් දශ ලක්ෂ 105.6 ක මුළු වැඩිවීමෙන් ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 19.3 කින් පමණි. තවද, මුදල් සැපයුමෙහි සාමාන්‍ය මාසික මට්ටම 1967 ට වඩා 6.9% කින් වැඩි වූ අතර, රුපියල් දශ ලක්ෂ 827.4ක් වූ ඉල්ලුම් තැන්පතුවල සාමාන්‍ය මාසාන්ත මට්ටම 1967 ට වඩා වැඩි වූයේ රුපි. දශ ලක්ෂ 16.3 ක හෙවත් 2.0% කින් පමණි. කෙසේ වුවද, 1968 දී ඉල්ලුම් තැන්පතුවල පිරිවැටුම් අනුපාතය මේතාක් නොවූ පරිදි වැඩි විය. 1968 සාමාන්‍ය මාසික පිරිවැටුම් අනුපාතය වූ 2.06 ඉකුත් වර්ෂයේ අනුපාතය වන 1.60 හා සංසන්දනය කිරීමේ දී 28.7% ක වැඩිවීමක් පිළිබිඹු කළාය. 1968 දී මාසික පිරිවැටුම් අනුපාතයන් පසුගිය වර්ෂයේ අනුරූපික මාසයන්ට වඩා වැඩි වූ අතර, වර්ෂයේ අග භාගයේ දී විශේෂයෙන්ම වැඩි විය.

තැන්පතු සහ අත්තිකාරම් පිළිබඳ මහ බැංකුවේ අර්ධ වාර්ෂික සමීක්ෂණයෙන් ලබාගත්, බැංකුවල තැන්පතු වර්ග පිළිබඳ පුළුල් හිමිකම් වර්ගීකරණයක් II (ඇ) 6 වැනි සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ. සටහනෙහි දැක්වෙන පරිදි, වැවිලි අංශයේ ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය, හිමිකම් අනුව බැලීමේ දී වැඩිම ඉහළ යාමක් පෙන්නුම් කළාය. මෙම තැන්පතු 1966 සහ 1967 දී අඩු මට්ටමකට පත්වීමෙන් අනතුරුව, 1968 දී රුපියල් දශ ලක්ෂ 19.2 කින් ඉහළ ගිය අතර, වර්ෂාවසානයේ දී මුළුතැන්පතු ප්‍රමාණයෙන් 9.4% ක් විය. වර්ෂය තුළ දී ඉල්ලුම් තැන්පතු වැඩි වූ ඊළඟ ව්‍යාපාරික අංශය වූයේ නිෂ්පාදන ආයතනයි. මෙම ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 15.7 කින් ඉහළ ගිය අතර, වර්ෂාවසානයේදී මුළු තැන්පතු වලින් මේවායේ ප්‍රමාණය සියයට 8.8 දක්වා ඉහළ ගියේ ය.

ඉහතින් ද දැක් වූ පරිදි, වෙළෙඳ ආයතනයන් සතු ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය පහළ වැටුනු අතර, මූල්‍ය ආයතන හා අනිකුත් ව්‍යාපාරික ආයතන සතු වූ තැන්පතු ප්‍රමාණය ද අඩු විය. ව්‍යාපාරික නොවන අංශයෙහි, පුද්ගලයන් ගේ ඉල්ලුම් තැන්පතුවල රුපියල් දශ ලක්ෂ 9.2 ක වැඩිවීමක් පැවති අතර, ව්‍යාපාරික නොවන ආයතනයන්හි රුපියල් දශ ලක්ෂ 2.7 ක වැඩිවීමක් පැවතුනි.

## සංඛ්‍යා සටහන II (ඈ) 6

### වෙළඳ බැංකු, වෙතැති, ඉල්ලුම්, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු හිමිකම්
(කාලච්ඡේදය අවසානයේ දී)

රුපියල් දශලක්ෂ

| හිමියා | ඉල්ලුම් | | කාලීන | | ඉතිරි කිරීම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| මූල්‍ය ආයතන ... | | | | | | | | |
| 1967 දෙසැම්බර් ... | 53.2 | 6.7 | 69.4 | 17.8 | 12.1 | 4.4 | 134.6 | 9.2 |
| 1968 ජූනි ... | 49.3 | 6.3 | 87.8 | 18.7 | 11.1 | 3.8 | 148.1 | 9.6 |
| 1968 දෙසැම්බර් ... | 47.9 | 6.0 | 90.7 | 19.6 | 12.1 | 3.8 | 150.7 | 9.5 |
| වැවිලි: | | | | | | | | |
| 1967 දෙසැම්බර් ... | 55.9 | 7.0 | 34.3 | 8.8 | 0.2 | 0.1 | 90.4 | 6.2 |
| 1968 ජූනි ... | 68.8 | 8.9 | 32.9 | 7.0 | 0.3 | ... | 102.1 | 6.6 |
| 1968 දෙසැම්බර් ... | 75.1 | 9.4 | 35.8 | 7.8 | 0.3 | 0.1 | 111.2 | 7.0 |
| වෙළෙඳ: | | | | | | | | |
| 1967 දෙසැම්බර් ... | 159.3 | 20.0 | 76.1 | 19.5 | 3.8 | 1.4 | 239.2 | 16.4 |
| 1968 ජූනි ... | 151.2 | 19.5 | 116.6 | 24.8 | 4.2 | 1.4 | 272.1 | 17.7 |
| 1968 දෙසැම්බර් ... | 137.1 | 17.2 | 107.0 | 23.2 | 4.2 | 1.3 | 248.3 | 15.7 |
| නිෂ්පාදන ආයතන | | | | | | | | |
| 1967 දෙසැම්බර් ... | 54.6 | 6.9 | 24.8 | 6.4 | 0.2 | 0.1 | 79.6 | 5.5 |
| 1968 ජූනි ... | 63.0 | 8.1 | 30.2 | 6.4 | 0.5 | 0.2 | 93.6 | 6.1 |
| 1968 දෙසැම්බර් ... | 70.3 | 8.8 | 27.0 | 5.8 | 0.4 | 0.1 | 97.7 | 6.2 |
| අනෙකුත් ව්‍යාපාර: | | | | | | | | |
| 1967 දෙසැම්බර් ... | 101.1 | 12.7 | 29.7 | 7.6 | 3.0 | 1.1 | 133.8 | 9.2 |
| 1968 ජූනි ... | 87.4 | 11.2 | 45.1 | 9.6 | 3.4 | 1.2 | 136.0 | 8.8 |
| 1968 දෙසැම්බර් ... | 89.9 | 11.3 | 35.2 | 7.6 | 2.6 | 0.8 | 127.7 | 8.1 |
| ප්‍රාදේශීය බලමණ්ඩල: | | | | | | | | |
| 1967 දෙසැම්බර් ... | 23.8 | 3.0 | 20.6 | 5.3 | 0.3 | 0.1 | 44.8 | 3.1 |
| 1968 ජූනි ... | 15.6 | 2.0 | 16.6 | 3.5 | 0.5 | 0.2 | 32.7 | 2.1 |
| 1968 දෙසැම්බර් ... | 19.0 | 2.4 | 14.7 | 3.2 | 0.6 | 0.2 | 34.3 | 2.2 |
| ව්‍යාපාරික නොවන ආයතන: | | | | | | | | |
| 1967 දෙසැම්බර් ... | 43.7 | 5.5 | 37.9 | 9.7 | 4 5 | 1.6 | 86.1 | 5 9 |
| 1968 ජූනි ... | 42.1 | 5.4 | 35.3 | 7.5 | 4.6 | 1.6 | 81.9 | 5.3 |
| 1968 දෙසැම්බර් ... | 46.4 | 5.8 | 30.6 | 6.6 | 5.7 | 1.8 | 82.8 | 5.2 |
| පුද්ගලයන්: | | | | | | | | |
| 1967 දෙසැම්බර් ... | 303.5 | 38.2 | 97.1 | 24.9 | 248.1 | 91.1 | 648.7 | 44.5 |
| 1968 ජූනි ... | 298.9 | 38.5 | 105.0 | 22.4 | 268.7 | 91.6 | 672.6 | 43.7 |
| 1968 දෙසැම්බර් ... | 312.7 | 39.2 | 120.6 | 26.1 | 294.0 | 91.9 | 727.3 | 46.0 |
| එකතුව: | | | | | | | | |
| 1967 දෙසැම්බර් ... | 795.1 | 100.0 | 389.8 | 100.0 | 272.2 | 100.0 | 1457.2 | 100.0 |
| 1968 ජූනි ... | 776.3 | 100.0 | 469.6 | 100.0 | 293.3 | 100.0 | 1539.2 | 100.0 |
| 1968 දෙසැම්බර් ... | 798.4 | 100.0 | 461.7 | 100.0 | 319.9 | 100.0 | 1580.1 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මහජනයා සතු ද්විතීය ද්‍රවශීල වත්කම් අතර, වෙළෙඳ බැංකුවල ඇති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ප්‍රමාණය, වැඩිම ඉහළ යාමක් පෙන්නුම් කළාය. ඉතිරි කිරීම් තැන්පතුවල වැඩිවීම රුපියල් දශ ලක්ෂ 47.9 ක් වූ අතර, මෙය 1967 දී පැවති රුපියල් දශ ලක්ෂ 28.4 හා සැසැඳේ. රුපියල් දශ ලක්ෂ 76.8 ක් වූ කාලීන තැන්පතුවල වැඩිවීම, පසුගිය වර්ෂයට වඩා මඳකින් වැඩි විය. මෑත වර්ෂවලදී මහජනයා සතු ද්විතීය ද්‍රවශීල වත්කම්වල සාපේක්ෂ වශයෙන් ඇතිවූ වේගවත් එකතුවීම වෙළෙඳ බැංකු වෙත ඇති ඉතිරි කිරීම් හා කාලීන තැන්පතු අනුපාතිකය වෙනස් වීමෙන් පිළිඹිබු වෙයි. 1962–65 වර්ෂ තුළදී මෙම අනුපාතය වර්ෂයකට සියයට 1 බැගින් වැඩිවී 1962 පැවති සියයට 30, 1965 දී සියයට 33 විය. මීළඟ වර්ෂ තුනේදී කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වල වර්ධනය ශීඝ්‍ර වී, 1966 තිබුණ අනුපාතය වන සියයට 35, 1967 දී සියයට 38 ටත්, 1968 දී සියයට 42 ටත් ඉහළ ගියේය.

හිමිකම් වර්ගයන් සියල්ලෙහි ම වාගේ කාලීන තැන්පතුවල වැඩිවීම පැවතුණි. වෙළෙඳ ආයතනවල කාලීන තැන්පතු රුපි. දශ ලක්ෂ 30.9 කින් වැඩි වූ අතර, මෙමගින් එම ආයතන සතු ඉල්ලුම් තැන්පතුවල අඩුවීම, බොහෝසේ හිලව් වී ගියේය. මෙම කොටසට හිමි කාලීන තැන්පතුවල වැඩිවීම මුළුමනින්ම, රජයේ සංස්ථාවන්වල වූ අතර, පෞද්ගලික වෙළඳ ආයතනයන් සතු තැන්පතු ප්‍රමාණය අඩු විය. 1968 දී මූල්‍ය ආයතනයන් සතු කාලීන තැන්පතු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 21.3 කින් ඉහළ ගියේය. මෙකී වැඩිවීමෙන් විශාල ප්‍රමාණයකට හේතුවූයේ පෞද්ගලික විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල් කාලීන තැන්පතු ආයෝජනයන්හි යෙදීම වැඩිවීමය. වතු අංශය, නිෂ්පාදන ආයතනයන් සහ අනෙක් ව්‍යාපාරික ආයතනයන් සතු කාලීන තැන්පතු වල සුලු වැඩිවීම් පැවතුනි.

ව්‍යාපාරික නොවන අංශයෙහි, දේශීය ආයතනයන් සහ ව්‍යාපාරික නොවන ආයතනයන් සතු කාලීන තැන්පතු ප්‍රමාණය, පිළිවෙලින් රුපි. දශ ලක්ෂ 5.9 කින් සහ රුපි. දශ ලක්ෂ 7.3 කින් අඩු වූයේය. අනෙක් අතට, 1968 දී පුද්ගලයින් සතු කාලීන තැන්පතු ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 23.5 කින් ඉහළ ගිය අතර, 1967 දී මෙම වැඩිවීම රුපි. දශ ලක්ෂ 8.5 ක් පමණක් විය.

පෞද්ගලික අංශය සතු වූ කාලීන තැන්පතු පමණක් නොව, ඉතිරිකිරීමේ තැන්පතු ප්‍රමාණය ද ඉහළ ගියේය. 1968 දී වෙළඳ බැංකුවල වූ පුද්ගලයින් සතු ඉතිරිකිරීමේ තැන්පතු ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 45.9 කින් වැඩි වූ අතර, මෙය වෙළඳ බැංකු වෙත තුබූ පෞද්ගලික අංශය සතු ඉතිරිකිරීමේ තැන්පතු වැඩි වූ මුලු ප්‍රමාණයට ම වාගේ වගකීවේය.

පසුගිය දෙවර්ෂය මුළුල්ලේ, වෙළඳ බැංකුවල වූ කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු ඉතා මත් කැපී පෙනෙන අන්දමින් වැඩිවීමෙන් පෙනී යන්නේ, මූල්‍ය ආදයම් වැඩිවීමේදී, පෞද්ගලික අංශයෙහි අනාගතයේදී ප්‍රයෝජනය සඳහා ඇති මූල්‍ය වත්කම් ප්‍රමාණය විශාල බවය. 1967 සහ 1968 දී, මෙම තැන්පතු සඳහා ගෙවන ලද පොළී අනුපාතයන් ඉහළ ගියේය. වර්තන ආදයමෙන් වැඩි කොටසක් ඉතිරි කිරීමෙහිලා, මෙය, කෙතරම් දුරට අනුබලයක් වූවාදැයි කිව නොහැක; කෙසේ වුවද, මෙමගින්, ඉතිරි කිරීමේ තැන්පතු සහ අනෙකුත් මූල්‍ය වත්කම් කාලීන තැන්පතුවලට පරිවර්තනය කිරීමෙහිලා අනුබලයක් වූයේයයි සිතිය හැක. 1966 දී ඇති කළ සමහර බදු සහනයන්, 1968/69 අය වැය ලේඛනය මගින් ඉවත් කළ නුමුදු , මෙහි ප්‍රතිඵලයක් ඇතිවූයේ 1968 අගෝස්තු මාසයේ සිටය. පුද්ගලයන් සතු ඉතිරිකිරීමේ තැන්පතු මෙන්ම, කාලීන තැන්පතුවල ද ප්‍රසාරණයක් පැවති අතර, මුදල් ආදයම්වල ශීඝ්‍ර වැඩිවීමක් ඇති වූ ගම්බද ප්‍රදේශයන් ද මෙම ප්‍රසාරණයට බොහෝ සේ වගකීය. විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල් විසින් ද, කාලීන තැන්පතු වඩා හිතකර ආයෝජන මාධ්‍යයක් ලෙස සැලකූ බව පෙනේ.

වෙළඳ බැංකු සතුව ඇති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල හිමිකම් ව්‍යූහයෙහි, පුද්ගලයින්ගේ සහ ඉතිරිකිරීමේ ආයතනයන් වන අර්ථ සාධක අරමුදල්හි වැදගත්කම, 1968 දී මෙම තැන්පතුවල ස්ථාවරත්වය ඉහළ යාමට තරමක් දුරට හේතුවිය. මෙම තැන්පතුවල වැඩිවීම වර්ෂය මුළුල්ලේ ක්‍රමානුකූලව සිදුවූ අතර, සැලකිය යුතු උච්ඡාවචනයකට ලක්වූයේ නැත. 1968 දී කාලීන තැන්පතුවල සාමාන්‍ය මාසික මට්ටම 1967 පැවති රුපි. දශ ලක්ෂ 383.4 න් රුපි. දශ ලක්ෂ 488.8 දක්වා වැඩි වූයේය. ඉතිරිකිරීමේ තැන්පතුවල සාමාන්‍ය මාසික මට්ටම රුපි. දශ ලක්ෂ 250.2 සිට රුපි. දශ ලක්ෂ 294.3 දක්වා වැඩිවුණි. 1968 දී මෙම සංචිතයන්හි පිරිවැටුම් අනුපාතයන් වෙනස්වූයේ සුදු වශයෙනි. ඉතිරි කිරීමේ තැන්පතුවල පිරිවැටුම් අනුපාතය, 1967 දී 0.08 සිට 1968 දී 0.09 දක්වා ආන්තික වශයෙන් වැඩි විය ; කාලීන තැන්පතු වල මෙම අනුපාතය 0.21 සිට 0.20 දක්වා අඩු විය.

1968 තුළදී, තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව සහ ලංකා ඉතිරි කිරීමේ බැංකුව සතුවූ තැන්පතු ප්‍රමාණය ද දිරිදෙන සුළු අන්දමින් වැඩි වූ මුත් පසුගිය වර්ෂයෙහි මෙවැන්නක් නොවීය.

තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව සතු රුපි. දශ ලක්ෂ 117.8ක් වූ නව තැන්පතු ප්‍රමාණය, 1966 සහ 1967 වර්ෂවලදී වෙනවෙනම පැවති තැන්පතුවලට වඩා රුපියල් දශ ලක්ෂ 12 කින් පමණ වැඩිවිය. රුපියල් දශ ලක්ෂ 105.5 ක්වූ ආපසු ගැනීම් ප්‍රමාණය පසුගිය දෙවස තුළ පැවති මට්ටමෙහිම පිහිටියේය. මේ අනුව, මේවායේ පිරිවැටුම් අනුපාතය මඳකින් අඩුවූයේය. තැපැල් කන්තෝරු ඉතිරිකිරීමේ බැංකුවෙහි තැන්පතු ප්‍රමාණයෙහි වැඩිවීම,ග්‍රාමීය ප්‍රදේශවල ආදායම් ඉහළ යාමේ හේතුවෙන් සිදුවිය. ග්‍රාමීය බැංකු ලෙස කටයුතු කරන සමූපකාර සමිති සතු තැන්පතු ප්‍රමාණයෙහි අනුරූපික වැඩිවීමක් පිළිබඳව අන් තැනක දක්වා ඇත.

1968 දී, පෞද්ගලික අංශය විසින් දරනු ලැබූ ඉතිරි කිරීමේ සහතික පත්වල වටිනාකම, රුපි. දශ ලක්ෂ 12.6 කින් වැඩි වූ අතර, පසුගිය වර්ෂයෙහි රුපි. දශ ලක්ෂ 22.2 වැඩිවීම හා සැසඳේ. 1968 දී මෙය මඳ වශයෙන් වැඩිවීමට හේතුවූයේ 1968/69 අය වැය ලේඛනය මගින්, බදු සහනයන් ඉවත් කිරීම නිසාය. මෙම සහතික පත් දැරීම් වැඩි වූයේ බොහෝ වශයෙන් වර්ෂයේ මුල් මාස හත තුළදීය.

1968 දී බැංකු නොවූ පෞද්ගලික අංශය විසින් දරනු ලැබූ රජයේ පිළිනපත් ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 91.3 කින් වැඩිවිය. රක්ෂණ සංස්ථාව විසින් දරන ලද රජයේ සුරැකුම්පත් ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 48.1 කින් ඉහළ ගියේය. භාරකාර, සුභසාධන විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල් ( සේවක අර්ථසාධක අරමුදල් හැර ) මගින් කළ දැරීම් රුපි. දශ ලක්ෂ 36.4 කින් වැඩි වූ අතර, රක්ෂණ සමාගම් විසින් දරනු ලැබූ රජයේ පිළින පත් ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 3.8 කින් ඉහළ ගියේය. පුද්ගලයින් විසින් දරනු ලැබූ රජයේ සුරැකුම්පත් ප්‍රමාණය වැඩිවූයේ රුපි. දශ ලක්ෂ 2.0 කින් පමණක් වූ අතර මෙය බැංකු නොවූ පෞද්ගලික අංශය මගින් දරනු ලැබූ මුළු රජයේ සුරැකුම්පත් ප්‍රමාණයේ 4.8% ක් විය. මේ අනුව, රජයේ පිළිනපත්වල හිමිකම් ව්‍යුහය දෙස බලන විට ආයතනික ධාරකයින් ගේ කොටස කැපී පෙනුණි.

පෞද්ගලික අංශයේ ද්‍රවශීල වත්කම්වල වර්ධනයේ මෙන්ම රටාවේත් ප්‍රධාන ලක්ෂණයන් මෙසේ සම්පිණ්ඩනය කොට දැක්විය හැකිය. ප්‍රාථමික වත්කම් ද්විතීයික වත්කම්වලට වඩා වැඩි වන ප්‍රමාණතාවයක් ඇතිව පොදු මහජන ප්‍රාථමික හා ද්විතීයික ද්‍රවශීල වත්කම්වල මෑත වර්ෂයන්හිදී සැහෙන වර්ධනයක් ඇතිවිය. මහජනයා වෙතැති ද්විතීයික ද්‍රවශීල වත්කම්වල සිදුවූ වෙනස්කම්, රජයේ සුරැකුම්වල ආයෝජනයට වඩා බැංකුවල තැන්පත් කිරීමේ ස්වරූපය ගත්තේය. රජයේ තැන්පතු කෙරෙහි වූ හිමිකම් පෑම් විශේෂයෙන් ම රජයේ පිළින පත් වැඩිවීම, ඒවා සඳහා වූ ඉල්ලුමෙහි සීමිත වර්ධනය පිළිබිඹු කිරීමකි. මෙකී ඉල්ලුම මෙම අඩු ද්‍රවශීල වත්කම් පිළිබඳ වත්කම් කුඩා ව්‍යුහයේ අඩු ද්‍රවශීලතා වත්කම් සුළු ප්‍රමාණයක් තබා ගැනීමට අවශ්‍ය වූ හෝ රජයේ සුරැකුම් පත්හි සිය අරමුදල් අතිරික්තය ආයෝජනය කිරීම පිණිස ව්‍යවස්ථාපිතව නියම කරනු ලැබූ රක්ෂණ සංස්ථාව වැනි ආයතනික ආයෝජකයින්ට සීමිතව පවත්නා ඉල්ලුමකි. පොදු මූල්‍ය වත්කම් සියල්ලම එක් කොට ගත් කල සංවර්ධනය වෙමින් පවත්නා අර්ථ ක්‍රමයනට පොදු වූ ලක්ෂණයන් දැකිය හැකිය. එනම් ආර්ථික සංවර්ධනයත් සමඟම ජාතික ආදායමට ඇති මූල්‍ය වත්කම්වල අනුපාතයේ ක්‍රමවත් නැගීමක් ඇතිවීමයි.

### 1 (ඇ) පොලී අනුපාතයන්

1968 දී සාමාන්‍ය වශයෙන් පොලී අනුපාතයේ ඉහළ යාමක් දක්නට ලැබුණි. 1968 මැයි 6 වන දිනදී බැංකු අනුපාතිකය සියයට 5 සිට සියයට 5½ දක්වා වැඩිකරන ලදී. මැදි කාලීන හා දිගු කාලීන ණය අරමුදල යටතේ ණය දෙන ආයතනයන්ට මහ බැංකුව විසින් සපයන ප්‍රතිමූල්‍යායෝජන පහසුකම් සඳහා වූ පොලී අනුපාතිකය ද නොවැම්බරයේදී වැඩි කරන ලදී. මේ අනුව කෘෂි කර්මය හා කර්මාන්ත නඟා ලීම හා වර්ධනය සඳහා වූ ණය සම්බන්ධයෙන් අය කැරුණු පොලී අනුපාතිකය 3% සිට 4% දක්වා ද, වෙළඳාම හා වාණිජ කටයුතු නඟාලීම හා සංවර්ධනය සඳහා වූ ණය සම්බන්ධ අනුපාතිකය 5% සිට 5½% දක්වා ද වැඩි කරන ලදී. තේ කර්මාන්ත ශාලා ගොඩනැගීම හෝ නවීකරණය සඳහා වූ ප්‍රතිමූල්‍යායෝජන ණය සම්බන්ධයෙන් මහ බැංකුවේ ප්‍රතිමූල්‍යායෝජන අනුපාතිකයන්, මෙරට වියදම් ආවරණය සඳහා වූ ණය සම්බන්ධයෙන් 5% ක්වද, විදේශීය විනිමය වියදම් ආවරණය සඳහා වූ ණය සම්බන්ධයෙන් 7% ක්ව ද, ස්ථාවරව පැවතිණ. කෘෂි කාර්මික ණය වියදම් ක්‍රමය යටතේ වූ මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජන අනුපාතිකය 1½% රෙහිම නො වෙනස්ව පැවතුණි.

බැංකු අනුපාතිකය වැඩි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳ බැංකු ණය අනුපාතිකයන් මැයි මාසයේ දී ඉහළ නැඟුණි. රජයේ සුරැකුම්පත්වලට ප්‍රතිමූඛව ගත් ණය සඳහා වූ අවම අනුපාතිකය 5½%සිට 5¾%දක්වා ද උපරිම අනුපාතිකය 8 %සිට 8½ %දක්වා ද වැඩිවිණි. බද්ධ—ව්‍යාපාර වස්තු සමාගම්වල කොටස්වලින් ආරක්ෂිතව ඇප ලත් ණයවල අවම අනුපාතිකය

6 % සිට 7 % දක්වාද උපරිම අනුපාතිකය 9 % සිට 9½ % දක්වා ද ඉහළ ගියේය. නිශ්චල දේපලින් ආරක්ෂිතව ඇප ලත් ණයවල අවම අනුපාතිකය 6½ % සිට 7% දක්වා වැඩි වූ අතර උපරිම අනුපාතය 9½ % හිම නොවෙනස්ව පැවතුණි. වෙනත් වර්ගවල ඇපවලට ප්‍රතිමුඛ වූ ණයවල අවම හා උපරිම අනුපාතිකයන් පිළිවෙලින් 5 % සිට 5½ දක්වාද 10 % සිට 11 % දක්වා ද වැඩි විය. ඇප රහිත අත්තිකාරම්වල අවම අනුපාතිකය 7% හිම නො වෙනස්ව පැවතුණු අතර උපරිම අනුපාතිකය 9 % සිට 10 % දක්වා වැඩි විය.

බැංකු බොහොමයක් විසින් මැයි මාසයේදී; මාස 12 දක්වා වූ කාල සීමාව සඳහා රුපි. 25,000 ට අඩු ස්ථාවර තැන්පතුවලට ගෙවන ලද පොළී අනුපාතිකය සියයට එකක එක් අඩකින් වැඩි කරන ලදී. ඉන් පසුව මෙකී තැන්පතු සඳහා වූ උපරිම අනුපාතිකය 3½ %ක් විය. මාස 48 ක කාල සීමාවක් සඳහා වූ රු. 25,000 හෝ සහ ඊට වැඩි ස්ථාවර තැන්පතුවල පොළී අනුපාතිකය වර්ෂය තුළදී සියයට හතරෙන් තුනෙකින් වැඩි විය. දෙසැම්බර් අවසානයේදී මෙකී තැන්පතු සඳහා වූ උපරිම අනුපාතිකය දෙසැම්බර් අගදී 3¾ % ක්ව පැවතිණ. වෙළඳ බැංකු විසින් ඉතිරි කිරීමේ තැන්පතු සඳහා ගෙවන ලද උපරිම පොළී අනුපාතිකය 3 % සිට 3½ % ක් දක්වා ජූලි මාසයේ දී වැඩිවුන අතර අවම අනුපාතිකය නො වෙනස්ව 3 % හිම පැවතිණි.

1967 දෙසැම්බරයේදී 3.20 % ක්ව පැවති භාණ්ඩාගාර බිල්පත් අනුපාතය 1968 මාර්තුවේදී 3.24 % තෙක් ද, ජූනි මාසයේ දී 3.54 % තෙක් ද ක්‍රමයෙන් ඉහළ නැඟුණි.

ජූලි — දෙසැම්බර් මාසවල දී එය 3.64 % හි ස්ථාවරව පැවතිණි.

20 වසරක් ඉක්මවා කල්පිරුණු රජයේ සුරැකුම්පත්වල පොළී අනුපාතිකය මැයි මාසයේ දී 4½ % සිට 5½ % දක්වා වැඩි කරන ලදී. 1963 ජූනි මාසයට පසුව මෙම අනුපාතිකය වැඩි කළ පළමු වතාව මෙය විය.

**2(අ) වෙළෙඳ බැංකු කටයුතු—ප්‍රධාන උපනතීන්**

මහජනයා ගේ තැන්පතු වැඩිවීම හේතු කොට ගෙන වෙළෙඳ බැංකුවල සම්පත් වැඩිවීමක් ඉකුත් වර්ෂයේ දී මෙන් ම දක්නට ලැබිණ. කෙසේ වෙතත්, වර්ෂය තුළ දී, මහ බැංකුවෙන් ණය ගැනීම් අඩු විය.

ශාඛා ව්‍යාප්තිය හීනවී තිබියදීත්, තැන්පතු වැඩි කිරීම සඳහා, කිසියම් බලවත් ව්‍යාපාරයක් නො තිබියදීත්, වෙළෙඳ බැංකු වෙතැති තැන්පතුවල ප්‍රසාරණය කැපී පෙනුණි. කෙසේ වුවද, පොළී අනුපාතිකයන් හි යම් යම් වැඩිවීම් ඇති වූ අතර, ස්ථාවර හා ඉතිරි කිරීම් තැන්පතු වර්ධනයෙහි ලා එය දිරි ගැන්වීමක් වන්නට ඇත. මෙසේ සිදු වූ තැන්පතු ඉහළ යාමට ජනයා ගේ ආදයම ඉහළ යාම හා ඉකුත් වර්ෂවල දී සිදු වූ මූල්‍ය ප්‍රසාරණය හේතු වශයෙන් දැක්විය හැකි ය.

වසරේ මුල් භාගය තුළ දී වෙළෙඳ බැංකු ණය සඳහා වූ ඉල්ලුම වැඩි වූ අතර, වසර අවසානය වන විට එය නැවතත් වැඩි විණ. පොළී අනුපාතිකයන් ඉහළ ගියත්, ණය අවශ්‍යතාවයන්හි සැලකිය යුතු ප්‍රසාරණයක් ඇති වූ බවට ලකුණු පහළ විය. රජයේ සංස්ථාවන්හි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වැඩි ප්‍රමාණයන් සඳහා මුදල් යෙදවීමට වෙළෙඳ බැංකු භාර ගෙන ඇති අතර, කර්මාන්ත සහ කෘෂිකර්මය සඳහා මැදිකාලීන සහ දිගු කාලීන වශයෙන් මුදල් යෙදවීමේ ක්ෂේත්‍රයෙහි, වඩාත් ක්‍රියාශීලීව කටයුතු කර ඇත.

සම්පත් යෙදවීම අතින් බලන කල, ඉකුත් වසරේ දී මෙන් නොව, වෙළෙඳ බැංකුවල ණය දීමේ කාර්යයන් බොහෝ සෙයින් ම පෞද්ගලික අංශයට යොමු වූ අතර ඒ සමග ම රජයට කෙටි කාලීන ණය දීම පිරිහුණි. පෞද්ගලික අංශයට දෙන ණය ප්‍රසාරණය වීම 1968 දී උච්චස්ථානයට ම එළැඹියේය. මෙකී කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් වෙළෙඳ බැංකුවල ද්‍රවශීලතාවය පහත වැටුණ ද, මුළු තැන්පතුවලට ඇති ද්‍රව්‍යශීල වත්කම්වල ( සාමාන්‍ය මාසික අනුපාතය ) සියයට 38.3 ක් වන සාමාන්‍ය මාසික අනුපාතයෙන් පිළිබිඹු වන පරිදි, ද්‍රවශීලතා තත්ත්වය සෑහීමකට පත් විය හැකි තරම් උසස් මට්ටමකින් පවත්වා ගන්නා ලදී.

**2. (ඇ) ශාඛා ව්‍යාප්තිය**

**1963–68 කාල සීමාව සඳහා ලාංකික හා විදේශීය බැංකු අතර, බැංකු කාර්යාල සහ බැංකු වෙත ඇති තැන්පතු, බෙදීගිය අයුරු II (ඇ) 7 වැනි සංඛ්‍යා සටහනේ දැක්වෙයි.**

## සංඛ්‍යා සටහන II (ඇ) 7

## 1963–1968, බැංකු කාර්යාල සහ තැන්පතු බෙදී ගිය අන්දම

| වර්ෂය | එකතුව | | | ලාංකික බැංකු | | | බ්‍රිතාන්‍ය බැංකු | | | ඉන්දියානු සහ පකිස්ථානු බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | |
| | | ප්‍රමාණය රු. දශ ලක්ෂ | % | | ප්‍රමාණය රු. දශ ලක්ෂ | % | | ප්‍රමාණය රු. දශ ලක්ෂ | % | | ප්‍රමාණය රු. දශ ලක්ෂ | % |
| 1963 | 83 | 1,301 | 100 | 67 | 801 | 61 | 12 | 412 | 32 | 4 | 88 | 7 |
| 1964 | 88 | 1,447 | 100 | 72 | 943 | 65 | 12 | 415 | 29 | 4 | 90 | 6 |
| 1965 | 97 | 1,546 | 100 | 81 | 1,023 | 66 | 12 | 431 | 28 | 4 | 92 | 6 |
| 1966 | 105 | 1,502 | 100 | 89 | 1,003 | 67 | 12 | 419 | 28 | 4 | 80 | 5 |
| 1967 | 133 | 1,637 | 100 | 117 | 1,157 | 71 | 12 | 404 | 25 | 4 | 76 | 5 |
| 1968 | 141 | 1,808 | 100 | 125 | 1,329 | 73 | 12 | 409 | 23 | 4 | 71 | 4 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සමාලෝචනයට ලක්ව ඇති වසර තුළදී, දිවයිනේ මුළු ශාඛා කාර්යාල ගණන, අටකින් වැඩි වූ අතර, වසර අවසානයේ දී මුළු ශාඛා සංඛ්‍යාව එකසිය හතළිස් එකක් විය. අලුතෙන් විවෘතකළ කාර්යාල අටෙන්, හතක්ම මහජන බැංකුව විසින් ආරම්භ කරණු ලැබිණි. ලංකා බැංකුව අළුතෙන් ආරම්භ කර ඇත්තේ එක කාර්යාලයක් පමණි. අළුත් කාර්යාල, මඩකලපුව, වෙන්නප්පුව, වැලිගම, බොරැල්ල, වේයන්ගොඩ, රත්මලාන, රුවන්වැල්ල සහ නුගේගොඩ යන තන්හි පිහිටුවන ලදී.

1968 තුළදී අරඹන ලද ශාඛාවන්ගේ ගණන ඉකුත් වසරේදීට වඩා අඩුවූමුත්, බැංකු වෙත ඇති තැන්පතු සැහෙන ප්‍රමාණයකින් වැඩිවිය. බැංකු තැන්පතු වැඩිවීම රුපියල් ලක්ෂ 171 ක් වූ අතර, එය මුළුමණින්ම වාගේ ලාංකික බැංකු වලට අයත් විය. වෙළෙඳ බැංකු වෙතැති මුළු තැන්පතු වල ලාංකික බැංකු සතු කොටස, 1967 අවසානයේ දී පැවති සියයට 71 සිට 1968 අවසානයේදී සියයට 73 දක්වා වැඩිවිය. ලංකා බැංකුව සහ මහජන බැංකුව හැරුණු විට, වෙනත් බැංකු සමග අළුත් ගිණුම් ඇරඹීම සම්බන්ධයෙන්, 1961 මුදල් පණත මගින් පැණවූ සීමා කිරීම්, සමාලෝචනයට භාජන වූ වර්ෂය මුළුල්ලේම තවදුරටත් ක්‍රියාත්මකව පැවතිණි. අනෙකුත් බැංකු සමග ගිණුම් ඇරඹීම අනුමත කිරීමට, මුදල් ඇමතිවරයාට හැකිවනු වස්, අගෝස්තු මාසයේ දී පාර්ලිමේන්තුව විසින් සංශෝධන පණතක් සම්මත කර ගන්නා ලද මුත්, වර්ෂය අවසානය තෙක් වෙනත් බැංකුවකට මෙම කාර්යය සඳහා අවසර දී නැත.*

### 2.(ඇ) බැංකු වගකීම් ව්‍යුහය

1957–1968 දක්වා වූ කාලසීමාව සඳහා වෙළෙඳ බැංකු වල ඒකාබද්ධ වත්කම් හා වගකීම් බෙදීගිය අයුරු සම්පිණ්ඩනය කොට (ඇ) 8 සංඛ්‍යා සටහනෙහි දක්වෙයි.

1968 දී වෙළෙඳ බැංකු වල මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 219.8 කින් වැඩිවිය. ඉකුත් වසරේදී වැඩි වූ සියයට 15 හේ සංඛ්‍යාව අනුව බලන කල මෙහි සියයට 10.3 ක වැඩිවීමක් පිළිබිඹු කෙරෙයි. මෙම වැඩිවීම ඇති වූයේ වගකීම් අංශයෙහිය. ප්‍රධාන වශයෙන්ම තැන්පතු වැඩිවීමෙහි ය. වසර තුළදී වෙළෙඳ බැංකු වල මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 171.4 කින් ඉහළ ගියේය. වෙළෙඳ බැංකු විසින් මහ බැංකුවෙන් ගත් ණය ප්‍රමාණය, රුපියල් දශ ලක්ෂ 12.8 කින් අඩුවිය. දේශීය අන්තර් බැංකු ණය ද රුපියල් දශ ලක්ෂ 4.4 කින් පිරිහුණි. කෙසේ වුවද විදේශීය බැංකු වෙත වූ වගකීම් රුපියල් දශලක්ෂ 7.1 කින් ඉහළ නැගිණි. වෙළෙඳ බැංකු වල ප්‍රාග්ධනය හා සංචිත, රුපියල් දශලක්ෂ 6.1 කින් වැඩිවුන අතර අනෙකුත් වගකීම් ද රුපියල් දශලක්ෂ 52.4 කින් ඉහළ ගියේය.

* චාර්ටඩ් සහ ඊස්ටන් යන බැංකු' දෙක, මෙම කාර්‍ය්‍ය සඳහා අනුමත කර ඇති බැව් 1969 පෙබරවාරි 28 දින ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇත.

## සංඛ්‍යා සටහන II (ඇ) 8

### වෙළඳ බැංකුවල වත්කම් හා වගකීම් බෙදී ගිය අයුරු

( මාසික සංඛ්‍යාවල සාමාන්‍යය )

රුපියල් දශ ලක්ෂ

| | 1957 | 1958 | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 | කාලච්ඡේදය අවසානයේදී 1967 දෙසැ. | කාලච්ඡේදය අවසානයේදී 1968 දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අතැති මුදල් හා මහ බැංකුව වෙතැති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා ඇතුළුව) ... | 139 | 119 | 116 | 132 | 148 | 186 | 164 | 182 | 224 | 233 | 218 | 247 | 229 | 248 |
| විදේශීය ශේෂ ... ... ... | 72 | 50 | 52 | 58 | 54 | 55 | 44 | 49 | 55 | 62 | 57 | 72 | 66 | 77 |
| භාණ්ඩාගාර බිල්පත් ... ... ... | 34 | 16 | 24 | 28 | 51 | 89 | 128 | 73 | 89 | 124 | 80 | 102 | 109 | 111 |
| වට්ටම් කළ බිල්පත් ... ... ... | 100 | 116 | 119 | 115 | 122 | 136 | 114 | 126 | 173 | 175 | 198 | 252 | 289 | 225 |
| මුළු ද්‍රවශීල වත්කම් ... ... ... | 345 | 301 | 311 | 333 | 375 | 466 | 450 | 430 | 541 | 594 | 553 | 673 | 693 | 661 |
| මුළු ආයෝජන (1) ... ... ... | 308 | 296 | 285 | 284 | 290 | 303 | 313 | 330 | 329 | 330 | 300 | 278 | 270 | 278 |
| මුළු ණය හා අයිරාවන් ... ... ... | 340 | 363 | 395 | 430 | 435 | 477 | 495 | 633 | 669 | 682 | 809 | 1000 | 864 | 1,098 |
| ඉල්ලුම් තැන්පතු (2) ... ... ... | 721 | 661 | 655 | 657 | 677 | 829 | 789 | 853 | 917 | 949 | 914 | 955 | 936 | 979 |
| කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ... ... | 240 | 263 | 300 | 340 | 359 | 380 | 460 | 535 | 572 | 631 | 649 | 798 | 701 | 826 |
| මුළු තැන්පතු ... ... ... | 965 | 926 | 955 | 998 | 1,036 | 1,209 | 1,250 | 1,389 | 1,490 | 1,580 | 1,564 | 1,755 | 1,637 | 1,808 |
| අනුපාතය ... ... ... | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % |
| ඉල්ලුම් තැන්පතුවලට වූ මුදල් ... ... | 19.3 | 18.0 | 17.7 | 20.1 | 21.9 | 22.4 | 20.8 | 21.3 | 24.4 | 24.5 | 23.8 | 25.9 | 24.5 | 25.3 |
| මුළු තැන්පතුවලට වූ මුදල් ... ... | 14.4 | 12.9 | 12.1 | 13.2 | 14.3 | 15.4 | 13.1 | 13.1 | 15.0 | 14.7 | 13.9 | 14.1 | 14.0 | 13.7 |
| මුළු තැන්පතුවලට වූ විදේශීය ශේෂ ... ... | 7.4 | 5.4 | 5.4 | 5.8 | 5.2 | 4.5 | 3.5 | 3.5 | 3.7 | 3.9 | 3.6 | 4.1 | 4.0 | 4.3 |
| මුළු තැන්පතුවලට වූ භාණ්ඩාගාර බිල්පත් ... | 3.5 | 1.7 | 2.5 | 2.8 | 4.9 | 7.4 | 10.2 | 5.3 | 6.0 | 7.8 | 5.1 | 5.8 | 6.7 | 6.1 |
| මුළු තැන්පතුවලට වූ වට්ටම් කළ වාණිජ බිල්පත් ... | 10.3 | 12.5 | 12.5 | 11.5 | 11.8 | 11.2 | 9.1 | 9.1 | 11.6 | 11.1 | 12.7 | 14.4 | 17.6 | 12.4 |
| ඉල්ලුම් තැන්පතුවලට වූ ද්‍රවශීල වත්කම් ... | 47.9 | 45.5 | 47.5 | 50.7 | 55.4 | 56.2 | 57.0 | 50.4 | 59.0 | 62.6 | 60.5 | 70.5 | 74.0 | 67.5 |
| මුළු තැන්පතුවලට වූ ද්‍රවශීල වත්කම් ... ... | 35.8 | 32.5 | 32.6 | 33.4 | 36.2 | 38.5 | 36.0 | 31.0 | 36.3 | 37.6 | 35.4 | 38.3 | 42.3 | 36.6 |
| මුළු තැන්පතුවලට වූ ආයෝජන ... ... | 31.7 | 32.0 | 29.8 | 28.5 | 28.0 | 25.1 | 25.0 | 23.8 | 22.1 | 20.9 | 19.2 | 15.8 | 16.5 | 15.4 |
| මුළු තැන්පතුවලට වූ ණය හා අයිරාවන්... ... | 35.2 | 39.2 | 41.4 | 43.1 | 42.0 | 39.4 | 39.6 | 45.6 | 44.9 | 43.2 | 51.7 | 57.0 | 52.8 | 60.7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(1) රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත්, පෞද්ගලික සුරැකුම්පත් සහ මහ බැංකු නිකුතු.

(2) දේශීය අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නැත.

## සංඛ්‍යා සටහන II (ඈ) 9.

## 1965-68 බැංකු සම්පත් වාර්ෂිකව වෙනස් වූ අයුරු සහ ඒවා යෙදවූ අයුරු

රුපියල් දශ ලක්ෂ

| | 1965 | 1966* | 1967* | 1968 |
|---|---|---|---|---|
| **මුදල් ලැබුණු මාර්ගය** | | | | |
| **1. රාජ්‍ය අංශය ... ... ...** | **11.8** | **62.7** | **62.3** | **150.9** |
| බැංකු වෙතැති රජයේ ණයපත් අඩුවීම ... | — | 14.7 | 64.3 | — |
| තැන්පතු වල වැඩිවීම ... ... | 11.8 | — | — | 25.9 |
| රජයට දෙනු ලැබූ කෙටි කාලීන ණය අඩුවීම ... | — | 48.0 | — | 125.0 |
| **2. මහ බැංකුවෙන් ණය ගැනීම වැඩිවීම ...** | — | **36.4** | **59.3** | — |
| **3. දේශීය පෞද්ගලික අංශය ... ...** | **148.8** | **34.2** | **242.0** | **201.4** |
| තැන්පතු වල වැඩිවීම ... ... | 85.0 | — | 153.4 | 142.9 |
| සංචිත හා ගෙවන ලද ප්‍රාග්ධන ආදිය වැඩිවීම ... | 9.1 | 16.0 | 7.3 | 6.1 |
| අනෙකුත් වගකීම් වැඩිවීම ... ... | 54.7 | 18.2 | 81.3 | 52.4 |
| **4. විදේශීය අංශය ... ... ...** | **11.5** | **0.7** | **1.0** | **7.3** |
| ණය ගැනීම් වැඩිවීම ... ... | 1.2 | 0.7 | — | 7.1 |
| තැන්පතු වල වැඩිවීම ... ... | 1.3 | — | 1.0 | 0.2 |
| විදේශීය ශේෂ අඩුවීම ... ... | 9.0 | — | — | — |
| **5. දේශීය මුදල් ශීර්ෂ අඩුවීම ... ...** | — | **40.1** | — | — |
| **සම්පත්වල මුළු වැඩිවීම ... ...** | **172.1** | **174.1** | **366.6** | **359.6** |
| **මුදල් යෙදවූ අයුරු** | | | | |
| **1. රාජ්‍ය අංශය ... ... ...** | **92.3** | **28.1** | **157.7** | **10.1** |
| බැංකු වෙතැති රජයේ ණයපත් වැඩිවීම ... | 32.8 | — | — | 10.1 |
| රජයට දෙනු ලැබූ කෙටි කාලීන ණය වැඩිවීම ... | 59.5 | — | 139.5 | — |
| තැන්පතු අස්කර ගැනීම ... ... | — | 28.1 | 18.2 | — |
| **2. මහ බැංකුවෙන් ණය ගැනීම අඩුවීම ... ...** | **12.8** | — | — | **12.8** |
| **3. දේශීය පෞද්ගලික අංශය ... ...** | **47.9** | **129.3** | **164.5** | **308.6** |
| අත්තිකාරම් වැඩිවීම ... ... ... | 4.2 | 92.1 | 104.8 | 291.0 |
| අනෙකුත් වත්කම් වැඩිවීම ... ... | 43.7 | 22.1 | 57.9 | 17.6 |
| පෞද්ගලික සුරැකුම්පත් වැඩිවීම ... ... | — | — | 1.8 | — |
| තැන්පතු අස්කර ගැනීම ... ... | — | 15.1 | — | — |
| **4. විදේශීය අංශය ... ... ...** | — | **17.0** | **7.3** | **10.6** |
| ණය ගැනීම් අඩුවීම ... ... ... | — | — | 0.9 | — |
| තැන්පතු අස්කර ගැනීම ... ... | — | 1.6 | — | — |
| විදේශීය ශේෂ වැඩිවීම ... ... | — | 15.4 | 6.4 | 10.6 |
| **5. දේශීය මුදල් ශීර්ෂ වැඩිවීම ... ...** | **18.7** | — | **36.2** | **19.5** |
| **යෙදවූ සම්පත්වල වැඩිවීම ... ...** | **171.7** | **174.4** | **365.7** | **361.6** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

*ඉකුත් වාර්ෂික වාර්තාවල සංඛ්‍යා සහ මෙම සංඛ්‍යා අතර ඇති වෙනස්කම්වලට හේතුව සංඛ්‍යා සංශෝධනයයි.

වෙළෙඳ බැංකුවල මූල්‍ය සම්පත් වැඩිවීම ප්‍රධාන වශයෙන් ම තැන්පතු වැඩිවීම හේතු කොට සිදුවූයෙන්, ඔවුන් මහ බැංකුවෙන් කරන ණය ගැනීම් අඩු කර ලිය හැකි තත්වයක සිටීම වැදගත් කරුණකි. තැන්පතු වැඩිවී ඇත්තේ, බොහෝ සෙයින්ම, පෞද්ගලික අංශයට අයත් කාලීන හා ඉතිරි කිරීම් තැන්පතුවල ස්වරූපයෙන් බව ද සැලකිය යුතු ය. මුළු තැන්පතු ප්‍රමාණයේ පෙණුනු රුපි. දශ ලක්ෂ 171.4 ක වැඩිවීමෙන් රුපියල් දශ ලක්ෂ 124.6 ක තරම් ප්‍රමාණයක් මෙකී තැන්පතුවලින් සමන්විත වෙයි. රජය වෙත වූ තැන්පතු මුළුමනින් ම පාහේ ඉල්ලුම් තැන්පතු වල ස්වරූපයක් ගත් අතර, ඒවා රුපි. දශ ලක්ෂ 25.9 කින් වැඩි විය.

### 2 (ඈ) බැංකු වත්කම් ව්‍යුහය

1968 දී වෙළෙඳ බැංකු වත්කම් වැඩිවීමත් සමගම, වත්කම් ව්‍යුහයේ සැකැස්ම අඩු ද්‍රවශීල වත්කම්වලට බරව වෙනස් වීය. මුළු වත්කම් වැඩිවීමේ ප්‍රමාණයට සම වන තරමට ම ණය

සහ අයිරා වැඩි විණ. වසර තුළ දී වෙළෙඳ බැංකුවල මුදල් තත්වයෙහි ද වර්ධනයක් ඇති විය. බැංකු වෙතැති මුළු මුදල ( ව්‍යවස්ථාපිත සංචිත ඇතුළුව ) රුපි. දශ ලක්ෂ 19.5 කින් ඉහළ නැඟුණු අතර, ඉල්ලුම් තැන්පතු වෙනුවෙන් ඇති මුදල් අනුපාතය 1967 අවසානයේ දී පැවති සියයට 24.5 ප්‍රමාණය 1968 අවසානයේ දී සියයට 25.3 දක්වා වැඩි විණ. එසේ වුවද, වෙනත් ද්‍රවශීලතා වත්කම් විශාල ප්‍රමාණයකින් පහත වැටුණි. බැංකු වෙත වූ, රජයේ ආනයන බිල්පත් රුපියල් දශ ලක්ෂ 125.0 කින් පහත වැටීමෙන් පෞද්ගලික අංශයේ සහ රජයේ සංස්ථාවල ආනයන බිල්පත් පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 18.4 කින් හා රුපියල් දශ ලක්ෂ 15.4 කින් ඉහළ යෑමේත්, ප්‍රතිඵලයක් වශයෙන් ආනයන බිල්පත් අගය රුපියල් දශ ලක්ෂ 91.2 කින් පහත වැටුණි. අපනයන බිල්පත් අගය රුපියල් දශ ලක්ෂ 26.8 කින් ඉහළ ගියේ ය.

ද්‍රවශීල වත්කම් පහත වැටීම නිසා, මුළු තැන්පතු වෙනුවෙන් ඇති ද්‍රවශීල වත්කම් අනුපාතය 1967 අවසානයේ දී පැවති සියයට 42.3 සිට, 1968 අවසානයේ දී සියයට 36.6 දක්වා පහළ වැටුණි. එහෙත් වර්ෂයේ වැඩි කාලයක් තුළම ආනයන බිල්පත් උසස් මට්ටමක පැවති හෙයින් හා මෙම පිරිහීම ඇති වූයේ අවසාන මාස හතරේ දී පමණක් නිසා මුළු තැන්පතු ප්‍රමාණයට ඇති ද්‍රව්‍යශීල වත්කම්වල සාමාන්‍ය අනුපාතය 1967 දීට වඩා වැඩි විය. ණය සහ අයිරාවන් මුළු තැන්පතුවල අනුපාතයක් වශයෙන් ගතහොත් මාසික සාමාන්‍යයෙහි මෙන්ම, වර්ෂාවසාන තත්ත්වයන්හි ද වර්ධනයක් දක්විය. 1968 ට අවසානයේ දී එය සියයට 60.7 ක්ව පැවති අතර, එය මේතාක් වර්ෂාවසාන තත්වයෙහි වාර්තා වූ ඉහළ ම සංඛ්‍යාව විය.

## 2. (ඉ) අරමුදල් මූලයන් සහ ඒවායේ උපයෝගීකරණය

ඉකුත් වර්ෂයේ දී මෙන් නොව, 1968 දී, රාජ්‍ය අංශය, වෙළෙඳ බැංකු සමග ඇතිකර ගත් ගනුදෙණු වලින්, පෞද්ගලික අංශයේ තැන්පතු වැඩිවීම පදනම් කොට ගෙන සිදු කළ හැකිව තිබුණු ණය ප්‍රසාරණය ද ඉක්මවා යන පරිද්දෙන් පෞද්ගලික අංශය සඳහා, ණය සැපයීම පිණිස, සැහෙන ප්‍රමාණයක සම්පත් මුදහරිනු ලැබීය. මේ අනුව 1967 දී පෞද්ගලික අංශයේ තැන්පතු වලින් ලැබුණු සම්පත් රජයට දෙන කෙටි කාලීන ණය මුදල් ප්‍රමාණය වැඩි කිරීම සඳහා යොදා ගත් අතර, 1968 දී පෞද්ගලික අංශයේ තැන්පතු වැඩිවීම නිසා මෙන්ම වෙළෙඳ බැංකු වෙත වූ රජයේ ණය ගැති බව අඩු වීමත් හේතු කොට ගෙන, ඉහළ නැඟුණු බැංකු සම්පත් වලින් විශාල කොටසක්ම ප්‍රයෝජනයට ගනු ලැබුයේ, පෞද්ගලික අංශය විසිනි. තවද ඉකුත් වසරේ දී මෙන් නොව, වෙළෙඳ බැංකු විසින් මේ වසරේ දී මහ බැංකුවේ සම්පත් වලින් ණය ගනු නොලැබිණි. ඇත්ත වශයෙන්ම, 1968 දී වැඩි වූ සිය සම්පත් වලින්, කොටසක් ප්‍රයෝජනයට ගෙන මහ බැංකුවෙන් කළ ණය ගැනීම් අඩු කර ගැනීමට, බැංකුවලට හැකි විය.

රජයට දෙන කෙටි කාලීන ණය අඩු වීම නිසා මුද හැරුණු බැංකු සම්පත් රුපියල් දශ ලක්ෂ 125 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ දී බොහෝ ලෙස සමුච්චිත වූ රජයේ ආනයන බිල්පත් ණය ආපසු ගෙවීම එයින් පෙන්නුම් කරයි. තවද, රජයේ තැන්පතු වැඩිවීම හේතු කොට ගෙන, 1968 දී රුපියල් දශ ලක්ෂ 25.9 ක සම්පත් ප්‍රමාණයක් වෙළෙඳ බැංකු වෙත හිමි විය. 1965 ට පසු ව වෙළෙඳ බැංකු වෙතැති රජයේ තැන්පතු වාර්ෂිකව වැඩි වූ මුල් වතාව මෙය වෙයි. රජයේ හා රජය ඇප වූ සුරකුම් පත් සහ භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශ ලක්ෂ 10.1 කින් වැඩිවීම, 1968 දී රාජ්‍ය අංශය සඳහා වූ එකම වෙළෙඳ බැංකු සම්පත් උපයෝගීකරණය පෙන්නුම් කරයි.

දේශීය පෞද්ගලික අංශය විසින් 1968 දී ලබා දුන් නව සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 201.4 ක් අතර, වූ ඒවාප්‍රධාන වශයෙන් ම වෙළෙඳ බැංකු වෙත තැන්පතු වල ස්වරූපයක් ගත්තේය මෙම තැන්පතු වල වැඩි වීම රුපියල් දශ ලක්ෂ 142.9 ක් වූ අතර, ඉකුත් වසරට වඩා අඩු වූයේ ඉතා සුළු වශයෙනි. වෙළෙඳ බැංකු වල ප්‍රාග්ධනයෙහි හා සංචිත වල රුපියල් දශ ලක්ෂ 6.1 ක වැඩිවීමක් දක්නට ලැබුණු අතර, වෙළෙඳ බැංකු වල අනෙකුත් වගකීම් හි රුපියල් දශ ලක්ෂ 52.4 ක තවත් වැඩිදුර වැඩිවීමක් ද ඇතිවිණි.

1968 දී පෞද්ගලික අංශය විසින් මුළු වශයෙන් ප්‍රයෝජනයට ගත් වෙළෙඳ බැංකු සම්පත් ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 308.6 ක්ව පැවැති අතර මෙය ඉකුත් වසරවලදීට වඩා විශාලය. බැංකු සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රධාන වශයෙන් ම අත්තිකාරම් වැඩිවීමක ස්වරූපයක් ගත් අතර එය රුපි. දශ ලක්ෂ 291 ක් විය. මෙය 1967 දී වාර්තා වූ සංඛ්‍යාවන්ට වඩා දෙගුණයකින් ද, 1966 දී වාර්තා වූ සංඛ්‍යාවන්ට වඩා තෙගුණයකින් ද වැඩිය.

වෙළෙඳ බැංකු සම්පත් කෙරෙහි වූ, විදේශීය අංශයෙන් ලැබුණු ප්‍රමාණය රු. දශ ලක්ෂ 7.3 ක් විය. එය මුළු මනින් ම පාහේ ඇති වූයේ එතෙර නියෝජිත බැංකු හා ශාඛා බැංකු වෙනුවෙන් වූ

මෙරට බැංකුවල වගකීම් වැඩිවීමක් හේතු කොට ගෙනයි. කෙසේ හෝ සම්පත්වල මෙම වැඩිවීම මෙරට බැංකුවල විදේශීය ශේෂයන් රුපි. දශ ලක්ෂ 10.6 ක වැඩිවීම නිසා, පමණටත් වැඩියෙන් කැපී ගියේ ය.

වෙළෙඳ බැංකුවල වැඩි වූ සම්පත්වලින් සුළු කොටසක් (රුපි. දශ ලක්ෂ 19.5 ක්) තමන් වෙතැති දේශීය මුදල් ශීර්ෂයන් හි වැඩිවීමකින් උකහාගන්නා ලදී. මෙයට හේතු වූයේ බැංකු වෙතැති මුදල් ප්‍රමාණයන්හි වර්ධනයකි.

## 2 (ඊ) පෞද්ගලික අංශය සඳහා වූ බැංකු ණය

1967 අවසානයත්, 1968 අවසානයත් අතර කාල සීමාව තුළදී, වෙළෙඳ බැංකු විසින් පෞද්ගලික අංශයට දී ඇති ණය ප්‍රමාණයෙන් බේරුම් නොකරන ලද ණය මුදල රුපි. දශ ලක්ෂ 291.0 කින් වැඩි විය. මෙම වැඩිවීම පසුගිය වසරේදීට වඩා දෙගුණයකින් අධික වූ අතර, මේතාක් වාර්තා ගතවූ විශාලතම වැඩිවීම ද මෙය වේ. මෙම වැඩිවීම වසරේ පළමු පස්මාසය තුළ දී විශේෂයෙන් ම විශාල විය. කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ වූ ණය රජයේ සංස්ථා සඳහා දී ඇති අත්තිකාරම් සමහරකුත්, ආපසුගෙවීම් හේතු කොට ගෙන බේරුම් කළ යුතු මුදල් ප්‍රමාණය ජූනි මාසයේ දී මද වශයෙන් පහත වැටුණි. කෘෂිකාර්මික ණය හා සහතික මිල ක්‍රමය යටතේ වී මිලට ගැනීම සඳහා සමූපකාර සමිතිවලට දෙන ලද අත්තිකාරම් මුදල් ආපසු ගෙවීම නිසා ජූලි මාසයේ දී බේරුම් කළ යුතු ණය මුදල විශාල ප්‍රමාණයකින් අඩු විය. අගෝස්තුවේ දී තවදුරටත් මෙම ණය ගණයන්හි පහත වැටීමක්, දක්වුන මුත්, රජයේ සංස්ථා සඳහා දෙන ලද අත්තිකාරම්වල වැඩිවීමක් ප්‍රධාන කොට ගෙන මේ මාසයේ දී පෞද්ගලික අංශයට දෙන මුළු ණය ප්‍රමාණය සුළු ලෙසින් ඉහළ නැඟුණි. වසරේ ඉතිරි කාලය තුළ දී සාමාන්‍ය වශයෙන් ණය ප්‍රසාරණයක් දක්නට ලැබුණි. මහ කන්නයේ අළුත් වගාව ඇරඹීමත් සමග ම කෘෂිකාර්මික ණය ඉහළ නැගුණි. අළුත් අත්තිකාරම් නිසාත්, සංස්ථාවල කෙටි කාලීන ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා මුදල් යෙදවීමේ කාර්යය රජයෙන් වෙළෙඳ බැංකු වෙත පැවරීම නිසාත්, සංස්ථා සඳහා දෙන ණය ප්‍රමාණය වැඩි විය. ණය ලබා ගන්නා පෞද්ගලික අංශයේ වෙනත් අයට ද ප්‍රධාන වශයෙන්ම, කාර්මික හා වෙළෙඳ කටයුතු සඳහා ණය ලබා ගන්නා අයට දෙන ලද ණය ප්‍රමාණය ද වැඩි විය. වසරේ අවසාන මාස තුන තුළ දී පෞද්ගලික අංශය සඳහා දෙන ණය සීමා කිරීමක් ක්‍රියාත්මකව පැවතිණි. මෙම කාල සීමාව තුළ දී ඇත්ත වශයෙන් ම, ණය ප්‍රමාණය වැඩි වූයේ පැනවූ සීමාවන් ඇතුළත ය.

1967 අවසානයත්, 1968 අවසානයත් අතර කාල සීමාව තුළ දී බේරුම් කළ යුතුව තුබූ ණය මුදලෙහි වෙනස්කම් II (ඇ) 10 සංඛ්‍යා සටහනින් දක්වෙයි.

### සංඛ්‍යා සටහන II (ඇ) 10

### පෞද්ගලික අංශයට[1] දෙන ලද වෙළඳ බැංකු අත්තිකාරම්

1967 දෙසැම්බර් — 1968 දෙසැම්බර්

රුපියල් දශ ලක්ෂ

| | ලාංකික බැංකු | | | විදේශීය බැංකු | | | සියලුම බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1967 දෙසැ. | 1968 දෙසැ. | වෙනස | 1967 දෙසැ. | 1968 දෙසැ. | වෙනස | 1967 දෙසැ. | 1968 දෙසැ. | වෙනස |
| (අ) එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂයන්[2] ... | 55.5 | 51.3 | — 4.7 | 1.4 | 1.2 | — 0.2 | 56.9 | 52.5 | — 4.4 |
| (ආ) මෙරට බිල්පත් ... | — | — | — | — | 0.1 | + 0.1 | — | 0.1 | + 0.1 |
| (ඇ) ආනයන බිල්පත් ... | 32.9 | 60.0 | + 27.1 | 22.7 | 29.4 | + 6.7 | 55.6 | 89.4 | + 33.8 |
| (ඈ) අපනයන බිල්පත් ... | 10.3 | 18.7 | + 8.4 | 43.1 | 61.5 | +18.4 | 53.4 | 80.2 | + 26.8 |
| (ඉ) අයිරාවන්... ... | 188.4 | 227.7 | + 39.3 | 230.5 | 270.0 | +39.5 | 418.9 | 497.8 | + 78.9 |
| (ඊ) ණය ... ... | 385.8 | 538.6 | +152.8 | 59.0 | 62.0 | + 3.0 | 444.8 | 600.7 | +155.9 |
| එකතුව... ... | 672.9 | 896.3 | +223.4 | 356.7 | 424.2 | +67.5 | 1,029.6 | 1,320.6 | +291.0 |

1. රජයේ සමායතන ද ඇතුළුව.

2. අය ලබා ගැනීම සඳහා යැවුනු චෙක්පත් වැනි අන්තර් බැංකු ණය, මේ ගණයෙහි අඩංගු වී ඇත්තේ ඉතා සුළු වශයෙනි. බැංකු විසින් සහතික මිල ක්‍රමය යටතේ, ආහාර ද්‍රව්‍යයන් මිල දී ගැනීම සඳහා සමූපකාර ආයතනයන්ට දෙනු ලැබූ ඉතා කෙටි කාලීන අත්තිකාරම්ය මෙහි බෙහෙවින්ම ඇත්තේ.

වසර තුළදී අය කෙරීගෙන ගිය මුදල් ශීර්ෂයන් රුපියල් දශලක්ෂ 4.4 කින් පහත වැටුණි. සහතිකමිල ක්‍රමය යටතේ වී මිලට ගැනීම වැඩිවීම නිසා වසරේ ජූනි මාසය තුළදී, භාණ්ඩකුවිතාන්සි අත්තිකාරම් උච්චස්ථානයකට එළැඹියේය. බේරුම් කලයුතු අත්තිකාරම් සංඛ්‍යාව වර්ෂයේ අනෙකුත් කාලසීමාව තුළදී පහත වැටුණු නමුත්, දෙසැම්බරය අගදී රුපියල් දශලක්ෂ 7.2 ක් වූ අතර ඉකුත් වර්ෂයේ සංඛ්‍යාව අභිභවා ගියේය. අය කෙරීගෙන ගිය වෙනත් මුදල් ශීර්ෂයන් 1968 දී රුපියල් දශලක්ෂ 11.7 කින් පහළ වැටුණි.

අපනයන බිල්පත් දැරීම්වල රුපියල් දශලක්ෂ 26.8 ක වැඩිවීමක් ඇති වූ අතර, එය බොහෝ සෙයින්ම පෙනුනේ විදේශීය බැංකු කෙරෙහිය. ක්‍රියාත්මක වූ ණය සීමාවන්ගෙන් අපනයන බිල්පත් බැහැර කරන ලදී.

බැංකු වෙත තුබුණු පෞද්ගලික අංශයේ ආනයන බිල්පත් වල වටිනාකම 1968 දී රුපියල් දශලක්ෂ 33.8 කින් ඉහළ ගියේය. මෙම වැඩිවීමෙන් රුපියල් දශලක්ෂ 15.4 කින් පිළිබිඹු වනුයේ රජයේ සංස්ථාවල ආනයන බිල්පත් වල වැඩිවීමකි. බැංකු වෙත වූ ආනයන බිල්පත් සංඛ්‍යාව වැඩිවූයේ ප්‍රධාන වශයෙන් වසරේ අවසාන භාගය තුළදී ය.

ණය සහ අයිරා වැඩිවීම පෞද්ගලික අංශය වෙත වූ වෙළඳ බැංකුවල අත්තිකාරම් ප්‍රසාරණයෙහි ලා ඉතා වැදගත් අංගයක් විය. රුපියල් දශ ලක්ෂ 155.9 ක ණය ප්‍රසාරණය මුළුමනින්ම පාහේ සිදුවූයේ ලාංකික බැංකුවලය. ලාංකික හා විදේශීය බැංකුවල අයිරාවන් බොහෝදුරට සම ප්‍රමාණයන්ගෙන් වැඩිවූ අතර, එය රුපි. දශලක්ෂ 78.9 ක වැඩිවීමකි. ණය මුදල්වල රුපි. දශලක්ෂ 61.1 ක වැඩිවීමක්ද, අයිරාවන්හි රුපි. දශලක්ෂ 14.1 ක වැඩිවීමක් ද ඇතිවූයේ රජයේ සංස්ථාවන් හේතු කොට ගෙනය. සමුපකාර ආයතන සඳහා දුන් ණය, රුපි. දශලක්ෂ 16.8 කින් වැඩිවිය. පෞද්ගලික අංශයේ වෙනත් ණය ලබාගන්නවුනට දෙන ලද ණය රුපි. දශලක්ෂ 77.9 කින් ද අයිරාවන් රුපි. දශලක්ෂ 70.3 කින් ද ඉහල නැංගේය.

අරමුණු[1] හා කල් පිරීම අනුව බැංකු අත්තිකාරම් වර්ගීකරණයක් **II** (ඇ) 11 සංඛ්‍යා සටහනේ දක්වෙයි. මෙම සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කර ඇති සංඛ්‍යා තොරතුරු, තැන්පතු හා අත්තිකාරම් පිළිබඳ, මහ බැංකු සමීක්ෂණයෙන් සකසා ගෙන ඇති අතර,, ඒවා අපනයන බිල්පත්, ආනයන බිල්පත්, ණය සහ අයිරාවල සවරූපයෙන්, පෞද්ගලික අංශයට (රජයේ සංස්ථාවන් ඇතුළුව) දෙන ලද අත්තිකාරම්වලට අදළ වෙයි.

වෙළඳ බැංකු අත්තිකාරම්වල විශාලතම වැඩිවීම ඇතිවූයේ වෙළඳ අරමුණු සඳහාය. මෙම ගණයේ අත්තිකාරම් වැඩිවීම වසර තුලදී රුපි. දශලක්ෂ 144.4 ක් වූ අතර, මෙම ප්‍රමාණය අපනයන වෙළඳාම සහ ආනයන වෙළඳාම අතර බොහෝ දුරට සම සමව බෙදී ගියේය. තොග සහ සිල්ලර වෙළඳාම රුපි. දශලක්ෂ 17.1 කින් වැඩි වූ අතර, වෙනත් වෙළඳ කාර්යයන් සඳහා දෙන ලද ණය අත්තිකාරම් ප්‍රමාණය, තරමක් විශාල ප්‍රමාණයකින් පිරිහීම නිසා එය කැපී ගියේය.

කාර්මික අරමුණු සඳහා වූ අත්තිකාරම් රුපි. දශලක්ෂ 103.7 කින් වැඩිවිය. නිෂ්පාදන ආයතන සඳහා වූ අත්තිකාරම් රුපි. දශලක්ෂ 81.9 කින් වැඩි වී ඇති අතර, මින් තුනෙන් පංගුවක් පමණ යොදවා ඇත්තේ රජයේ කාර්මික සංස්ථාවන් සඳහාය. තේ, රබර්, සහ පොල් නිෂ්පාදිතයන් පිළියෙල කිරීම සඳහා වූ අත්තිකාරම් රුපි. දශලක්ෂ 12.4 කින් ඉහළ ගිය අතර ඉංජිනේරු සහ ගොඩනැගිලි සඳහා වූ අත්තිකාරම් රුපි. දශලක්ෂ 8.2 කින් වැඩිවිය. කාර්මික අත්තිකාරම් එකතුවේ, මෙම ගණය සඳහා වූ ප්‍රතිශත කොටස 1967 අවසානයේ පැවති 12.2 කේ සිට 1968 අවසානයේ දී 17.6 දක්වා වැඩිවිණ.

---

1. 1968 ජූනි 30 වන දින පවත්වන්ට යෙදුණු සමීක්ෂණයේදී අත්තිකාරම් වර්ගීකරණය දියුණු කිරීම සඳහා ඇතැම් සැකසීම් කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කලින් පැවති සමීක්ෂණවලදී, අරමුණෙහි සවභාවය පැහැදිලි ලෙස විස්තර කර නොමැති, ඇතැම් අත්තිකාරම් නියම පරිදි හඳුනාගෙන ඇති අතර, ''අරමුණෙහි' උචිත ගණයන්ට ඒවා බෙදා වෙන් කොට ඇත. 1967 දෙසැම්බර් 31 වන දිනට වූ අත්තිකාරම් වර්ගීකරණයෙහි ලා අනුරූපී ප්‍රතිශෝධනයක් ඇති කළ නොහැකි හෙයින්, 2(ඇ)11 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති, ඇතැම් අත්තිකාරම් ගණයන්ගේ විශාල වෙනස්කම්වලට තරමක් දුරටවත් හේතු වී ඇත්තේ, 1968 ජූනි 30 වන දිනට වූ සංඛ්‍යා තොරතුරු වර්ගීකරණය දියුණු කිරීම බව මෙහි ලා දක්විය හැකිය. එහෙත් අත්තිකාරම් වර්ගීකරණය පදනම් වී ඇත්තේ අත්තිකාරම් යොදවන නියම අරමුණට වඩා ණය ලබාගන්නාගේ සවරූපය පදනම් කරගෙන බැව් සැලකිය යුතුය.

## සංඛ්‍යා සටහන II (ඈ) 11

## අත්තිකාරම්* අරමුණු හා කල්පිරීම අනුව

රුපියල් දශ ලක්ෂ

| අරමුණ | | කෙටි කාලීන (6 මාසයට අඩු) (1) | (2) (7 හි) % වශයෙන් (1) | මැදි කාලීන (6 මාසයේ සිට මාස 30 දක්වා) (3) | (4) (7 හි) % වශයෙන් (3) | දිගු කාලීන (මාස 30 ට වැඩි) (5) | (6) (7 හි) % වශයෙන් (5) | එකතුව (7) | (8) එකතුවෙහි % වශයෙන් (7) |
|---|---|---|---|---|---|---|---|---|---|
| (අ) වාණිජ | 1967 දෙසැම්බර් ... | 206.1 | 41.1 | 200.1 | 39.9 | 94.7 | 18.9 | 500.9 | 51.3 |
| | 1968 ජූනි ... | 217.9 | 37.4 | 253.3 | 43.5 | 110.9 | 19.1 | 582.1 | 51.4 |
| | 1968 දෙසැම්බර් ... | 286.3 | 44.4 | 227.3 | 35.2 | 131.7 | 20.4 | 645.3 | 50.9 |
| (ආ) මූල්‍ය | 1967 දෙසැම්බර් ... | 36.9 | 35.5 | 35.0 | 33.7 | 32.0 | 30.8 | 103.9 | 10.6 |
| | 1968 ජූනි ... | 52.3 | 37.7 | 39.6 | 28.6 | 46.7 | 33.7 | 138.6 | 12.2 |
| | 1968 දෙසැම්බර් ... | 47.2 | 34.3 | 36.6 | 26.6 | 53.8 | 39.1 | 137.5 | 10.8 |
| (ඇ) කෘෂිකාර්මික | 1967 දෙසැම්බර් ... | 27.7 | 27.0 | 52.4 | 51.2 | 22.3 | 21.8 | 102.4 | 10.5 |
| | 1968 ජූනි ... | 13.0 | 12.8 | 62.7 | 61.7 | 25.9 | 25.5 | 101.6 | 9.0 |
| | 1968 දෙසැම්බර් ... | 24.5 | 18.6 | 75.2 | 57.1 | 31.8 | 24.2 | 131.6 | 10.4 |
| (ඈ) කාර්මික | 1967 දෙසැම්බර් ... | 60.7 | 51.0 | 29.1 | 24.4 | 29.2 | 24.5 | 119.1 | 12.2 |
| | 1968 ජූනි ... | 88.6 | 47.8 | 36.3 | 19.6 | 60.4 | 32.6 | 185.2 | 16.4 |
| | 1968 දෙසැම්බර් ... | 111.6 | 50.1 | 42.7 | 19.2 | 68.5 | 30.7 | 222.8 | 17.6 |
| (ඉ) පාරිභෝජනය | 1967 දෙසැම්බර් ... | 29.5 | 30.5 | 25.9 | 26.8 | 41.2 | 42.6 | 96.6 | 9.9 |
| | 1968 ජූනි ... | 12.6 | 14.7 | 27.9 | 32.7 | 44.9 | 52.6 | 85.4 | 7.5 |
| | 1968 දෙසැම්බර් ... | 14.2 | 14.9 | 32.9 | 34.5 | 48.1 | 50.5 | 95.3 | 7.5 |
| (ඊ) අනෙකුත් ණය | 1967 දෙසැම්බර් ... | 23.2 | 43.6 | 17.1 | 32.1 | 12.8 | 24.1 | 53.2 | 5.4 |
| | 1968 ජූනි ... | 3.8 | 9.7 | 19.8 | 50.4 | 15.7 | 39.9 | 39.3 | 3.5 |
| | 1968 දෙසැම්බර් ... | 4 3 | 12.1 | 17.1 | 48.2 | 14.1 | 39.7 | 35.5 | 2.8 |
| (උ) එකතුව | 1967 දෙසැම්බර් ... | 384.1 | 39.3 | 359.6 | 36.8 | 232.4 | 23.8 | 976.1 | 100.0 |
| | 1968 ජූනි ... | 388.3 | 34.3 | 439.5 | 38.8 | 304.5 | 26.9 | 1,132.3 | 100.0 |
| | 1968 දෙසැම්බර් ... | 488.1 | 38.5 | 431.8 | 34.0 | 348.0 | 27.4 | 1,268.0 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

*ණය, අයිරාවන් හා වට්ටම් කරන ලද බිල්පත් අත්තිකාරම්වලට ඇතුළත් වේ. එකතුවෙමින් පවත්නා මුදල් ශීර්ෂ එයට ඇතුළත් නොවේ.

කෘෂිකාර්මික අරමුණු සඳහා වූ අත්තිකාරම් රුපි. දශලක්ෂ 29.2 කින් වැඩි විය. 1967 දෙසැම්බර් අවසානයේ සිට, 1968 දක්වා වූ කාල සීමාව තුළදී බේරුම් කර නොමැති, නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ ගත්, ශුද්ධ ණය මුදලෙහි රුපි. දශලක්ෂ 14.7 ක වැඩිවීම ද මෙයට අයත් වෙයි. කෙසේ හෝ, 1967 දෙසැම්බර් අවසානය තෙක් බේරුම් කර නො තිබුණු 67/68 මහ කන්නයේ ණය මුදලේ වටිනාකමට වඩා 1968 දෙසැම්බර් අවසානය තෙක් බේරුම් කර නොතිබුණු 1968/69 මහ කන්නයේ ණය මුදලේ වටිනාකම අඩුවිය. මෙකී දිනයන් දෙක අතරතුර කාලසීමාවේදී බේරුම් කර නොතිබුණු ණය ප්‍රමාණය වැඩිවීමට හේතුව, වර්ෂය අවස නය තෙක් නොබේරාතුබුණු 1968 යල කන්නයේ ණය මුදලින් පැහැදිලි වෙයි. මෙම ක්‍රමය ක්‍රියා කරන අයුරු, පසුව එන කොටසක වඩාත් සවිස්තරව දක්වා ඇත. වී වගාව සහ වෙනත් අතිරේක බෝග සඳහා මෙම ක්‍රමය යටතේ වූ ණය වැඩිවීමට අමතරව, වෙනත් කෘෂි බෝග සඳහා වූ ණයද වැඩිවන්නට විය. එහෙත් තේ, සහ රබර් වගාව සඳහා වූ ණය, වසර තුළදී මඳ වශයෙන් පහත වැටුණි. මුළු අත්තිකාරම් මුදල්වල එකතුවෙහි කෘෂිකාර්මික අත්තිකාරම් සඳහා වූ කොටස දෙසැම්බර් අවසානයේදී සියයට 10.4 ක්ව පැවති අතර එය ඉකුත් දෙසැම්බරයට වඩා වෙනස්වූයේ ඉතා සුළු වශයෙනි.

මූල්‍ය අරමුණු සඳහා දෙන ලද අත්තිකාරම් වසර තුළදී සියයට 33.7 කින් ඉහළ ගියේය. මූල්‍ය සමාගම්වලට දෙන ලද අත්තිකාරම්වලට දේපොල හා කොටස් ආයෝජන වැනි ආයෝජන සඳහා ණය ලබාගන්නට දෙනලද අත්තිකාරම්ද අයත්ය. මුළු අත්තිකාරම් එකතුවේ, ඔවුනට ඇති කොටස, වසර අවසානයේදී සියයට 10.8 ක් ව පැවති අතර, එය 1967 අවසානයේ පැවති තත්ත්වයට වඩා මඳකින් වැඩි වූ බව වාර්තා වී ඇත.

වර්ෂය තුළදී පාරිභෝජන ණය තරමක් දුරට පහත වැටුනු අතර, 1968 අවසානයේදී එකී ණය මුළු අත්තිකාරම් එකතුවෙන් සියයට 7.5 ක් පමණක් විය. ඉකුත් වසරේදී මෙය සියයට 9.9 ක් විය. කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ සඳහා වූ අත්තිකාරම්වල වැඩිවීමක් ඇත්ත වශයෙන් ම දක්නට ලැබුණු නමුත් වෙනත් පෞද්ගලික අවශ්‍යතාවයන් සඳහා වූ අත්තිකාරම් විශාල ප්‍රමාණයකින් පහත වැටුණි. ඉතිරි කොටස වන '' වෙනත් ණය '' ගණයේ අත්තිකාරම් 1968 දී සියයට 17.7 කින් පහත වැටුණු අතර මුළු අත්තිකාරම් එකතුවේ, ඒවාට ඇති කොටස, නැති වී යන තරමට, සියයට 5.4 රේ සිට සියයට 2.8 දක්වා පහත වැටිණි.

වසර කීපයක් තුළදීම ප්‍රායෝගික වශයෙන් නොවෙනස්ව පැවති වෙළඳ බැංකු අත්තිකාරම් වල කාලීන ව්‍යූහය 1968 දී කිසියම් වෙනසක් දැක්විය. මුළු අත්තිකාරම් එකතුවට ඇති දිගු— කාලීන අත්තිකාරම් අනුපාතය සියයට 23.8 සිට සියයට 27.4 දක්වා වැඩි වූ අතර, කෙටි කාලීන හා මැදි කාලීන අත්තිකාරම් කොටස් මඳ වශයෙන් පහත වැටුණි. දිගු කාලීන අත්තිකාරම් පිළිබඳව වැඩිවෙමින් පවත්නා වැදගත් කම සියළුම ගණයන්හි ණය මුදල්වල පිළිබිඹු විය.

පොළී අනුපාතිකයන් අනුව අත්තිකාරම් වර්ගකර ඇති අයුරු **II** (ඈ) 12 සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

### සංඛ්‍යා සටහන II (ඈ) 12

### අත්තිකාරම්* – පොලී අනුපාතිකයන් අනුව

| පොලී අනුපාතය | 1967 දෙසැම්බර් 31 | | 1968 ජූනි 30 | | 1968 දෙසැම්බර් 31 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් |
| 2 අඩු ... ... | 4.9 | 0.5 | 5.3 | 0.5 | 15.1 | 1.3 |
| 2½ ... ... | 1.8 | 0.2 | 0.1 | ... | 0.5 | ... |
| 3 ... ... | 0.3 | ... | 0.1 | ... | 0.1 | ... |
| 3½ ... ... | 1.0 | 0.1 | 1.2 | 0.1 | 4.6 | 0.4 |
| 4 ... ... | 1.8 | 0.2 | 1.0 | 0.1 | 2.7 | 0.2 |
| 4½ ... ... | 12.3 | 1.3 | 2.7 | 0.3 | 2.8 | 0.2 |
| 5 ... ... | 29.1 | 3.1 | 28.0 | 2.6 | 22.8 | 1.9 |
| 5½ ... ... | 32.8 | 3.5 | 17.4 | 1.6 | 16.2 | 1.4 |
| 6 ... ... | 60.4 | 6.5 | 104.9 | 9.9 | 121.8 | 10.3 |
| 6½ ... ... | 156.7 | 16.9 | 49.9 | 4.7 | 96.9 | 8.2 |
| 7 ... ... | 261.4 | 28.3 | 308.4 | 29.1 | 232.4 | 19.6 |
| 7½ ... ... | 106.8 | 11.5 | 262.4 | 24.8 | 300.6 | 25.4 |
| 8 ... ... | 167.0 | 18.0 | 161.5 | 15.2 | 209.7 | 17.7 |
| 8½ ... ... | 11.8 | 1.3 | 35.5 | 3.3 | 50.4 | 4.3 |
| 9 ... ... | 59.4 | 6.4 | 53.0 | 5.0 | 69.2 | 5.8 |
| 9 සහ ඊට වැඩි ... | 17.4 | 1.9 | 28.4 | 2.7 | 37.3 | 3.1 |
| එකතුව | 925.1 | 100.0 | 1,059.9 | 100.0 | 1,183.3 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* පවත්නා විනිමය අනුපාතිකයන් අනුව මිලට ගත් අපනයන බිල්පත් හා එකතු කෙරී ගෙන යන මුදල් ශීර්ෂ යන් ද අයත් නොවේ.

අත්තිකාරම්වල විශාලතම කොටස අයත් වූයේ සියයට 6½ ටත් සියයට 8 ටත් අතර වූ පොළී අනුපාතික වලටය. මෙම අනුපාතවල අත්තිකාරම් සියලු අනුපාතවල අත්තිකාරම් වලින් සියයට 70.9 ක් විය. 1967 දී එය සියයට 74.7 ක් විය. මෙම කාණ්ඩය ඇතුළත අවධානය වඩාත් යොමුවන්නේ සියයට 7½ රේ අනුපාතිකයටයි. ඉකුත් වර්ෂයේදී අවධානය යොමු වූයේ සියයට 7 තේ අනුපාතිකයටයි. මෙම අනුරූපී ගණයේ සාපේක්ෂිත වැදගත්කම වැටීමත් සමගම ඉහළ අනුපාතිකයන්හි වැදගත් කමද වැඩිවිය. සියයට 8½ සහ ඊට වැඩි අත්තිකාරම් අනුපාතය 1967 දී පැවති සියයට 9.6 යේ ප්‍රමාණයේ සිට 1968 දී සියයට 13.2 තෙක් ඉහල නැංගේය. අනුරූපී ගණයට පහළ පොළී අනුපාතිකයන් අතර සියයට 6 යේ අනුපාතිකයට මාරුවීමක් දක්නට ලැබිණි. සියයට 6 යේ සහ ඊට අඩු අනුපාතික ගණයේ අත්තිකාරම්වල සාපේක්ෂිත වැදගත්කම සියයට 15.4 සිට සියයට 15.7 දක්වා මදවශයෙන් වැඩි වූ අතර, සියයට 6 යේ අත්තිකාරම්වල වැදගත්කම වැඩිවනවාත් සමගම එයට පහල අනුපාතිකයන් මත වූ අත්තිකාරම්වල වැදගත්කම පහළ වැටීමක් ද දක්නට ලැබිණ. ඇප වර්ග අනුව අත්තිකාරම් වර්ග කිරීම **II** (ඇ) 13 සංඛ්‍යා සටහනින් දැක්වේ.

### සංඛ්‍යා සටහන II (ඇ) 13

### අත්තිකාරම්* ඇප වර්ග අනුව

| ඇප වර්ගය | 1967 දෙසැම්බර් 31 | | 1968 ජූනි 30 | | 1968 දෙසැම්බර් 31 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් |
| ලේඛන ගත බිල්පත් ...... ... | 132.2 | 13.5 | 141.7 | 12.5 | 183.0 | 14.4 |
| රජයේ සුරැකුම්පත් ... ... ... | 14.8 | 1.5 | 24.6 | 2.2 | 16.8 | 1.3 |
| බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් | 17.8 | 1.8 | 19.3 | 1.7 | 20.9 | 1.6 |
| කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු හා අනෙකුත් මුදල් තැන්පතු ( ජීවිත රක්ෂණ ඔප්පුවල මුදල් වටිනාකම ඇතුළුව) ... | 51.3 | 5.3 | 56.4 | 5.0 | 50.2 | 4.0 |
| වෙළෙඳ තොග ... ... ... | 200.4 | 20.5 | 276.1 | 24.4 | 268.1 | 21.1 |
| නිශ්චල දේපොළ ... ... ... | 102.3 | 10.5 | 112.0 | 9.9 | 121.6 | 9.6 |
| අනෙකුත් ... ... ... ... | 371.5 | 38.1 | 433.0 | 38.2 | 542.5 | 42.8 |
| ඇප රහිත ... ... ... ... | 85.6 | 8.8 | 69.1 | 6.1 | 64.8 | 5.1 |
| එකතුව ... ... ... ... | 976.1 | 100.0 | 1132.3 | 100.0 | 1268.0 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

* එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂයන් ඇතුලත් නොවේ.

ලේඛනගත බිල්පත් වෙනුවෙන් වූ අත්තිකාරම් වැඩිවීම කලින් සඳහන් කළ පරිදි බැංකු වෙත ඇති ආනයන හා අපනයන බිල්පත් වැඩිවීම පිළිබිඹු කරන්නකි. රජයේ සුරැකුම්පත් හා බද්ධ ව්‍යාපාර වස්තු කොටස් මගින් ඇපවූ ණය වැඩිවූයේ මඳ වශයෙනි. එහෙත් මුළු අත්තිකාරම් එකතුවට, ඒවායේ ඇති කොටස වර්ෂය තුළදී මදක් අඩු විය. කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු, වර්ෂය තුලදී වැඩිවූමුත්, අත්තිකාරම සඳහා ඒවා වැඩි වශයෙන් යොදවා ගෙන නොමැත. කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු මගින් ඇප වූ අත්තිකාරම් වල වටිනාකම සහ ජීවිත රක්ෂණ ඔප්පුවල මුදල් අගය නිරපේක්ෂ වටිනාකමින් හා මුළු අත්තිකාරම් එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් අඩු වූයේ මඳ වශයෙනි.

වෙළඳ තොග මගින් ඇපවූ ණය රුපි. දශ ලක්ෂ 67.7 කින් වැඩි වූ අතර, අත්තිකාරම් එකතුවෙහිලා ඒවායේ වැදගත්කම ආන්තික වශයෙන් සියයට 20.5 හේ සිට සියයට 21.1 දක්වා ඉහළ නැගුණි. නිශ්චල දෙපොල මගින් ඇපවූ ණය රුපි. දශලක්ෂ 19.3 කින් වැඩි වූ නමුත්, අත්තිකාරම් එකතුවෙහි ලා ඒවායේ ඇති කොටස සියයට 10.5 හේ සිට සියයට 9.6 දක්වා මඳ වශයෙන් පහළ වැටුණි. වෙනත් ඇප වෙනුවෙන් වූ අත්තිකාරම් රුපි. දශලක්ෂ 171.0 කින් වැඩි වූ අතර, මුළු එකතුවෙහි ලා ඒවායේ ඇති කොටස සියයට 38.1 සිට සියයට 48.1 දක්වා වැඩිවිය.ඇප රහිත අත්තිකාරම් වර්ෂය තුළදී පහත වැටුණු අතර, ඒවා වර්ෂාවසාන මුළු මුදලින් සියයට 5.1 කින් පමණක් සමන්විත විය.

## (2). ( උ) ව්‍යාප්ති ණය යෝජනා ක්‍රමය සහ ග්‍රාමීය බැංකු

ව්‍යාප්ති ණය යෝජනා ක්‍රමය යටතේ, මහජන බැංකුව, තෝරා ගනු ලැබූ සමූපකාර සමිති මාර්ගයෙන් නොදියුණු, ග්‍රාමීය ප්‍රදේශවලට ණය පහසුකම් සලසයි. මහජන බැංකුව තෝරා ගනු ලැබූ සමූපකාර සමිතිවලට ණය අරමුදල් සපයන අතර, එම මුදල් තම සාමාජිකයින්ට, කෘෂිකාර්මික නිෂ්පාදන, සත්ව පාලනය, ගෘහ කර්මාන්ත, නිවාස තැනීම, නිවාස අළුත් වැඩියා කිරීම සහ පුළුල් කිරීම, ණය බේරීම , විදුලිය සැපයීම, පාරිභෝජනය යන හදිසි කටයුතු වැනි විශේෂිත කාර්‍යයන් සඳහා ණය වශයෙන් සපයයි.

1968 වර්ෂය තුළදී මෙම ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන සමිති සංඛ්‍යාව 60 සිට 69 දක්වා වැඩි වූ අතර, මහජන බැංකුව විසින් සපයනු ලබන අයිරා ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1.90 සිට රුපියල් දශලක්ෂ 1.93 දක්වා වැඩි විය. 1968 අවසානය වන විට මෙම අයිරා පහසුකම්, නියම වශයෙන් උපයෝගී කොට ගත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1.29 සිට රුපියල් දශලක්ෂ 1.16 දක්වා අඩු විය.

1964 දී ආරම්භ කරන ලද ග්‍රාමීය බැංකු ක්‍රමය, 1968 වර්ෂය තුළදී ශීඝ්‍ර ලෙස පුළුල් වනු දක්නට ලැබිණ. මෙම ක්‍රමය යටතේ තෝරා ගන්නා ලද විවිධ සේවා සමූපකාර සමිති, සාමාජිකයින් සහ සාමාජිකයින් නොවන අයවලුන්ගෙන් ඉතිරි කිරීමේ සහ ස්ථාවර තැන්පතු භාර ගන්නා අතර සාමාජිකයින්ට, විශේෂිත කාර්‍යයන් සඳහා ණය පහසුකම් සලසයි. මහජන බැංකුව අයිරා පහසුකම් මාර්ගයෙන්, ග්‍රාමීය බැංකුවලට ණය සැපයීම සඳහා අතිරේක සම්පත් ලබා දෙන අතර, අවශ්‍ය අවස්ථාවලදී පරිපාලන ආධාර ද සපයයි. ණය මුදල්වල විශේෂිත කාර්‍යයන්, ණය මුදල්වල කාලය සහ ආපසු ගෙවීමේ කොන්දේසි, සියල්ලක්ම ව්‍යාප්ති ණය ක්‍රමයට සමාන වේ.

1968 වර්ෂය තුළදී, ග්‍රාමීය බැංකු දහතක් විවෘත කිරීමෙන් 1968 අවසානය වන විට, මුළු ග්‍රාමීය බැංකු සංඛ්‍යාව 44 දක්වා වැඩි කරලිය. මෙම වර්ෂය තුළදී ග්‍රාමීය බැංකුවල ඉතිරි කිරීමේ ගිණුම් සංඛ්‍යාව 8,792 සිට 17,359 දක්වා වැඩි වූ අතර, ඉතිරි කිරීමේ තැන්පතු ප්‍රමාණය, රුපියල් දශලක්ෂ 1.3 සිට රුපියල දශලක්ෂ 3.1 දක්වා වැඩි විය. ඉතිරි කිරීම් තැන්පතුවල සාමාන්‍යය, රුපියල් 148 සිට රුපියල් 179 දක්වා වැඩි විය. ස්ථාවර තැන්පතු සංඛ්‍යාව 41 සිට 287 දක්වා සහ ප්‍රමාණය, රුපියල් 65,381/- සිට රුපියල් 22,614/- දක්වා වැඩි විය. ස්ථාවර තැන්පතු සාමාන්‍යය රුපියල් 1,595/- සිට රුපියල් 776/- දක්වා පහළ බැස්සේය. ඉතිරි කිරීම් සහ ස්ථාවර තැන්පතුවල එකතුව රුපියල් දශලක්ෂ 1.4 සිට රුපියල් දශලක්ෂ 3.3 දක්වා වැඩි විය.

ව්‍යාප්ති ණය ක්‍රමය යටතේ දක්වෙන කාර්‍යයන් සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණය, **II** (ඇ) 14 සංඛ්‍යා සටහනේ විශ්ලේෂණය කර දක්වා ඇති පරිදි රුපියල් දශලක්ෂ 2.03 සිට රුපියල් දශලක්ෂ 3.76 දක්වා ඉහළ ගියේය. සපයන ලද ණය සංඛ්‍යාව 1967 දී 2,807 සිට 1968 දී 5,586 දක්වා වැඩි විය. එහි ප්‍රතිඵලය වූයේ සපයන ලද ණය ප්‍රමාණයේ සාමාන්‍යය 1967 රුපියල් 701/ සිට1968 රුපියල් 673/- දක්වා පහළ වැටීමය.

## සංඛ්‍යා සටහන II (ඇ) 14

### 1968 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය බැංකු සපයන ලද ණය ප්‍රමාණය — පරමාර්ථ අනුව

| පරමාර්ථය | ප්‍රමාණය (රුපියල් වලින්) | | මුළු ගණනේ සියයට ගණන වශයෙන් | |
|---|---|---|---|---|
| නිෂ්පාදනය — ඒ ඒ කාර්‍ය්‍යයන් අනුව ... ... | | 1,010,280 | | 26.9 |
| (1) කෘෂිකර්මාන්තය... ... ... ... | 844,802 | | 22.5 | |
| (2) සත්ව පාලනය ... ... ... ... | 75,082 | | 2.0 | |
| (3) ගෘහ කර්මාන්තය ... ... ... | 90,396 | | 2.4 | |
| නිවාස ... ... ... ... ... | | 1,334,229 | | 35.5 |
| ණය බේරීම සඳහා ... ... ... ... | | 1,006,675 | | 26.8 |
| වෙළඳ කටයුතු ... ... ... ... ... | | 214,449 | | 5.7 |
| පාරිභෝජනය ... ... ... ... ... | | 71,621 | | 1.9 |
| විදුලිය සැපයීම ... ... ... ... ... | | 7,313 | | 0.2 |
| වෙනත් කටයුතු ... ... ... ... ... | | 112,695 | | 3.0 |
| මුළු ගණන ... ... ... ... ... | | 3,757,262 | | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

තැන්පතු ප්‍රමාණය සහ අත්තිකාරම් ප්‍රමාණය යන දෙකේම වැඩිවීමක් පැවතියත්, තැන්පතු ප්‍රමාණයේ සීඝ්‍ර වැඩිවීම අත්තිකාරම් ප්‍රමාණය වැඩි වූ ප්‍රමාණයට වඩා, වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, මහජන බැංකුවේ සම්පත් මත, ග්‍රාමීය බැංකු රඳී සිටීම අඩු කළේය.

ඉහත සඳහන් ණය දීමනාවලට අමතරව, ග්‍රාමීය බැංකු, උකස් ව්‍යාපාර කටයුතුවලද නිරත විය. 1967 අවසානය වන විට පැවති රුපියල් 633,214 ක අගයක ගනුදෙනු 6598 හා සසඳා බලන කළ 1968 අවසානය වන විට, රුපියල් 958,982 කින් යුත් 9507 ක ගනුදෙනු ප්‍රමාණයක නියුක්ත වී තිබුණි. මෙම ව්‍යාපාර කටයුතු කරන ලද්දේ, මහජන බැංකුවේ නියෝජිතයින් වශයෙනි.

## නව කෘෂිකාර්මික ණය ක්‍රමය.

නව කෘෂිකාර්මික ණය ක්‍රමය, එහි ආරම්භයේ සිට, එනම් 1967 සැප්තැම්බරයේ සිට, 1968 දෙසැම්බරය තෙක් මෙහි දී සමාලෝචනය කෙරෙයි. මෙම ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයන් වනුයේ :—

(අ) මහජන බැංකුව විසින් සමූපකාර සමිති වෙත වසරකට සියයට 5 ගණනේ ණය දෙනු ලබන අතර, සමූපකාර සමිති විසින් ඒවායේ සාමාජිකයනට දෙනු ලබන ණය මුදල් සම්බන්ධයෙන් අය කරනු ලබන වැඩිම අනුපාතිකය වනුයේ සියයට 3 කි. සාමාජිකයා විසින් හෝ සමූපකාර සමිතිය විසින්, නියමිත දිනට ණය මුදල නො ගෙවුව හොත්, මෙම අනුපාතිකයනට අතිරේකව වසරකට සියයට 3 ක අනුපාතිකයක් අය කරනු ලැබේ.

සමූපකාර බැංකු හයක් මගින් ද මහජන බැංකුව සමූපකාර සමිතිවලට ණය දෙනු ලබයි. එසේ ණයට ගෙන නියමිත කාල සීමාවක තුළ දී ආපසු ගෙවන ණය සඳහා සමූපකාර බැංකු විසින් වසරකට සියයට $3\frac{1}{2}$ ක පොළී අනුපාතිකයක් ගෙවනු ලැබේ. කල් ඉකුත් වූ ණය සඳහා වසරකට සියයට 3 ක අමතර පොළියක් අය

කරනු ලබයි. සියයට 1 කින් එක් අඩක් වන ඇප ගාස්තුව හා ගෙවීම පැහැර හැර ඇති මුදල් ප්‍රමාණය සමූපකාර බැංකු හා මහජන බැංකුව අතර සම සමව බෙදා ගනු ලැබේ.

(ආ) මෙම ක්‍රමය යටතේ ණයට දෙනු ලබන මුළු මුදල් ප්‍රමාණයම මහ බැංකුව විසින් මහජන බැංකුවට ප්‍රතිමූල්‍යොපජනය කෙරෙයි.

(ඇ) සමූපකාර සමිති විසින් ගනු ලබන ණය මුදල් සම්බන්ධයෙන් භාවිතයෙන් භාවිතීය නෝට්ටු ඇප වශයෙන් තබන අතර, ගොවීන් වෙත දෙනු ලබන මුදල්, සලාක කූපන්වල වටිනාකමින් ගෙවී නිමවන නෙක් ගොවියාගේ සහ ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ සහල් සලාක නවතා ගැනීමේ අයිතිය, ඇප වශයෙන්, සමිති වෙත පවරා ගනු ලැබේ. එසේ නවතා ගන්නා සහල් සේරුවක් රුපියල් එක බැගින් අගය කොට ඇත.

(ඈ) ගෙවීම පැහැර හැර ඇති මුදලින් සියයට 75 ක ප්‍රමාණය තෙක් ණය මුදල් සහතික කිරීම ආණ්ඩුව වෙනුවෙන් මහ බැංකුව විසින් කෙරෙයි. දෙනු ලබන ණය මුදලින් සියයට 1 කින් අඩක් මෙම සහතික කිරීමේ ගාස්තුව වශයෙන් අයකරනු ලැබේ.

(ඉ) එක් ගොවියකුට, 1967/68 මහ කන්නයේදී සහ 1968 යල කන්නයේදී අක්කරයකට රුපියල් 220/- ක ණය මුදලක් ද, 1968/69 මහ කන්නයේදී අක්කරයකට රු. 262/-ක ණය මුදලක් ද, ( අක්කර දහයට නොවැඩි බිම් කට්ටි වෙනුවෙන් ) ලබා ගැනීමට හිමිකම් තිබුණි. ණය මුදල අවස්ථා තුනකින් නිකුත් කරනු ලැබේ.

වී නිෂ්පාදනය සඳහාවූ ණය මුදල් සම්බන්ධයෙන් 1967/68 මහ, 1968 යල සහ 1968/69 මහ, යන කන්න අනුව ක්‍රමය විග්‍රහ කොට ඇත. සමාලෝචනයට භාජන වන වර්ෂය තුළදී 1967/68 මහ කන්නයේ දී ලබාගෙන ඇති ණය මුදල් ආපසු ගෙවීමේ කාලසීමාව අවසන් වූ අතර, 1968 යල කන්නයේ ණය මුදල්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ආපසු ගෙවිය යුතුව තිබුණි. 1968/69 මහ කන්නයේ ණය මුදල් නිකුත් කිරීම අවුරුද්දේ අවසාන කාර්තුව තුළදී පටන් ගන්නා ලදී. අතිරේක ආහාර වර්ග වගාව සඳහා දෙන ලද ණය මුදල් 1967 ඔක්තෝබර් මාසයේ දී ණය මුදල් නිකුත් කිරීම පටන් ගැන්මේ සිට 1968 දෙසැම්බර් මාසය දක්වා විග්‍රහ කොට ඇත.

**1967/1968 මහ කන්නයේ වී වගා ණය**

1967/68 මහ කන්නයේ දී අක්කර දහයට නොවැඩි බිම් කට්ටි වෙනුවෙන්, එක ගොවියකුට අක්කරයකට රු. 220/- බැගින් ණය මුදල් නිකුත් කොට ඇත. මෙම මුදල අවස්ථා තුනකින් නිකුත් කොට ඇත. පළමුවන අවස්ථාවේදී සීසෑම, (මුදලින් ණයක් අවශ්‍ය වූ විට ) බිත්තර වී, නැවත පැල සිටුවීම හෝ පේළි වැපිරීම, සහ වල් නෙළීම යනාදිය සඳහා අවශ්‍ය වන මුළු මුදල සඳහා අක්කරයකට උපරිම වශයෙන් ගැ. 137 ක් අත්තිකාරම් කරන ලදී. පොහොර, බිත්තර වී, සහ කෘෂි රසායනික ද්‍රව්‍ය, සමිති වෙත සැපයීම සඳහා ණය මුදලේ දෙවෙනි කොටස මහජන බැංකුව විසින් කෙළින්ම සහකාර ගොවිජන සේවා කොමසාරිස් තැන වෙත ගෙවා ඇත. ණය මුදලේ තුන්වැනි අවස්ථාවේදී, අස්වනු නෙළීමේ කාර්යයන් සඳහා අක්කරයකට රු. 55/- බැගින් නිකුත් කරන ලදී.

මහජන බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 78.12 ක් මුදලක් අනුමත කොට තිබුමුත්, සමූපකාර සමිති විසින් නියත වශයෙන් ප්‍රයෝජනයට ගෙන ඇත්තේ රු. දශලක්ෂ 61.41 ක මුදලක් පමණි. ගොවීන් විසින් ණය මුදල් ප්‍රයෝජනයට ගැනීම මෙලෙසින් අඩුවීමට හේතු විය හැක්කේ ණය අවශ්‍යතාවයන් පමණ ඉක්මවා ඇස්තමේන්තු කිරීම සහ ඇතැම් ගොවීන් සහල් සලාක පොත් උකස් කිරීමට ඇකැමැතිවීම විය හැක.

දෙන ලද ණය මුදල් ප්‍රමාණය ද ආපසු ලබාගැනීමේ ක්‍රමය හා ප්‍රමාණය ද අස්වැන්න පාළුවීම නිසා ණය මුදල් ප්‍රමාණය ආපසු ගෙවීමේ දීර්ඝ කරන ලද කාලය සහ පැහැර හැරි ප්‍රමාණය II (ඇ) 15 වැනි සංඛ්‍යා සටහනෙහි සම්පිණ්ඩනය කොට දක්වා ඇත.

### සංඛ්‍යා සටහන : II (ඇ) 15

### ණය මුදල්, ආපසු ගෙවීම් සහ වී වගා ණය ආපසු ගෙවීමේ කාලසීමාව දීර්ඝ කිරීම—1967/68 මහ කන්නය

| | රුපියල් දශ ලක්ෂ | සමිති වෙත නිකුත් කරන ලද මුළු මුදල් ප්‍රමාණයෙන් සියයට ගණන |
|---|---|---|
| සමුපකාර සමිති වෙත නිකුත් කෙරුනු මුදල් ප්‍රමාණය ... | 61.4 | 100.0 |
| සාමාජිකයන් විසින් සිය කැමැත්තෙන් ආපසු ගෙවා ඇති මුදල් ප්‍රමාණය ... ... ... ... ... | 42.6 | 69.4 |
| සහල් සලාක කූපන් මගින් අයකරගත් මුදල් ප්‍රමාණය | 4.6(අ) | 7.5 |
| මුළු අයකරගැනීම් ... | 47.2 | 76.9 |
| වගාව විනාශවීම හේතුකොටගෙන ආපසු ගෙවීමේ කාලසීමාව දීර්ඝ කොට ඇති ණය මුදල් ප්‍රමාණය | 3.0(ආ) | 4.9 |
| ගෙවීම පැහැර ඇති ණය මුදල්වල ප්‍රමාණය ... ... | 11.2 | 18.2 |

මූලය: 1 මහජන බැංකුව
2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

(අ) 1968. 12. 31 වනවිට මහජන බැංකු ශාඛා මගින් නියම වශයෙන් සමිතිවල ගිණුම්වලට බැරකර තිබුනේ රු. දශලක්ෂ 2.6 ක් පමණි.

(ආ) මේ සංඛ්‍යා 1968. 12. 15. දක්වා පමණි.

සියළුම ණයවලින්, ස්වේච්ඡාවෙන්ම ආපසු ගෙවන ලද ප්‍රමාණ සියයට 69.4 ක් වූ අතර සහල් සලාක කූපන් මගින් අයකරනු ලැබූ ප්‍රමාණය සියයට 7.5 ක් විය. ලබාදුන් මුළු ණය ප්‍රමාණයෙන් මේ අනුව ආපසු අය කැරුන මුළු ප්‍රමාණයට සියයට 76.9 ක් වෙයි. නොසැලකිමෙන් හෝ ඕනෑකමින් ම ණය ආපසු ගෙවීම පැහැර හැරීම පිළිබඳ ව සලකා බලන ආකාරයට වඩා වෙනස් අයුරකින්, අස්වැන්න පාලුව නිසා ණය ආපසු ගෙවීමේදී ඇතිවන දුෂ්කරතාවයන් පිළිබඳව සලකා බලන ලදී. එහෙයින් අස්වැන්න පාලුවීම හෝ ඊට හානි පැමිණීම නිසා ණය ආපසු ගෙවීම පමා වූ කල්හි ඊළඟ කන්න තුනෙහි දී සම කොටස් තුනකින් එම මුදල ගෙවීම සඳහා ණය කාලසීමාව දීර්ඝ කරන ලදී. අස්වැන්න පාලුවීමේ හේතුව නිසා, ණය මුදල්වලින් සියයට 4.9 ක ප්‍රමාණයක්, ඊළඟ කන්නයන් තුනෙහි දී ආපසු ගෙවීමට හැකිවනුවස්, ණය කාල සීමාව දීර්ඝ කෙරුණි. කාලසීමාවන් දීර්ඝ කෙරුණ ණය සඳහා ඉඩ හළ විට මුළු ණය ප්‍රමාණය ආපසු ගෙවිය යුතු මුළු ණය මුදල් ප්‍රමාණයෙන් ඇත්ත වශයෙන්ම සියයට 18.2 ක් වෙයි. ආපසු ණය ගෙවීමේ ප්‍රවණතාවයක් සහල් සලාක කූපන් මාර්ගයෙන් ණය මුදල් ආපසු අයකර ගැනීමේ හැකියාවන් අනුව බලන කල නොගෙවා පැහැර හරින ලද ණය මුදලින් සැලකිය යුතු ප්‍රමාණයක් අවසානයේදී සහල් සලාක කූපන් මගින් අය කරගැනීමට හැකිවන බව පෙනේ. වෙළඳ බැංකුවක් විසින් පාලනය කෙරුණත්, මෙම ක්‍රමය දැඩි ලෙස වෙළඳ පිළිවෙත්වලට අනුව ක්‍රියාත්මක නොවූ හෙයින් ලබාගත් සියළුම ණය වෙනුවෙන් ඇප වශයෙන් සහල් සලාක කූපන් කොටස් කිරීම හේතුකොටගෙන විශාල ප්‍රමාණයක ණය ආපසු අයකරගැනීම හැකිවන බවට සහතිකයන් වනු ඇත.

ඉකුත් වර්ෂයේදී ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබූ අවස්ථාවේ නිකුත් කළ ණය මුදලින් ආපසු අයකරගත හැකි වූයේ සියයට 45.9 ක ප්‍රමාණයක් පමණි. 1966/67 යල මහ කන්න දෙකම සඳහා ණයට දුන් රුපි. දශ ලක්ෂ 32.3න් ආපසු ලැබී ඇති රුපි. දශ ලක්ෂ 14.8 සමග සසඳන කල, 1967/68 මහ කන්නයේදී ණයට දෙන ලද රුපි. දශ ලක්ෂ 61.4 න් රුපි. දශ ලක්ෂ 42.6ක් ස්වේච්ඡාවෙන්ම ආපසු ගෙවා තිබේ.

## II (ඈ)16 වැනි සංඛ්‍යා සටහන

### 1967–68 මහකන්නයේ (වී) දුන් ණය, අයකර ගැනීම, දීර්ඝකිරීම් සහ පැහැර හැරීම් පිළිබඳ දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය

| | (1) සම්මත කළ මුළු ප්‍රමාණය | (2) සමිති මගින් ප්‍රයෝජනයට ගත් ප්‍රමාණය | (3) සමිති මගින් සිය කැමැත්තෙන්ම නැවත ගෙවන ලද ප්‍රමාණය | (4) සහල් සලාක කූපන් පත් මගින් නැවත ගෙවන ලද ප්‍රමාණය | (5) නැවත ගෙවන ලද මුළු මුදල (3) + (4) | (6) දීර්ඝ කරන ලද ණය මුදල් ප්‍රමාණය | (7) පැහැර හැරි ප්‍රමාණය | (8) සිය කැමැත්තෙන්ම නැවත ගෙවන ලද ප්‍රමාණය ප්‍රයෝජනයට ගත් මුළු ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් වශයෙන් (3) (2) කේ %වශයෙන් | (9) සහල් සලාක කූපන් පත් මගින් නැවත ගෙවූ ප්‍රමාණය ප්‍රයෝජනයට ගත් මුළු ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් වශයෙන් (4) (2) කේ % වශයෙන් | (10) මුළු අයකර ගැනීම් ප්‍රමාණය (6) + (7) ප්‍රතිශතය | (11) දීර්ඝ කරන ලද ණය ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්නා ලද ප්‍රමාණයේ ප්‍රතිශතයක් වශයෙන් (6) (2) කේ% වශයෙන් | (12) පැහැර හැරි ප්‍රමාණය සමිති මගින් ප්‍රයෝජනයට ගත් ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් වශයෙන් (7) (2) කේ% ගණන වශයෙන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දහස් | | | | | | | සියයට ගණන | | | | |
| කොළඹ—කළුතර ... | 690 | 485 | 373 | 11 | 384 | — | 101 | 76.9 | 2.3 | 79.2 | — | 20.8 |
| මහනුවර ... | 2404 | 2014 | 1853 | 47 | 1900 | 4 | 110 | 92.0 | 2.3 | 94.3 | 0.2 | 5.5 |
| මාතලේ ... | 1075 | 834 | 628 | 155 | 783 | — | 51 | 75.3 | 18.6 | 93.9 | — | 6.2 |
| නුවරඑළිය ... | 479 | 438 | 413 | 9 | 422 | — | 16 | 94.3 | 2.0 | 96.3 | — | 3.7 |
| ගාල්ල ... | 2485 | 1836 | 848 | 1 | 849 | 103 | 884 | 46.2 | — | 46.2 | 5.6 | 48.1 |
| මාතර ... | 1695 | 1400 | 1163 | 44 | 1207 | 234 | — | 83.1 | 3.1 | 86.2 | 16.7 | — |
| හම්බන්තොට ... | 3605 | 3124 | 2301 | 403 | 2704 | 149 | 271 | 73.7 | 12.9 | 86.6 | 4.8 | 8.7 |
| යාපනය ... | 3990 | 3438 | 3089 | 225 | 3314 | 42 | 82 | 89.8 | 6.6 | 96.4 | 1.2 | 2.4 |
| මන්නාරම ... | 3453 | 2794 | 2393 | 119 | 2512 | 9 | 273 | 85.6 | 4.3 | 89.9 | 0.3 | 9.8 |
| වවුනියාව ... | 4279 | 4279 | 3324 | 468 | 3792 | 148 | 339 | 77.7 | 10.9 | 88.6 | 3.5 | 7.9 |
| මඩකලපුව ... | 6688 | 5246 | 3897 | 675 | 4572 | — | 674 | 74.3 | 12.9 | 87.2 | — | 12.8 |
| අම්පාරේ ... | 9339 | 5817 | 3175 | 721 | 3896 | — | 1921 | 54.6 | 12.4 | 67.0 | — | 33.0 |
| ත්‍රිකුණාමලය ... | 4523 | 4079 | 2227 | 1025 | 3252 | — | 827 | 54.6 | 25.1 | 79.7 | — | 20.3 |
| කුරුණෑගල ... | 7866 | 6263 | 3564 | 73 | 3637 | 248 | 2378 | 56.9 | 1.2 | 58.1 | 3.9 | 38.0 |
| පුත්තලම ... | 2036 | 1529 | 731 | 108 | 839 | 298 | 392 | 47.8 | 7.1 | 54.9 | 19.5 | 25.6 |
| අනුරාධපුර ... | 12001 | 8701 | 4852 | 146 | 4998 | 259 | 3444 | 55.8 | 1.6 | 57.4 | 3.0 | 39.6 |
| පොලොන්නරුව ... | 5512 | 4528 | 4093 | 51 | 4144 | 33 | 351 | 90.4 | 1.1 | 91.5 | 0.7 | 7.8 |
| බදුල්ල ... | 2078 | 1472 | 1255 | 77 | 1332 | — | 140 | 85.3 | 5.2 | 90.5 | — | 9.5 |
| මොනරාගල ... | 1613 | 1103 | 869 | 46 | 915 | — | 188 | 78.7 | 4.2 | 83.0 | — | 17.0 |
| රත්නපුරය ... | 1641 | 1397 | 1099 | 121 | 1220 | 58 | 119 | 78.7 | 8.6 | 87.3 | 4.2 | 8.5 |
| කෑගල්ල ... | 742 | 635 | 452 | 63 | 515 | 84 | 36 | 71.2 | 9.9 | 81.1 | 13.2 | 5.7 |
| එකතුව ... | 78,158 | 61,412 | 42,599 | 4,588 | 47,187 | 1,669 | 12,597 | 69.4 | 7.4 | 76.8 | | |

මූලයන් : මහජන බැංකුව
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශය

සහතික මිල ක්‍රමය යටතේ මිලට ගැනුම් අඩුවූ නිසා 1966/67 දී ආපසු අයකර ගැනීම් පහත වැටුණි. එසේ වුව ද, සහතික මිල, වෙළඳ පොලේ මිලට වඩා වැඩිවීම නිසා සහතික මිල ක්‍රමය යටතේ වූ මිලදී ගැනීම්, අනෙක් වර්ෂවලදී වඩාත් සාර්ථක වූ හෙයින් ඒ වර්ෂවලදී සහතික මිල ගෙවීම්වලින් ණය මුදල් අයකරගත හැකි විය. මේ නිසාත් 1953/54 හා 1962/63 අතර කාල සීමාවේදී සාමූහික වගකීම සඳහා බලකර සිටීම නිසාත්, 1947/48 සහ 1966/67 අතර දී ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ණයට දී ඇති මුදලින් මුළු වශයෙන් සියයට 75 ක මුළු මුදලක් ද ආපසු ලබාගත හැකි විය. වීවල සහතික මිල වෙළඳ පොලේ මිලට ඉහලින් නොපවතින අවස්ථාවක, ණය ආපසු ගෙවීම පැහැර හරින ගොවීන් නිසා, ණය පැහැර නො හරින ගොවීන්ටත් ණය අහිමිවීම සිදුවන නිසා සාමූහික වගකීම සඳහා බල කිරීම සාධාරණ නොවේයයි සිතුවත් සහල් කූපන් නවතාගැනීම හේතුකොටගෙන ණය මුදල් ආපසු ලබා ගැනීම උසස් මට්ටමකින් පවත්වා ගැනීමට මහත් සැලසුණි. ගොවීන් බොහෝ දෙනෙකුට ම ඔවුන් සතු ඉඩම් නොමැති නිසාත් ඇප වශයෙන් ඉදිරිපත් කළ හැකි ඉඩම් ඔප්පු නොමැති නිසාත් මෙය වැදගත්කම අතින් විශේෂ තැනක් ගනී.

1967/68 මහ කන්නය ණය පැහැර හැරියවුනට මහ කන්නයේ ණය සඳහා උකස් කළ සහල් සලාක පොත් පවරා දීමට සිදුවූවා පමණක් නොව මේ ආකාරයෙන් ණය මුදල සම්පූර්ණයෙන්ම අයකර ගන්නා තෙක් ඔවුනට ණය ලබාගැනීමේ අයිතිය ද අහිමි විය. ණය ආපසු ගෙවීමට ගොවියා අපොහොසත්වී ඇත්තේ ඔහුගේ අස්වැන්න අලෙවි කර ගැනීමට නොහැකි නිසා බව සහතික කළ හොත් ඊළඟ කන්නය සඳහා ණය ලබා ගැනීමේ අයිතිය ඔහුට අහිමි නො කරනු ඇත. එසේ කන්නයන් දෙකක් එක ළඟ යෙදුණු කල්හි මුල් අවස්ථාවේ ණය මුදල නිකුත් කළ නමුත් ඊළඟ අවස්ථාවන්හි ණය නිකුත් කරනුයේ කලින් බේරුම් කළ යුතු ණය ගෙවා අවසන් වූවාට පසුවය.

වී වගා ණය ආපසු ලබා ගැනීම් පහත් මට්ටමකට වැටීමට හේතුවූයේ අස්වැන්න පාළුවීමය යන සාමාන්‍ය හැඟීම 1967/68 මහ කන්නය තුළදී ලත් අත්දැකීම්වලින් සනාථ නොවේ. අස්වැන්න පාළුවීමේ හේතුව නිසා ආපසු නොගෙවූ ණය ප්‍රමාණය සියයට 4.9 ක් පමණක් වන අතර සියයට 18.2 ක් තරම ප්‍රමාණයක ණය ආපසු නොගෙවීම සම්බන්ධයෙන් හේතු වශයෙන් දැක්විය යුතු වූයේ වෙනත් කරුණුයි. දිස්ත්‍රික්ක අනුව ණය ආපසු ගෙවීම පැහැර හැරීම් දැක්වෙන 11 වන සංඛ්‍යා සටහනේ 12 වන තීරුවෙන් මෙය පැහැදිලි වෙයි. මෙම සංඛ්‍යා සටහනේ අස්වැන්න පාළුව නිසා කාල සීමාවන් දීර්ඝ කැරුණු ණය, පැහැර හැරීම්වලින් බැහැර කොට ඇත.

II (අ) 16 වන සංඛ්‍යා සටහනේ ඇති දිස්ත්‍රික්ක අනුව ආපසු අයකර ගැනීම් පිළිබඳ විශ්ලේෂණය නුවරඑළිය, මහනුවර, පොළොන්නරුව, යාපනය, බදුල්ල, මන්නාරම සහ මාතර ස්වේච්ඡා ආපසු ගෙවීම් උසස් මට්ටමක පැවැති බවත්, ගාල්ල, අම්පාර, ත්‍රිකුණාමලය, කුරුණෑගල, පුත්තලම සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල ආපසු ගෙවීම් විශේෂ වශයෙන් ඌන තත්වයක පැවති බැව් අනාවරණය වෙයි.

ණය මුදල් ආපසු නොගෙවා පැහැර හැරීමේ ප්‍රධාන හේතුන් පහත සඳහන් අයුරින් දක්නට ලැබේ:—[1]

(අ) මෙම ණය මුදල් ඔවුන් වෙත පවරන ලද දීමනාවක් ලෙස සමහර ගොවීන් විසින් සැලකීමෙහි ප්‍රවණතාවයක් දක්නට ලැබුණු අතර, එමනිසා ඒවා ආපසු ගෙවීමට බැඳීමක් නොමැති බව ඔවුහු සිතූහ. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් 1958 ඔක්තෝබර් මාසයට පෙර දෙනු ලැබූ ආපසු නොගෙවන ලද රුපියල් දශ ලක්ෂ 5.8 ක ණය මුදල් ප්‍රමාණයක් රාජ්‍ය සමාව දීමක් වශයෙන් අත්හැර දැමීම මෙයට ප්‍රධාන හේතුවක් විය. මේ අතර, මීට ඉහත ණය ක්‍රමයයන් යටතේ ආපසු ගෙවීම් නිතර නිතර පැහැර හැරි අයවලුන් හට ද, ඔවුන් ණය මුදල් නොගෙවා පැහැර හැරීමට ඉවහල් වූ හේතුන් සොයා නොබලා, 1967/68 මහ කන්නයේ ද ණය මුදල් දී ඇත.

(ආ) මුදල් වලින් ආපසු ගෙවීමට වඩා සහල් සලාක කූපන් පත්වලින් ණය මුදල් ආපසු ගෙවීමට සමහර ගොවීන් කැමැත්ත දක්වා ඇත. මෙයට හේතුවී ඇත්තේ වී සඳහා වන සහතික මිලට වැඩියෙන් සේරුව රු.1/– ගණනේ සහල් සලාක කූපන්පත් අගය කිරීම නිසාය.[2] තවද, සහල් කූපන් පත් ආපසු ගෙවීම දීර්ඝ කාලච්ඡේදයක් තුළ විහිදී යන්නකි.

---

1. මෙම තොරතුරු, ණය ගෙවීම් පැහැර හැරීම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන්ට යෙදුන සමීක්ෂණයකින් ද හා එයට අතිරේකව මහජන බැංකුව හා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලදී.
2. සේරුවක් රු. 1– ගණනේ වී බුසලක් රු. 15.60 ක් වන අතර, වී බුසලක සහතික මිල රු. 14.00 ක් වේ.

ණය මුදල් සහල් සලාක කූපන් මගින් ආපසු ලබා ගැනීම, අධෛර්යමත්වේයයි බලාපොරොත්තු වුවද සිදුවූයේ විරුද්ද බලපෑමකි. කෙසේ වුවද, අනතුරු කන්නයට ණය ලබාගැනීම සඳහා ණයට ගත් මුළු ණය ප්‍රමාණය ආපසු ගෙවිය යුතු වූවාක් මෙන්, මෙම ආපසු ගෙවීමේ ක්‍රමය සීමාවක් නොමැතිව උපයෝගී කොටගත නො හැක. පවුලේ ප්‍රමාණය හා සලාක කූපන් අනුව ආපසු ගෙවීමේ කාලය නීර්නය වේ.

(ඇ) ණය මුදල් සීමාවන් තීරණය කරනු ලැබ ඇත්තේ, ප්‍රාදේශීය අවශ්‍යතාවයන්ට වඩා ජාතික පදනමක් මත පිහිටීමෙන්ය. සමහර ප්‍රදේශයන්හි ණය අවශ්‍යතාවයන් මෙම වැඩ පිළිවෙල යටතේ ලබා ගත හැකි ණය මුදල් ප්‍රමාණයන්ට වඩා අඩුවීමේ හේතුවෙන් ලබා ගත් ණය මුදල් වෙනත් කටයුතු සඳහා වියදම් කිරීමේ ප්‍රවණතාවයක් ගොවීන් අතර පැවතුණි. තවත් අවස්ථාවන්හිදී, අහිතකර ශිල්පීය හා ආයතනික සාධකයන් හේතුකොටගෙන, යෙදවුම් සඳහා වන ආන්තික වියදම්වලට සරිලන පරිදි නිෂ්පාදනයෙහි ආන්තික වැඩිවීම සිදුවී නොමැත. මෙම ආයතනික සාධකයන්ට, අයහපත් ඉඩම් බුක්ති ක්‍රමය කරණකොටගෙන අඳ ගොවියාට අමතර වියදමක් දැරීම තුළින් හිමිවන පහත් පලදාව, ඇතුළත් වේ. තෙත් කලාපයෙහි හා විශේෂයෙන් ම උඩරට ප්‍රදේශයන්හි මෙම සාධකය වැදගත් වේ.

(ඇ) වෙනත් ණයකරුවන්හට ණයවී සිටීමත්, ඔවුන් ඒවා ගොයම් කපා පාගා ගත් ස්ථානයේදීම අයකරගනු ලැබීමත් හේතුකොටගෙන සමූපකාර සමිතිවලට ගෙවීමට ප්‍රමාණවත් මුදලක් ගොවීන් අත ඉතිරි නොවේ.

(ඉ) සමහර සමූපකාර සමිති ඔවුන්ගේ අරමුදල් කොන්ත්‍රාත් වැඩ හෝ සමිතියෙහි ව්‍යාපාරික වැඩ කටයුතු සඳහා යොදන ලද අවස්ථාවන් ද විය. එවැනි කටයුතු සඳහා, සාමාජිකයන් විසින් ප්‍රයෝජනයට නොගත් හෝ ඔවුන් විසින් සමිතිවලට ආපසු ගෙවන ලද මුදල් ප්‍රමාණයන් යොදා ගනු ලැබිණ. සමිතිවලට මුදල් නැතිකම නිසා හෝ අරමුදල් යොදවන ලද කටයුතුවලින් ලාභයක් නොලැබීම නිසා හෝ, බැංකුවට මෙම අරමුදල් ආපසු ගෙවනු නො ලැබිණ.[1]

**1968 යල කන්නයෙහි වී වගා ණය**

1968 වර්ෂයෙහි යල කන්නයෙහි අනුමත කළ හා ප්‍රයෝජනයට ගත් ණය ප්‍රමාණය 67/68 වර්ෂයෙහි මහ කන්නයට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය. 1968 යල කන්නයෙහි වගා කරන ලද ඉඩම් ප්‍රමාණය, 1967/68 මහ කන්නයෙහි දී වගා කරන ලද ඉඩම් ප්‍රමාණයෙන් අඩකට මදකින් වැඩි වුවත්, අනුමත කළ සහ ප්‍රයෝජනයට ගන්නා ලද ණය මුදල් ප්‍රමාණය 1967/68 මහ කන්නයේදී යොදා ගත් ප්‍රමාණයෙන් 1/5 ට වඩා අඩු විය.

මෙම සැලකිය යුතු ප්‍රමාණයක අඩුවී යාම කරුණු කිහිපයක් නිසා සිදුවීයයි කිව හැක. මීට ඉහතදී ණය මුදල් ආපසු ගෙවීම පැහැර හැරියන්ට දෙන ලද සමාව හේතුකොටගෙන, 1967/68 මහ කන්නයෙහි ණය ගැනීමට සුදුසුකම් ඇත්තවුන් හා කැමැත්ත දක්වූවන්ගේ සංඛ්‍යාව වැඩි විය. 1967/68 මහ කන්නයේ ණයනොබේරූ අයට 1968 යල කන්නයේදී ණය ලබා ගැනීමට සුදුසුකම් නොතිබූ අතර, සහල් සලාක පොත් රජයට පැවරීමට සිදුවීම නිසා තවත් සමහරුන්, ණය ලබාගැනීමෙන් වැළකෙන්නට ඇත.

මේතාක් කරගෙන ගිය පරිදි, ණය මුදල් සම්පූර්ණයෙන්ම බේරුම් කරන තෙක් සහල් සලාක කූපන් ආපසු භාරදීමට රජය බල නොකරනු ඇතැයි ණය ලබාගත් බොහෝ දෙනෙකු විසින්ම බලාපොරොත්තු නොවන්නට ඇත. ගොවියන් අත මිල මුදල් පවත්නා කාල සීමාවෙහිදී ගොවියන් විසින් යල කන්න යේ වැඩ අරඹන හෙයින් සාමාන්‍ය වශයෙන් එම කන්නය සඳහා ණය අවශ්‍යතාවයන් අඩුය. රටේ නොයෙක් පළාත්වලින් වාර්තා වූ පරිදි මහ අස්වැන්න විශේෂයෙන් ම වාසිදායක වූයෙන් මෙම තත්ත්වය 1968 යල කන්නයේ දී වඩාත් කැපී පෙනෙන්නට ඇත.

(1.) නිදසුනක් වශයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති 66 ක්, සාමාජිකයන්ගෙන් කලින් ආපසු ලබාගත් රු. 263,400 ක මුදල ආපසු ගෙවන්නට අසමත් වී තිබේ.

ආපසු ලැබුණ ණය ප්‍රමාණය ද පැහැදිලිවම වඩාත් සතුටුදයක තත්ත්වයක් පෙන්වාලීය. සමිති විසින් යොදවන ලද රුපියල් දශ ලක්ෂ 11.05 ක ප්‍රමාණයකින්, රුපි. දශ ලක්ෂ 6.28 ක් හෙවත් සියයට 56.9 ක් 1968[1] දෙසැම්බර් අවසානයේදී ආපසු ලබාගන්නා ලදී. ආපසු ලැබිය යුතු රුපි. දශ ලක්ෂ 4.77 ක මුළු මුදලින් කාලය ඉකුත් වූ ණය මුදල රුපි. දශ ලක්ෂ 0.67 ක් හෙවත් ණයට දුන් මුළු මුදල්වලින් සියයට 6 ක් පමණක් විය. මෙම ණය ආපසු ගෙවීම පැහැර හැරුනේ බොහෝ කොටම මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක දෙකෙහිය. මෙකී දිස්ත්‍රික්කයන් විසින් නියමිත දිනට බේරුම් කර නොමැති ණය මුදල රුපි. දශ ලක්ෂ 0.62 ක් වෙයි. මාතර දිස්ත්‍රික්කයේ ආපසු නොගෙවූ ණයෙහි අනුපාතිකය දනට යොදවා ඇති මුළු මුදලින් සියයට 37 ක් වෙයි. මෙය මෙසේ වීමට හේතුවූයේ, විශේෂයෙන් නිල්වලා ගං නිම්නයෙන් නිතරපාහේ ඇතිවූ ගංවතුර උවදුර නිසා විය හැකිය. 1967/68 මහ කන්නයේදීට වඩා වැඩි මට්ටමකින් ණය ආපසු ලැබෙන බවට මේතාක් පළවී ඇති ලකුණුවලින් පෙනේ.

1. 1969 වර්ෂයේ ජනවාරි මස අවසානය දක්වා දෙන ලද මුළු ණය ප්‍රමාණය ප්‍රමාණයෙන්, සිය කැමැත්තෙන්ම පවරා දුන් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7.68 ක් හෙවත් සියයට 6.8 ක් විය. මේ දිනය වන විට, කාලය ඉකුත්වූ ණය ප්‍රමාණය, දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 0.98 ක් හෙවත් සියයට 9 ක් විය.

### 1968/69 මහ කන්නයේ වී වගා ණය

1968/69 මහ කන්නයේ සිට අක්කරයකට දෙනු ලබන ණය මුදල රු. 220/– සිට රු. 262/– දක්වා ඉහළ නැගෙන සේ ප්‍රතිශෝධනය කෙරුණි. පොහොර මිල හා සී සෑමේ ගාස්තු වැඩිවීම් මෙම ප්‍රතිශෝධනයට අවස්ථානුරූපී විය. අස්වැන්න කපා ගැනීම සඳහා දෙනු ලබන රු. 25/– හේ ණය මුදල දීම නතර කළ මුත්, කෘමිනාශක බෙහෙත් සඳහා රු. 25/– ක ණයක් දීම ආරම්භ කෙරුණි. මෙම ණය මුදල ද අවස්ථා තුනකින් නිකුත් කළ යුතු ණයක් විය. පළමු වැනි කොටස් මුදල වගාව ආරම්භයේ දී මුදලින් ගෙවුනු අතර, දෙවැනි කොටස් මුදල සැපැයූ පොහොර සඳහා කෙළින් ම ගොවිජන සේවා කොමසාරිස්ට ගෙවනු ලැබීය. සමූපකාර පරීක්ෂක තැන විසින් සමිතියේ ඇයැදුම්පත නිර්දේශ කොට සති තුනක් ඉකුත් වූ පසුව තෙ වැනි කොටස් මුදල මුදලින් ගෙවනු ලැබේ. නිකුත් කළ මුදල්, අරමුණු හා අවස්ථා අනුව සම්පින්ඩනය කොට පහත දක්වා ඇත :—

## II (ඇ) 17 වැනි සංඛ්‍යා සටහන

### නිකුත් කළ කාර්යය හා අවස්ථා අනුව අක්කරයකට ණය සීමාව

| | අරමුණ | අක්කරයකට (රුපියල්) | |
|---|---|---|---|
| 1 වැනි අවස්ථාව | | රු. | |
| | බිත්තර වී | 32.00 | |
| | සී සෑම | 60.00 | |
| | කෘමිනාශක බෙහෙත් | 25.00 | |
| 1 වැනි අවස්ථාවේ එකතුව | | | 117.00 |
| 2 වැනි අවස්ථාව | | | |
| | පොහොර | 95.00 | |
| 2 වැනි අවස්ථාවේ එකතුව | | | 95.00 |
| 3 වැනි අවස්ථාව | | | |
| | වල් නෙලීම ( අතින් ) | 25.00 | |
| | පැල සිටවීම හෝ පේළි දැමීම | 25.00 | |
| 3. වැනි අවස්ථාවේ එකතුව | | | 50.00 |
| | අවස්ථා සියල්ලෙහි ම එකතුව | | 262.00 |

## II (ඇ) 18 වැනි සංඛ්‍යා සටහන
## අතිරේක වගාවන් සඳහා වූ ණය මුදල්වල අනුපාතිකයන් සහ කොන්දේසි

| වගාව | අනුපාතිකය | ණය කාල සීමාව දිනවලින් | අරමුණ සහ මුදල් හෝ ද්‍රව්‍ය පදනම මත බෙදී ගිය අයුරු |
|---|---|---|---|
| මිරිස් (වර්ෂා පෝෂිත) | අක්කරයකට රු. 125/-<br>උපරිමය අක්කර 5 යි | 270 | මුදලින්<br>(අ) සී සෑමට සහ බිම සකස් කිරීමට ... 40.00<br>(ආ) පැළ සිටුවීම ... 50.00<br>90.00<br>වර්ගික<br>පොහොර සහ කෘෂි රසායනිකයන්... 35.00 |
| මිරිස් (වාරිමාර්ග පහසුකම් වලින් අස්වැද්දූ) | අක්කර ¼කට රු.200/-<br>උපරිමය අක්කර 5 යි | 270 | මුදලින්<br>(අ) සී සෑම සහ බිම සකස් කිරීම, පැල සිටුවීම සහ වල් නෙලීම 150.00<br>වර්ගික<br>පොහොර සහ කෘෂි රසායනිකයන් 50.00 |
| රතු ලූණු | අක්කර ¼කට රු. 200<br>උපරිමය අක්කර 5 යි | 180 | මුදලින්<br>බීජ ලූණු ...100.00<br>වර්ගික<br>පොහොර සහ කෘෂි රසායනිකයන්...100.00 |
| බොම්බායි ලූණු | අක්කර ¼කට රු. 200<br>උපරිමය අක්කර 5 යි | 210 | මුදලින්<br>බීජ සහ තවානය ...100.00<br>වර්ගික<br>පොහොර සහ කෘෂි රසායනිකයන්...100.00 |
| අර්තාපල් | අක්කර ⅛කට රු. 175 ආරම්භක වශයෙන් අක්කර ⅛කට සහ එක් කන්නයකට අක්කර ⅛ ගණනේ අක්කර 5ක උපරිම ප්‍රමාණයකට වැඩිකර | 180 | මුදලින් : කම්කරු වියදම් ... 20.00<br>වර්ගික හෝ මුදලින්<br>බීජ අර්තාපල් (හොණ්ඩර 2) ...134.40<br>වර්ගික:<br>පොහොර (හොණ්ඩර 1) ... 20.00<br>175.00 |

එළවළු—අක්කරයක උපරිම ප්‍රමාණයකට

| ප්‍රදේශය | රු. |
|---|---|
| නුවරඑළිය | 1000/- |
| බදුල්ල, වැලිමඩ | |
| මහනුවර සහ මාතලේ | 750/- |
| මීගමුව, හලාවත සහ පුත්තලම | 650/- |
| රත්නපුරය | 600/- |
| කුරුණෑගල | 500/- |
| අනෙකුත් ප්‍රදේශ | 500/- |

ලීක්ස් 240/-
බෝංචි 90/-
අනිකුත් එළවළු 150/-
} බෝග හා වෙනස් වේ.

මූලය: මහජන බැංකුව

68/69 මහ කන්නයේ දී අක්කරයකට දුන් ණය මුදලෙහි වැඩිවීමක් ඇති වුවද, එම කන්නයේ දී නිකුත් කළ මුළු ණය මුදල 67/68 මහ කන්නයේ දීට වඩා අඩු වී තිබේ. 1968 දෙසැම්බර් අග දී අනුමත කළ රුපි. දශ ලක්ෂ 51.4 න් රුපි. දශ ලක්ෂ 36.3 ක් ප්‍රයෝජනයට ගන්නා ලදී. මින් පෙනී යනුයේ, මෙවර මහ කන්නයේදී ණය සේවා ලැබූ වර්ග ප්‍රමාණය 67/68 මහ කන්නයේ ප්‍රමාණයෙන් සියයට 70 ක් පමණ වන බවය. මෙම ඇස්තමේන්තුවට එළඹීමෙහි දී ඇති කර ගත්උප කල්පන දෙකක් වෙයි. ඉන් පළමු වැන්න අනුමත කළ මුදල් සියල්ලම අවසානයේදී යොදවනු ඇත යන්නය. දෙවැන්න අක්කරයක් සඳහා යොදවනු ලබන මුදලෙහි අනුපාතය 68/69 මහ කන්නයේ දී ද, 67/68 මහ කන්නයේ අනුපාතය ම වනු ඇත යන්නය. නිකුත් කළ ණයෙහි මෙම පහළ වැටීමට බොහෝ කොට හේතු වූයේ සමහර විට ණය ආපසු ගෙවීම පැහැර හරින්නට ණය නොදීම විය හැකිය. තව ද, සාර්ථක වූ ඇතැම් ගොවීනට වගාවන් සඳහා සිය මුදල් ම යෙදවීමට හැකි වන තරමට ඔවුහු, මුදල් අතින් යම් ස්වෛරීභාවයක් ලැබුවාහු විය හැකි ය.

ණයට දුන් මුදලින් රුපි. දශ ලක්ෂ 0.79 ක් හෝ සියයට 2.2 ක්, 1968 දෙසැම්බර් අවසානයේ දී ආපසු ලබා ගන්නා ලදී.

**අතිරේක බෝග**

තවද, මෙම ක්‍රමය යටතේ එළවළු, මිරිස්, රතුලූනු, බොම්බායි ලූනු හා අර්තාපල් වගාව සඳහා ද ණය මුදල් දෙන ලදී. දෙන ලද ණය මුදල් ප්‍රමාණය, ආපසු ගෙවීමේ කාලච්ඡේදය හා ණය මුදලේ අරමුණ ඒ ඒ බෝග වර්ගය අනුව වෙනස් විය. එළවළු වගා කිරීම සඳහා ණය දීමෙහි දී දෙනු ලබන මුදල් ප්‍රමාණය ද, වගා කරන ලද ප්‍රදේශය අනුව වෙනස් විය. විශේෂයෙන් ඉල්ලා නො සිටියේ නම්, වී වගාව සඳහා දෙන ණය මුදල් මෙන් නොව මෙම මුදල වගා කිරීමේ ඒ ඒ අවදීන්හි දී කොටස් වශයෙන් නිකුත් නොකරන ලදී. අතිරේක බෝග වර්ග සඳහා දෙන ලද ණය මුදල් ප්‍රමාණයන් හා ඒවා දෙනු ලැබූ අරමුණු යනාදිය II(ඇ)18 වැනි සංඛ්‍යා සටහනෙහි සම්පිණ්ඩනය කොට දක්වා ඇත.

1967 වර්ෂයේ ඔක්තෝබර් මස 1 දින පටන් 1968 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින දක්වා රුපි. දශ ලක්ෂ 8.84 ක ණය මුදලක් අතිරේක බෝග වර්ග සඳහා ණයට දී ඇත. පහත II(ඇ)19 වැනි සංඛ්‍යා සටහනෙහි මෙම ණය මුදල් ප්‍රමාණය බෝග අනුව බෙද දක්වා ඇත.

### II (ඇ) 19 වැනි සංඛ්‍යා සටහන

**අතිරේක බෝග වර්ග සඳහා දෙනු ලැබූ ණය මුදල් බෝග වර්ග අනුව බෙද දැක්වීම**
( 1967 වර්ෂයේ ඔක්තෝබර් 1 දින සිට 1968 දෙසැම්බර් 31 දින දක්වා )

රුපි. දශ ලක්ෂ

| බෝග | ප්‍රමාණය | එකතුවෙහි සියයට ගණන |
|---|---|---|
| රතුලූනු ... ... ... ... ... | 3,412 | 38.6 |
| මිරිස් ... ... ... ... ... | 2,674 | 30.2 |
| අර්තාපල් ... ... ... ... ... | 2,158 | 24.4 |
| එළවළු ... ... ... ... ... | 593 | 6.7 |
| බොම්බයි ලූනු ... ... ... ... | 5 | 0.1 |
| | 8,842 | 100.0 |

මූලය: මහජන බැංකුව.

අතිරේක බෝග සඳහා දෙනු ලැබූ ණය මුදලින්, ස්වේච්ඡාවෙන් ම ආපසු ගෙවූ ප්‍රමාණය සියයට 68.4 ක් වූ අතර, මෙම සංඛ්‍යාව, වී වගා ණය ස්වේච්ඡාවෙන් ම ආපසු ගෙවා ඇති ප්‍රමාණයට බොහෝ සෙයින් ම සමානය. අතිරේක බෝග සඳහා දෙන ලද ණය සම්බන්ධයෙන් ආපසු ගෙවීම් පැහැර හරින්නන් ගේ සහල් සලාක කූපන් නවතා ගැනීමේ ක්‍රියා මාර්ගය අනුගමනය නො කරන ලදී. අතිරේක බෝග වර්ග සඳහා දෙනු ලැබූ ණය මුදල් හා ණය ආපසු ගෙවන ලද ආකාරය 20 වැනි සංඛ්‍යා සටහනෙහි සම්පිණ්ඩනය කොට දක්වා ඇත.

## II (ඇ) 20 වැනි සංඛ්‍යා සටහන

### අතිරේක භෝග සඳහා දෙනු ලැබූ ණය සහ ණය මුදල් ආපසු අය කර ගැනීම

(රුපි. දශ ලක්ෂ)

| | 1-10-67 සිට 30-9-68 දක්වා දෙන ලද ණය මුදල් | 1-10-68 සිට 31-12-68 දක්වා දෙන ලද ණය මුදල් |
|---|---|---|
| දෙන ලද මුදල් ප්‍රමාණය ... ... ... | 5.59 | 3.20 |
| අය කර ගනු ලැබූ ප්‍රමාණය ... ... | 3.83 | 0.02 |
| ආපසු ගෙවීම් පැහැර හැරි ප්‍රමාණය | 1.07 | — |
| ලැබිය යුතු ප්‍රමාණය (ආපසු ගෙවීම අයත් නැත) | .69 | 3.20 |
| ආපසු අය කර ගත යුතු ප්‍රමාණයෙහි ප්‍රතිශතය | 68.4% | — |
| නොගෙවා පැහැර හරිනු ලැබූ ප්‍රමාණයෙහි ප්‍රතිශතය | 19.1% | — |
| නොබේරා ඉතිරිව ඇති ප්‍රමාණයෙහි ප්‍රතිශතය | 12.5% | — |

මූලය: මහජන බැංකුව.

වී ගොවිතැන සඳහා දෙනු ලැබූ ණය මුදල් සම්බන්ධයෙන් මෙන් නොව, දිස්ත්‍රික්කයන් අනුව ගත් කළ මෙහි පුළුල් වෙනස්කම් දක්නට ලැබේ. උදහරණයන් වශයෙන් කළුතර, මොනරාගල සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි ණය මුදල් සියල්ල ම ආපසු ගෙවා ඇති අතර, යාපනය දිස්ත්‍රික්කයෙහි ආපසු ගෙවීම් සියයට 92.4 ක් වෙයි. කොළඹ හා මහනුවර දිස්ත්‍රික්කයන්ගෙන් සියයට 70 ටත් වැඩි වූ ඉතා සැලකිය යුතු ප්‍රමාණයක ණය ආපසු ලබා ගත හැකි විය. අනෙක් අතට දිස්ත්‍රික්ක 8 ක සියයට 25 කට වඩා අඩු ප්‍රමාණයක ආපසු අය කර ගැනීම් සිදු කොට ඇත. ලැබී ඇති සංඛ්‍යා තොරතුරු මඳ වූ හෙයින් අතිරේක භෝග සම්බන්ධ ආපසු ලබාගැනීම් අනුපාතය මෙහි ලා සම්බන්ධ කර දැක්විය නොහැක. තවද, භෝග අනුව ආපසු ලබාගත් ණය මුදල් සංඛ්‍යාවන් නොමැති හෙයින් ඇතැම් භෝග සඳහා දෙන ලද ණය මුදල්වලත් ආපසු නොගෙවා පැහැර හැරි ණය ප්‍රමාණයේත් ඍජු සම්බන්ධතාවයක් දක්වාලිය නොහැක. මාතලේ, අම්පාරේ හා අනුරාධපුරය යන දිස්ත්‍රික්ක සියල්ලෙහි ම ආපසු ගෙවීම් පැහැර හැර තිබේ. හම්බන්තොට, කුරුණෑගල, හා පුත්තලම යන දිස්ත්‍රික්කවල ආපසු ගෙවා නොමැති ණය මුදල්වල සැලකිය යුතු ප්‍රමාණයක් ම මිරිස් වගාව සඳහා දෙන ලද ණය මුදල් වෙයි. වී වගා ණයවල සහ අතිරේක භෝග වගා ණයවල, ණය ආපසු ගෙවීමේ මට්ටම දිස්ත්‍රික්ක අනුව ගත්කළ එබඳුම රටාවක් අනුව යෙදෙන අතර, ණය දෙන නියෝජිත්වයේ එනම්, සමූපකාර සමිතිවල මූලික දුබලකම හෙළි කරයි. 1967 ඔක්තෝම්බර් 1 වැනි දින සිට 1968 සැප්තැම්බර් 30 වැනි දින දක්වා අතර කාලඡේදයේ දී දෙනු ලැබූ ණය මුදල් දිස්ත්‍රික්කයන් අනුව විශ්ලේෂණය කොට **II (ඇ) 21** වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

ආර්ථික පර්යේෂණ වැඩ පිළිවෙලෙහි කොටසක් වශයෙන් ග්‍රාමීය අංශයේ ණයගැතිභාවය සහ ණය අවශ්‍යතාවයන් පිළිබඳව දත්තයන් රැස්කර ගැනීම වස් විශේෂයෙන් සැකසුණු සංඛ්‍යා සමීක්ෂණ පැවැත්වීමට බැංකුව අදහස් කරයි.

## II (ඇ) 21 වැනි සංඛ්‍යා සටහන

### 67-9-1 සිට 68-9-30 දක්වා කාලච්ඡේදය තුළ දී අතිරේක ආහාර බෝග සඳහා දුන් ණය පිළිබඳ දිස්ත්‍රික්ක අනුව කළ විශ්ලේෂණය

| දිස්ත්‍රික්කය | මිරිස් (1) | රතුළූණු (2) | අර්තාපල් (3) | එළවළු (4) | දුන් මුළු ණය ප්‍රමාණය (5) | ආපසු අයකරගත් ප්‍රමාණය (6) | පැහැරහැරි ප්‍රමාණය (7) | ලැබිය යුතු එහෙත් පැහැර නොහැරි ප්‍රමාණය (8) | නැවත ලබාගත් ප්‍රමාණය, දුන් මුළු ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් වශයෙන් (6) (5) %වශයෙන් (9) | පැහැර හැරි ප්‍රමාණය දුන් මුළු ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් වශයෙන් (7), (5) % වශයෙන් (10) | ලැබිය යුතු එහෙත් පැහැර නොහැරි ප්‍රමාණය දුන් ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් වශයෙන් (8) (5) % වශයෙන් (11) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් සිය ගණනින් | | | | | | | | සාමාන්‍යය | | |
| කොළඹ ... ... | — | — | — | 50 | 50 | 38 | 12 | — | 76.0 | 24.0 | — |
| කළුතර ... ... | — | — | — | 158 | 158 | 158 | — | — | 100.0 | — | — |
| මහනුවර ... ... | 46 | — | — | 992 | 1,038 | 794 | 64 | 180 | 76.4 | 6.2 | 17.4 |
| මාතලේ ... ... | 37 | — | — | — | 37 | 9 | — | 28 | 24.3 | — | 75.7 |
| නුවර එළිය ... ... | — | — | 373 | — | 1,348 | 901 | 154 | 293 | 66.8 | 11.4 | 21.8 |
| ගාල්ල ... ... | — | — | — | 198 | 198 | 46 | 152 | — | 23.2 | 76.8 | — |
| මාතර ... ... | — | — | — | — | — | — | — | — | — | — | — |
| හම්බන්තොට ... ... | 1,885 | 241 | — | — | 2,126 | 440 | 788 | 989 | 20.6 | 37.1 | 42.3 |
| යාපනය ... ... | 6,732 | 18,427 | 2,260 | — | 27,419 | 25,346 | 1,681 | 455 | 92.4 | 5.9 | 1.7 |
| මන්නාරම ... ... | — | — | — | — | — | — | — | — | — | — | — |
| වවුනියාව ... ... | 437 | 3 | 10 | — | 450 | 88 | 147 | 215 | 19.5 | 32.7 | 47.8 |
| මඩකලපුව ... ... | — | — | — | — | — | — | — | — | — | — | — |
| අම්පාරේ ... ... | 285 | — | — | — | 285 | 94 | 159 | 32 | 32.9 | 55.9 | 11.2 |
| ත්‍රිකුණාමලය ... ... | 480 | 484 | — | — | 964 | 502 | 171 | 291 | 52.0 | 17.7 | 30.3 |
| කුරුණෑගල ... ... | 924 | 18 | — | 20 | 962 | 144 | 469 | 349 | 14.9 | 48.7 | 36.4 |
| පුත්තලම ... ... | 3,713 | 56 | — | 84 | 3,853 | 261 | 3,134 | 259 | 11.9 | 81.3 | 6.8 |
| අනුරාධපුරය ... ... | 4,156 | — | — | — | 4,156 | 763 | 3,388 | — | 18.4 | 81.6 | — |
| පොළොන්නරුව ... ... | 123 | — | — | — | 123 | 123 | — | — | 100.0 | — | — |
| බදුල්ල ... ... | 265 | 50 | 9,402 | 1,684 | 11,401 | 7,865 | 380 | 3,156 | 68.9 | 3.3 | 27.8 |
| මොනරාගල ... ... | 274 | — | — | — | 274 | 274 | — | — | 100.0 | — | — |
| රත්නපුරේ ... ... | 308 | 690 | — | 96 | 1,094 | 240 | 49 | 805 | 21.9 | 4.5 | 73.6 |
| කෑගල්ල ... ... | — | — | — | — | — | — | — | — | — | — | — |
| එකතුව ... ... | 19,615 | 19,969 | 12,045 | 4,257 | 55,936 | 38,291 | 10,685 | 6,960 | 68.4 | 19.1 | 12.5 |

මූලය : මහජන බැංකුව

**ඉතිරි කිරීමේ සහ දීර්ඝ කාලීන ණය දෙන ආයතන**

— (ඈ) 15 සංඛ්‍යා සටහන රජය ආරම්භ කරන ලද ඉතිරි කිරීමේ සහ ණය දෙන ආයතනවල, ණයදීම් කටයුතු පෙන්වයි.

## II (ඈ) 22 සංඛ්‍යා සටහන

### දීර්ඝ කාලින ණය දෙන ආයතනවල ණයදීම් කටයුතු

රුපියල් දහස් ගණනින්

| | 1965 | | 1966 | | 1967 | | 1968 | |
|---|---|---|---|---|---|---|---|---|
| | සපයන ලද ණය ප්‍රමාණය | බේරා නොමැති ණය ප්‍රමාණය | අනුමත කරන ලද ණය ප්‍රමාණය | බේරා නො මැති ණය ප්‍රමාණය | අනුමත කරන ලද ණය ප්‍රමාණය | බේරා නො මැති ණය ප්‍රමාණය | අනුමත කරන ලද ණය ප්‍රමාණය | බේරා නො මැති ණය ප්‍රමාණය |
| සංවර්ධන මූල්‍ය සංස්ථාව (අ) | 4,010 | 28,316 | 4,540 | 29,052 | 3,150 | 29,154 | 7,273 | 31,716 |
| ලංකා ඉතිරි කිරීමේ බැංකුව | 2,845 | 16,366 | 2,249 | 16,371 | 3,880 | 17,715 | 4,376 | 19,943 |
| කෘෂිකාර්මික සහ කාර්මික ණය දෙන ආයතනය ... | 4,941 | 32,424 | 3,933 | 32,367 | 2,565 | 31,119 | 3,285 | 30,288 |
| රජයේ උකස් බැංකුව ... | 3,942 | 54,681 | 4,959 | 55,319 | 4,812 | 55,453 | 6,623 | 57,816 |
| ණය මණ්ඩලය ... ... | 540 | 11,411 | 833 | 10,970 | 1,225 | 11,047 | 1,076 | 10,758 |
| ජාතික නිවාස දෙපාර්තමේන්තුව (ආ) | 5,138 | 71,536 | 16,861 | 84,196 | 25,585 | 105,485 | 14,355 | 113,960 |
| එකතුව ... ... | 21,416 | 214,734 | 33,375 | 228,275 | 41,217 | 249,973 | 36,998 | 264,481 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සාමාන්‍ය කොටස් ආයෝජන ඇතුළුව.

(ආ) සංඛ්‍යා තොරතුරු ඔක්තෝබර්-සැප්තැම්බර් මුදල් වර්ෂයට අදාළ වේ. දෙන ලද ණය මුදල්, සංඛ්‍යා තොරතුරු වලින් නියෝජනය වනුයේ පුද්ගලයන්ට සහ ගොඩනැගිලි සමිතිවලට පමණක් දෙන ලද ණය මුදල් පමණකි. 1965–68 වර්ෂ සඳහා වූ නොබේරන ලද ණය ප්‍රමාණයන් පිළිබඳ සංඛ්‍යා වලින් ගොඩනැගිලි සමිතිවලට සපයන ලද ණය මුදල් බැහැර කොට ඇත.

1966–67 වසර දෙකෙහි පැවති ප්‍රසාරණය වීමෙහි උපනතියට ප්‍රතිවිරුද්ධව 1968 දී ඉතිරි කිරීමෙ හා දිගු කාලීන ණය ආයතනයන් විසින් ලබාදී ඇති ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 4.2 කින් සංකෝචනය විය. මෙය වනාහී ජාතික නිවාස දෙපාර්තමේන්තුව විසින් දුන් ණය මුදල්වල තියුණු පහත වැටීමේත් වෙනත් දිගු කාලීන ණය ආයතනයන් විසින් දෙන ලද ණය සුළු ප්‍රමාණයකින් වැඩි වීමේත් ශුද්ධ ප්‍රතිඵලයකි.

ණයකර නිකුත් කිරීම මගින් ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සම්පත් විශාල ප්‍රමාණයකින් වැඩි වී තිබියදීත් ලබාදුන් ණය මුදල් රුපියල් දශලක්ෂ 11.2 කින් තියුණු ලෙස පහත වැටීමට තරමක් දුරට හේතුවී ඇත්තේ දෙපාර්තමේන්තුව විසින් ම කරන ලද තැනීම් කටයුතු සැලකිය යුතු තරමින් වැඩි වූ නිසා බව දැක්විය හැකිය. එකී තැනීම් කටයුතු පිළිබඳ සංඛ්‍යා ඉහත සඳහන් සංඛ්‍යා සටහනට ඇතුළත් වී නොමැත.

වෙනත් ආයතන විසින් දෙන ලද ණය මුදල්වල සාමාන්‍ය වැඩිවීම අතුරින්, 1967 පහත වැටුණු සංවර්ධන මුදල් සමායතනය විසින් දෙන, ණය, 1968 දී සැලකිය යුතු වැඩිවීමක් වාර්තා වී ඇත. ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය බැංකුව විසින් දෙන ලද ඩොලර් දශලක්ෂ 4 රේ ණය මාලාව මගින්, වර්ෂය තුළදී සමායතනයේ සම්පත් ශක්තිමත් කරන ලදී. මෙම ණය මාලාව යටතේ මුදල් යොදවනු ලැබූ ආනයනයන් විදේශීය විනිමය හිමිකම් සහතික

පත්‍ර ක්‍රමයේ අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කරන ලද මුත් සියයට 20 ක බලපත්‍ර ගාස්තුවකට යටත් කරන ලදී. මහ බැංකුවේ මැදි කාලීන හා දිගු කාලීන ණය අරමුදල යටතේ වූ ප්‍රති-මූල්‍ය යෝජන පහසුකම් වලින් ද සමායතනය ප්‍රයෝජනය ගනු ලැබීය.

රජයේ උකස් බැංකුව විසින් දෙන ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1.8 කින් වැඩිවීමට හේතුව වශයෙන් 1968 මැයි මාසයෙහි ව්‍යවස්ථා සම්පාදනය මගින් මෙකී බැංකුවේ බලතල කාර්ය ක්ෂේත්‍රය පුළුල් කිරීම දක්විය හැකිය. ලංකා ඉතිරි කිරීමේ බැංකුව සහ කෘෂිකාර්මික හා කාර්මික ණය සමායතනය විසින් දෙන ලද ණය පරිමාවෙහි ද යම් යම් වැඩිවීම් ඇතිවුන අතර, ණය මණ්ඩලය විසින් දෙන ලද ණය සුළු වශයෙන් පහතවැටුණි.

1968 වර්ෂයේ දී ඉතිරි කිරීමේ තැන්පතු සහ ඉතිරි කිරීමේ සහතික පත්වල වෙනස්වීම් II (ඇ) 23 යන සංඛ්‍යා සටහනෙහි දක්වෙයි. ඉකුත් වර්ෂයෙහි දී මෙන්ම, 1968 වර්ෂයේදීද වෙළඳ බැංකුවල ඇති ඉතිරි කිරීමේ හා කාලීන තැන්පතු එම ස්වරූපයෙන් ම වැඩිවී ඇත. 1968 වර්ෂයේදී තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුවෙහි සහ ලංකා ඉතිරි කිරීමේ බැංකුවෙහි ඇති ඉතිරිකිරීමේ තැන්පතු වැඩි වී ඇති අතර, ඉතිරි කිරීමේ සහතික පත්‍රවල වටිනාකම ඉකුත් වර්ෂයට වඩා සුලු ප්‍රමාණයකින් වැඩි වී ඇත. සේවක අර්ථසාධක අරමුදලෙහි මුළු එකතු කිරීම් 1968 දී රුපියල් දශලක්ෂ 87.1 ක් වූ අතර 1967 හා සැසඳීමේ දී එය රුපි. දශලක්ෂ 74.4 ක් විය.

**සංඛ්‍යා සටහන II (ඇ) 23**

**ඉතිරි කිරීමේ තැන්පතු හා ඉතිරි කිරීමේ සහතික පත්**

රුපියල් දශ ලක්ෂ

| | දෙසැම්බර් 1967 | දෙසැම්බර් 1968 | වෙනස දෙසැම්බර්57- දෙසැම්බර් 68 |
|---|---|---|---|
| තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව ... ... | 450.6 | 463.0* | — 12.4 |
| ලංකා ඉතිරි කිරීමේ බැංකුව ... ... ... | 93.2 | 96.9* | 3.7 |
| වෙළඳ බැංකු (කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු)** ... | 700.8 | 826.2 | —125.4 |
| නොපිය වූ ඉතිරි කිරීමේ සහතිකපත් ... ... ... | 78.7 | 91.3 | — 12.6 |
| එ ක තු ව ... ... ... ... ... | 1,323.3 | 1,477.4* | —154.1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* තාවකාලික

** රජය සතු තැන්පතු ඇතුළත්ය.